## **2020/09/08 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව**

2020/09/08 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 21. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

සහභාගී නොවූ

| | | |
|---|---|---|
| 1. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2020.09.08 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

අද දින මේ වන විට සභාවට පැමිණි උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ලා ඉතාම ගෞරවයෙන් මේ අවස්ථාවෙ පිළිගන්නවා ඒ වගේම අද දින මාධ්‍යවේදී මහත්මයෙකුත් ඇවිල්ල ඉන්නවා. එතුමත් පිළිගනිමින්, විශේෂයෙන්ම පළමුවෙන්ම කියන්න ඕන. මාසෙකට එක දවසයි රැස්වීම පවත්වන්නෙ. එදිනටවත් මන්ත්‍රීවරුන්ට නියමිත වෙලාවට පැමිණීමට නොහැකි නම් ඇත්තටම කණගාටුයි. අදත් පැමිණ සිටින්නෙ මන්ත්‍රීවරු 10 ට 12 ට ආසන්න ප්‍රමාණයක්. ගරු උප සභාපතිතුමනි, ඒ තත්වය නිසා සභාව හරියට තියා ගන්න බැරිවෙනවා. අවශ්‍ය කරුණු කාරණා කතා කරගන්නත් බැරි වෙනවා. නමුත් කොහොම හරි අද දින පැමිණි උප සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා මම ගෞරවයෙන් පිළිගන්නවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත.**

**(අ)02. 2020.07.13 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2020.08.11 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. අඩු ආදායම්ලාභී පවුල්වල සාමාජික සාමාජිකාවන් ලක්ෂයක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමේ ජාතික වැඩසටහන - දකුණු පළාත් මෙහෙයුම් කමිටුව - 01 යන මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, ගාල්ල විසින් 2020.08.18 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

ආන්ඩුවෙන් රැකියා ලාභීන් පුහුණු කිරීම සඳහා අපෙන් ශාලා පහසුකම් ඉල්ලනවා අපට දෙන්න වෙනවා. ජලය, විදුලිය හා අනෙක් නඩත්තු කටයුතු සඳහා අපට සහනයක් දෙන්න කියලා ඉල්ලමු.

02. උඩුගම රෝහල් භූමියේ අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම හා දැඩි සත්කාර ඒකකය සඳහා පිවිසුම් මාර්ගය සකස් කර ගැනීමට සිළිංඩර් ලබා ගැනීම සම්බන්ධව රෝහල් අධිකාරී මූලික රෝහල, උඩුගම විසින් යොමු කරන ලද ඉල්ලීමට අනුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් යොමු කරන ලද 2020.09.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මීට පෙරත් අපෙන් ඉල්ලුම් කල නමුත්, අපිට එහෙම ගස් කපන්න බැහැ මම අනතුරුදායක ගස් ඉවත් කරන ක්‍රමවේදෙට ඉල්ලීම් කරන්න කියල ලිපියක් යැව්වා. ඊට පසුව ප්‍රාදේශීය ලේකම්තුමියට දැනුම් දීලා, ලේකම්තුමිය කියල තියෙනවා. එයාලට ගස් කපා ගන්න. දැව සංස්ථාවට ගෙනියන කල්, ගස් රෝහල් භූමියේ තබා ගන්න කියලා. අපට මේව කරන්න නීතිමය පදනමක් නැහැ කියලා, මම පරිසර කමිටුවෙදිත් කථා කළා. ඒවගේම සිලින්ඩර් ඉල්ලලා තියෙනවා. ඒකනම් දෙන්න පුලුවන්. මේ ගස් කැපීම නම් අපට කරගන්න බැහැ. ඊයෙ ආපදා කමිටුවෙදි මේ පිළිබඳව මම කතා කළා.

03. බෝක්කුවක් ලබා ගැනීම සම්බන්ධව ඌරල, බෝගහවත්ත මාර්ගයේ පදිංචි වී සිටින ප්‍රදේශවාසීන් විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය විය.**

04. 2019 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත නාන තොටුපල සංවර්ධනය කිරීමේ කර්මාන්තය ඍජු ශ්‍රමික පදනම යටතේද සිදු කිරීමට නියමිත බැවින් එහි වැඩ කරන කම්කරුවන්ගේ දෛනික කම්කරු කුලීය පසුව මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත සභා අරමුදලින් දැරීමට අනුමැතිය ලබා දෙන ලෙස සංවර්ධන නිලධාරී යුරේකා මල්කාන්ති මහත්මිය විසින් 2020.09.07 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.

පසුගිය අවුරුද්දෙ තොටු පොළවල් පහක් හදන්න ප්‍රතිපාදන වෙන් වී තිබුණා. නමුත් ඒ කටයුතු කරන්න බැරි වුනා. නැවත ඒ කටයුතු මේ අවුරුද්දට යොදාගත්තා. පසුව මුදල් ප්‍රතිපූරණය කර ගැනීමේ පදනම මත තොටු පොළවල් කීපයක් ඍජු ශ්‍රමික පදනමින් සංවර්ධනය කරන්න ඉල්ලීම් කරනවා. ඒ කටයුතු ඉක්මණින් කරන්න ඕන. අත්සන් කරන්න සමිති නැති ප්‍රශ්නය තමයි තියෙන්නේ.

**මේ සඳහා සභාවේ අනුමැතිය හිමිවිය.**

05. උපමාන පාදක සංවර්ධන ප්‍රදාන- 2019 වැඩසටහන යටතේ සිදු කිරීමට නියමිත උක්ඕවිට පෙර පාසල සංවර්ධනය කිරීමේ කර්මාන්තය 2020 වර්ෂය සඳහාද අවිච්ඡේද වී ඇති බැවින් ඒ වෙනුවට උඩුගම උප කාර්යාලය, උක්ඕවිට පෙර පාසල ලෙසින් සංවර්ධනය කිරීමට යෝජනාව වෙනස් කර දෙන ලෙස ඉල්ලුම් කලද, මෙය අවිච්ඡේද වී ඇති කර්මාන්තයක් බැවින් මෙම යෝජනාව සංශෝධනය කිරීමට නොහැකි බව දන්වා ඇත. එම ව්‍යාපෘතිය මෙම වසර අවසන් වීමට ප්‍රථම නිම කල යුතු බැවින් උක්ඕවිට පෙර පාසල පවතින ස්ථානයේම සංවර්ධනය කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස සංවර්ධන නිලධාරී යුරේකා මල්කාන්ති මහත්මිය විසින් 2020.09.07 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.

**මේ සඳහා සභාවේ අනුමැතිය හිමිවිය.**

06. පරිගණක සඳහා සේවා ගිවිසුමක් ලබා ගැනීම මැයෙන් කාර්යාල කාර්ය සහායක, අවන්ත පද්ම මහතා විසින් 2020.09.02 කරන ලද ඉල්ලීම සභා ගත කරන ලදී.

07. PF 7360 දරණ කැබ් රථයේ අළුත්වැඩියා කටයුත්තක් සම්බන්ධව, රියදුරු, එම්.ඒ.වසන්ත මහතා විසින් 2020.09.04 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.

08. ප්‍රාදේශීය සභා කඩ කාමරයකට විදුලිය ලබා ගැනීම සම්බන්ධව ආර්.ඩී.පී.එම්. රණතුංග, නො.50, මාකස්වත්ත, අගලවත්ත විසින් යොමු කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.

09. ජී.කේ.ජයසිරි පියසිරි මහතා සතු ඉඩම කොටස් කර විකිණීම සඳහා අනුමැතිය ඉල්ලා යොමු කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ එකඟතාවය හිමි නොවූ අතර, මේ පිළිබඳ අධ්‍යයනය කර සභාවේ සාකච්ඡා වූ පරිදි ඉඩම් හිමියන් කැඳවා සාකච්ඡා කර කටයුතු කිරීමට තීරණය විය.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. 2021 වර්ෂයට ආදායම් රැස් කිරීමට අදාළව නව අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලෙස ගරු සභාවට යෝජනා කරන අතර, නව යෝජනා ලෙස පුස්තකාල සාමාජික තැන්පත් මුදල රු. 50.00 සිට රු. 100.00 දක්වා ඉහළ දැමීමටත්, පරණ පුවත්පත් අලෙවිය දැනට විකිණුම් මිළ වන රු. 16.00 සිට රු. 50.00 දක්වා ඉහළ දැමීමටත්, යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**02.** නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල අනවසරයෙන් පවත්වා ගෙන යනු ලබන මාළු වෙළඳසැල්, තාවකාලික මාළු ලැලි සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව ගරු සභාවේ යෝජනා සහ අදහස් සහ අනවසරයෙන් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර සම්බන්ධයෙන් ඉදිරියේදී ගත යුතු තීරණ පිළිබඳව ඔබගේ යෝජනා හා අදහස් ඉදිරිපත් කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**03**. තල්ගස්වල පොළෙහි 2016 වර්ෂයට අදාළව හිඟ බදු මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් විත්තිකරු වන තල්ගස්වල, නියාගම, ගුරුබැබිලහි පදිංචි එච්.ජී. ධම්මික අනුර කුමාර විසින් 2020.07.23 වන දින බද්දේගම දිසා මහේස්ත්‍රාත් අධිකරණයේදී නාගොඩ ප්‍රාදේශීය සභාවට රු. 50000.00 බැගින් වන මාසික වාරිකවලින් ගෙවා නිම කිරීමට කැමැත්ත පළ කළ අතර, ඔහු විසින් ගෙවීමට ඇති රු. 824626/= ක බදු මුදල හා රු. 82462.50 ක් වන දඩ මුදල රු. 50000.00 බැගින් වූ මාසික වාරිකවලින් අය කර ගැනීම සුදුසු යැයි ගරු සභාවට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභා සම්මත නොවුනු අතර, මේ පිළිබඳ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණීමට තීරණය විය.**

04. සැප්තැම්බර් සාහිත්‍ය මාසය මුල් කර ගනිමින් පාඨක ඉල්ලීම සපුරාලීම සහ කියවීමේ රුචිකත්වයත්, දැනුම වර්ධනය කිරීමත් උදෙසා නාගොඩ, මාපලගම සහ උඩුගම මහජන පුස්තකාල තුන සඳහා කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වනු ලබන පොත් ප්‍රදර්ශනය මගින් රු. 350,000.00 ක පුස්තකාල පොත් මිළදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

05. පෙර වර්ෂවල අගෝස්තු මාසයේදී පෙර පාසල්වලට නිවාඩු ලබා දෙන බැවින් කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන පෙර පාසල් පාලිකාවන් සඳහා මාසික වැටුප ලබා නොදුන් අතර, කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2020.අගෝස්තු මස පෙර පාසල් පවත්වන බැවින් 2020 අගෝස්තු මාසය සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු පෙර පාසල් තිදෙනා සඳහා වැටුප් ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

06. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ නිවාස ඉදිකිරීම සහ වෙනත් සංවර්ධන කටයුතුවලදී වැලි සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර, අවශ්‍ය වැලි අධික වියදමක් දරා දුරබැහැර ප්‍රදේශවලින් ප්‍රවාහනය කරනු ලබන බැවින් ජනතාවට අවශ්‍ය වැලි බල ප්‍රදේශයේ පරිසරයට හානි නොවන පරිදි ගිංගඟෙන් හෝ සුදුසු ස්ථානයකින් ගොඩ දමා ගැනීම සඳහා අවශ්‍ය අවසරය නාගොඩ ප්‍රාදේශීය සභාව වෙත ලබා ගැනීමට දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යොජනාවක් ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිලිබඳව පෞද්ගලිකව විරුද්ධ වන බව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා සහ ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ප්‍රකාශ කරන ලදී. යෝජනාව සම්බන්ධව කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව සභාවේ එකඟතාවය හිමි වූ අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**07.** ප්‍රාදේශීය සභාවට අයත් මාපලගම වෙළඳ සංකීර්ණයේ උඩුමහළ අංක 06 දරණ කඩ කාමරයට විදුලිය ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 37 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**<u>2020.09.08 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2020 අගෝස්තු මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 276.60 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 7095.00 |
| 8617046104 | - උඩුගම බහුකාර්‍ය මධ්‍යස්ථානය | - රු. 1594.20 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1630.80 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 368.10 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1374.60 |

**2020 ජූලි මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
0912296577 - මාපලගම උප කාර්යාලය - රු. 422.98

**02.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**
33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2020.07.21 – 2020.08.21) -රු. 297.00
33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.07.21- 2020.08.21)-රු. 2418.69

**03. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**
උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම 091-5701722
(2020.07.16- 2020.08.15) - රු. 613.01

**04. මොබිටෙල් පුද්ගලික සමාගම**
පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2020.07.25) - රු. 61.30

**05 .2020 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 4740.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 5455.00 |

**06. 2020 සැප්තැම්බර් මස ගමන් වියදම්**
**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| පී.කේ.එම්.වාසනා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 1760.00 |

**2020 අගෝස්තු මස ගමන් වියදම්**
**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1760.00 |
| චන්දිමා සෙනවිරත්න මිය | - කළමනාකරණ සහකාර | - රු. 876.00 |
| ටී.සෙව්වන්දි මනම්පේරි මිය | - පුස්තකාලයාධිපති | - රු. 870.00 |
| ඒ.ඒස්.මසීදා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 7070.00 |
| එන්.ජී. ගීතා රංජනී මිය | - පුස්තකාල සහායක | - රු. 870.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 900.00 |
| ධනංජනී පතිනායක මිය | - පුස්තකාල සහායක | - රු. 870.00 |

**ආයතනයේ රාජකාරි ගමන්වල නියළීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 6000.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 2100.00 |
| අනුර දිසානායක මයා | -රියදුරු | - රු. 2100.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 5600.00 |
| ඩී.සමන් ප්‍රදීප් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 2100.00 |
| කේ.පී.ජී.ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1400.00 |

| | | |
|---|---|---|
| චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1400.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 3050.00 |
| මධූර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 700.00 |
| රංජිත් උදය කුමාර | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2100.00 |

**<u>2020 ජුලි මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 450.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 474.00 |

**<u>2020 ජුනි මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 900.00 |

**<u>07. අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2020 අගෝස්තු මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.40 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8500.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 1927.80 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8233.08 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 4494.50 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8292.50 |
| චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3751.00 |
| උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2575.00 |
| අයි.කේ.ඉන්දික කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කර | - රු. 2472.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 9046.40 |
| ඩී. සමන් ප්‍රදීප් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 1624.35 |
| කේ.පී.ජී. ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 4171.00 |
| මධූර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 2781.00 |
| යූ.ජී.රංජිත් උදය කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 4206.25 |

**08. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2020 ජුනි මස ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු. 78000.00

ii. රාජකාරි අවශ්‍යතාවයන් වෙනුවෙන් අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 1600.00

**09. ඩබ්.ජේ.ඒ ශානක මයා, ආදායම් පරීක්ෂක**

2020.08.03 දින සේවයේ නිරතවීම හේතුවෙන් දින වැටුප් ලබා ගැනීම - රු. 1387.00

**10. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**
**<u>2020 අගෝස්තු මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 597ක් - රු. 62088.00
252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 475 ක් - රු. 49400.00
LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 140 ක් - රු. 14560.00
RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 160 ක් - රු. 16640.00
LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් - රු. 5200.00
තණකොල කැපීම සඳහා පෙට්‍රල් ලීටර් 57 - රු. 7809.00
2T Oil 2L - රු. 1160.00
DS 40 Oil 5L - රු. 2700.00
**එකතුව - <u>රු.159557.00</u>**

**11.නීතිඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**

i. 2020.09.23 දින කැඳවීමට නියමිත 15888 දරණ නඩුව වෙනුවෙන් නීතිඥ හා පෙනී සිටීමේ ගාස්තු - රු. 2000.00

**12. ඩබ්.ජේ.ඒ.ශානක මයා, නාගොඩ ප්‍රාදේශීය සභාව**

2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්ද මධ්‍යස්ථාන 37 ක මැතිවරණයට පෙර සහ පසු දින 4 ක් තුල සිදුකල විෂබීජහරණ කටයුතු වෙනුවෙන් දරන ලද වියදම ප්‍රතිපූර්ණය කිරීම - රු. 9475.00

**13. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**

i. PF 7360 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ ගාස්තු - රු. 1760.00

**14. ඒ.ඩී.කරුණාරත්න මයා, නාගොඩ**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 අගෝස්තු - රු. 7220.00

**15.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 සැප්තැම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු27500.00
ii. 2020 අගෝස්තු මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු.1785.00

**16. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා සැප්තැම්බර් මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**17. එක්සලන්ට් ඇඩ්ස් ඇන්ඩ් කා(ර්) කෙයාර්, තල්ගස්වල**

ගරු උප සභාපතිතුමාගේ මෑණියන්ගේ අවමඟුල වෙනුවෙන් ශෝක ප්‍රකාශිත බැනර් 02 ක් මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 2050.00

**18. සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ ( විවිධ) නීතිගත සංස්ථාව, කොළඹ**
වීථි පහන් අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ආරක්ෂිත බඳ පටියක් ලබා ගැනීම
වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 14500.00

**19. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
පී එෆ් 7360 කැබ් රථයේ සේවා කිරීමේ බිල්පත පියවීම - රු. 14860.00

**20. නිව් විජය මෝටර්ස්, ගාල්ල**
පී එෆ් 7360 දරණ කැබ් රථයේ රෝදයේ පැච් එක තම්බා දැමීමේ සහ එලයිමන්ට්
චෙක් කිරීමේ බිල්පත - රු. 2700.00

**21. පී.එච්.කේ.ජාලත්ගේ, මාපලගම**
ඇට්ටෝනියා ගසසක් තල්ගස්වල සිට නාගොඩ දක්වා ප්‍රවාහණය කිරීමේ බිල්පත - රු. 6000.00

**22. ටී.ජී.හාඩ්වෙයාර්, නාගොඩ**
වයර් සහ ස්විච සඳහා අදාළ බිල්පත පියවීම - රු. 2175.00

**23. කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්, ගාල්ල**
වීථි පහන් නඩත්තු සඳහා සී.එෆ්.එල් බල්බ් 20 ක් ලබා ගැනීමේ බිල්පත - රු. 8600.00

**24. ඩිෂාන් ප්‍රින්ටර්ස්, පිටිගල**
රබර් සීල් එකක් මිළදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 800.00

**25. දසමස් වැටුප් අත්තිකාරම්**
i. ඩබ්.ආර්.අනුෂි වසන්තිකා මිය - රු.250000.00

**26. ටී.ජී.සුමනසිරි මයා, ටී.ජී.හාඩ්වෙයාර්, නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ ප්‍රයෝජනයට ගැනීම සඳහා
ගෑස් ටැංකියක් ලබා ගැනීමේ බිල්පත - රු. 615.00

**27. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
තණකොළ කපන යන්ත්‍ර සඳහා මැෂින්තල මිළදී ගැනීමේ බිල්පත් පියවීම - රු. 750.00

**28. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**
ගමගොඩ පාරේ කඩා වැටුනු බෝක්කුව ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා
අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම - රු. 6010.00

**29. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**
ප්‍රාදේශීය සභාවේ 2020.08.11 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ
සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 2440.00

**30. ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 අගෝස්තු - රු. 6010.00

**31. එස්.එච්.පෙරේරා මහතා, මොරටුව**
නාගොඩ මාපලගම උඩුගම පුස්තකාල 3 සඳහා ලබා ගත් ත්‍රිමාන ඡායාරූප පොත් 3 සඳහා බිල්පත ( උපදේශන කමිටු අනුමැතිය ලැබී ඇත.) - රු. 2025.00

**32. සදරු ග්‍රයින්ඩ් ඇන්ඩ් ග්‍රොසරි, නාගොඩ**
2020.08.11 දින පැවති මහා සභා වාරය සඳහා සංග්‍රහ වියදම් - රු. 4286.00

**33. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
සභා කටයුතු සඳහා ස්ප්‍රේ කෑන් 05 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 850.00

**34. විගණකාධිපති, විගණන කාර්යාලය**
හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**35. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2020 අගෝස්තු) - රු13000.00

**36. ජේ.පී.කමියුනිකේෂන්, නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වවුචර්පත් 3000 ක් මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 5700.00

**37. චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඉදිකරනු ලබන රියදුරු කාමරය සඳහා දොර ලොක් එකක් මිළදී ගැනීමේ බිල්පත - රු. 1360.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**
**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ඉදිරිපත් කරන යෝජනා**
01. ජනතාවගේ ප්‍රජාත්‍රන්තවාදී අයිතියක් වූ පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ පළාත් පාලන ගරු අමාත්‍යතුමා වෙත දැණුම් දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කල ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

01. I. **ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ඉදිරිපත් කල යෝජනාව**

ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ගෙනෙන ලද ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද පළාත් සභා මැතිවරණය ඉක්මනින් පවත්වන ලෙස ගෙනා යෝජනාවට මම විරුද්ධ වෙනවා කියලා යෝජනා කරනවා

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ඉදිරිපත් කල ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු සභාපතිතුමා**
ගරු උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මේ යෝජනාව පිළිබඳව මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව තියෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්,**
ගරු සභාපතිතුමනි, මම හිතනවා ලක්රුවන් මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව සභා සම්මත වෙයි. අවුරුදු හතරක්, පහක් විතර පළාත් සභාව නැතුව, මේ රටේ කිසිම අර්බුදයක් නැතුව, අපි දැක්කා වැඩ කටයුතු සිදු වන හැටි. දැන් තමුන්නාන්සෙලගෙ ජනාධිපතිවරයෙක් ඉන්නෙ. ඒක නිසා මම හිතනවා. ඒ බලතල තමුන්නාන්සෙලා ඉල්ලන්න. මුලු ලංකාවෙම සභාපතිවරුන් එකතු වෙලා පළාත් සභාවට තියෙන බලතල ඉල්ලන්න. පළාත් සභාව සුදු අලියෙක් කියන එක අපි කියනවා. කිසිම වැඩක් කෙරුනෙ නැහැ. කරන්නත් බැහැ. හොඳටම ඕන්නනම් ඒ උදවිය මේ රටේ ප්ලාස්ටික් පුටු 25 ක් දීලා ඇති. මම මේ කියන්නෙ සමස්ථය කුමන පක්ෂයක වුනත්, ඒ මන්ත්‍රීවරුන්ට ලැබෙන පර්මිට් එක කෝටි දෙකයි. ලංකාවෙ පළාත් සභා මන්ත්‍රීවරු කීයක් පත්වෙනවද? පළාත් සභා මන්ත්‍රීවරුන්ට පර්මිට් කෝටි දෙක ගානෙ විකුණන්න පුලුවන්. ඒක ලොකු දෙයක්. තමුන්නාන්සෙලගෙ ගරු ජනාධිපතිතුමාට දැක්මක් තියෙනවා. මේ පළාත් සභා නැතුව, මේ රට පාලනය කිරීමේ හැකියාව ක්‍රියාවෙන් ඔප්පු කරල තියෙනවා. ඒක නිසා අපි යෝජනා කරනවා තමුන්නාන්සෙලට සහයෝගය දෙන්නම්. ඒ තියෙන බලතල වලින් 50% ක් ප්‍රාදේශීය සභාවලට දෙන්න කියලා. තමුන්නාන්සෙලා ඒ බලතල ගන්න. මේ සභාවෙ ගම් මට්ටම, බිම් මට්ටම හැම තැනම නියෝජනය වෙන්නෙ අපි. ඒක නිසා ජනතාවට සේවය කිරීමට අවශ්‍ය නම්, තමුන්නාන්සෙලගෙ ආණ්ඩුවට, අපි යෝජනා කරනවා. එහෙම නැත්නම් තමුන්නාන්සෙලා යෝජනා කරන්න ඕන. මොකද 80% ක් තමුන්නාන්සෙලගෙ සභා තියෙන්නෙ. ක්‍රියාවෙන් ඔප්පු වී තියෙන අවස්ථාවක, පළාත් සභා තව දුරටත් මේ රටේ පැවතිය යුතු වෙන්නෙ නැහැ. මම මේ යෝජනාවට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මේ පළාත් සභා නොමැතිව, පාර්ලිමේන්තුවත්, ප්‍රාදේශීය සභාවත් ශක්තිමත් කිරීම තුලින්, මේ රට පාලනය කිරීමේ හැකියාවත්, මහජන සේවයත්, ඒ සියල්ල කිරීමේ හැකියාව අපි ක්‍රියාවෙන් දැකල තියෙන නිසා. ඒ යෝජනා ඒ මුදල් සුදු අලියෙක්. තවදුරටත් සුදු අලියෙක් නඩත්තු කරන්න එපා කියන එක ප්‍රකාශ කරමින්, මගේ විරුද්ධත්වය මෙයින් ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා අදහස් දක්වමින්,**
ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව මේ සභාවට ඉදිරිපත් කළේ, මේ පළාත් සභා ක්‍රමය මේ ලංකාවට හඳුන්වා දුන්නෙ ජන වාර්ගික ප්‍රශ්නයට යම් විසඳුමක් බලාපොරොත්තුවෙන් තමයි. එදා මේ පළාත් සභා ක්‍රමය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් එවකට පැවතුනු ජන වාර්ගික ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා තමයි මේ පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත කළේ. ඒ නිසා 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මේ සඳහා ක්‍රමවේදයක් රටට හඳුන්වා දෙන්න ඕන. මොකද

අපි මහ ජාතිය හැටියට, මේ රටේ තවත් පිරිස් උතුරු නැගෙනහිර විශේෂයෙන් දමිළ ජනතාව, ඒ වගේම මුස්ලිම් ජනතාව ඒ ප්‍රදේශවල ජනතාවට යම් සහනයක් සැලසීම සඳහා තමයි මේ 13 වෙනි සංශෝධනය ගෙනැල්ලා පළාත් සභා ක්‍රමය ඇති කළේ. ඒ නිසා පළාත් සභාව මම දන්නෙ නැහැ මේක සුදු අලියෙක්ද මොකක්ද කියන එක. නමුත් පළාත් සභාව තුල මේ රටේ විශාල වූ රාජ්‍ය සේවාවක් තියෙනවා. ඒ නිසා මේ රටේ මේක වෙනසකට භාජනය කරනවනම්, මම හිතන්නෙ ඒකට සෑහෙන කාලයක් අරගෙන, මේ ක්‍රමය නැති කරන්න ඕන. නමුත් මේ පළාත් සභා ක්‍රමය තුලින් පළාත් රාජ්‍ය සේවයක්, වගේම විශාල සේවාවක් මේ රට තුල සිදු වෙනවා. විශේෂයෙන් අපේ මන්ත්‍රීවරු සියලු දෙනා මම හිතන්නෙ මේ සම්බන්ධයෙන් එකගතාවය පළ කරයි කියලා මම විශ්වාස කරනවා. මොකද මේ පළාත් සභා මැතිවරණය අනිවාර්යයෙන්ම පසුගිය පැවතිච්ච ක්‍රමයටම තියන්න කියන යෝජනාව නැවත නැවතත් මේ සභාවේ මම ඉල්ලා සිටිනවා. මේ ප්‍රශ්නය ප්‍රාදේශීය සභාවක් හැටියට විසදන්න බැහැ. ජන වාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් යුද්ධය ඉවර වුනාට තවම විසඳුම් ලැබී නැහැ. අපේ අන්නෝන්‍ය සුහදතාවය වර්ධනය කර ගැනීම සඳහාත් මේ පළාත් පාලන ක්‍රමය උපයෝගී වෙනවා. ඒ නිසා මම නැවතත් මේ සභාවට යෝජනා කරනවා. පළාත් සභා මැතිවරණය ඉතාම ඉක්මනින් පවත්වන්න කියලා. මොකද පසුගිය කාලය තුලදී මේ මැතිවරණය පවත්වන්න හැකියාව තිබුනත්, ඒක නොපවත්වා කල් දැමීමේ හේතුවක් නිසා පළාත් සභා මැතිවරණය පැවැත්වුනේ නැහැ. ඒ නිසා මේ පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා අපේ සභාවේ සම්මත වූ යෝජනාවක් ලෙස අදාළ පාර්ශවයන් වෙත දැණුම් දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව අහම්බෙන් ආපු යෝජනාවක්. මේ යෝජනාව සම්බන්ධයෙන් අපේ සූදානමක් තිබුනෙ නැහැ. න්‍යාය පත්‍රයේ තිබුන යෝජනාවක් නෙවෙයි. කාලීන යෝජනාවක් හැටියට සභාවට ඇවිල්ලා, යෝජනා සම්මත වෙච්ච වෙලාවෙ, මේ සම්බන්ධයෙන් අපේ අදහසකුත් ප්‍රකාශ කිරීම සුදුසුය කියල මම කල්පනා කරනවා. ගරු සභාපතිතුමනි, මේ පළාත් සභා ක්‍රමය ගේන කොටම විරුද්ධ වුන මිනිස්සු අපි. ඒක විශේෂයෙන් සඳහන් කළ යුතුව තියෙනවා. 1987 වර්ෂයෙ මේකට විරුද්ධව එවකට කරපු යම් යම් ක්‍රියා මාර්ගයන් සම්බන්ධයෙන්, පාරට ගස් කැපුවයි, ගල් පෙරලුවයි, එහෙම කියලා, අපි අත්අඩංගුවට ගත්තා. ඒ ක්‍රියාව කොච්චර දුරට සාධාරණද නැද්ද කියන කාරණය වෙනම කාරණයක්. නමුත් ඒ සියල්ල සිදු වුනේ මේ පළාත් සභා ක්‍රමයට, එදා අපේ තිබුන බරපතල විරෝධතාවය නිසා. ඒ වෙලාවෙ අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට නියෝජනය කළත්, අපි ජේ වී පී කාරයො හැටියට තමයි ඒ වෙලාවෙ හංවඩු ගැහුනෙ. ජනතා විමුක්ති පෙරමුණ සෘජුවම මේකට සම්පූර්ණ විරෝධය පළ කරලා, එදා කටයුතු කළා. අපේ සභාවෙ මුල්ම සභාපතිතුමා යූ.ජී.ඩී.ආරියතිලක මැතිතුමා. 1987 දැනට අවුරුදු තිස් ගණනකට කලින් අත් අඩංගුවට ගත්තා. මාස තුනක් පැලවත්ත හිර කඳවුරේ හිටියා. ගාල්ල රිමාන්ඩ් බන්ධනාගාරෙ සතියක් හිටියා. ඒ යුගයේ සභාව ආරම්භ වෙලා නැහැ. එතකොට අභාවප්‍රාප්ත හිටපු සභාපති හේමචන්ද්‍ර විලේගේ මැතිතුමා ඒ මාස තුනම පැලවත්ත සිර කඳවුරේ ගත කළා. යූ.ජී.ඩී.ආරියතිලක, උඩුගම රංජිත් ලියනගේ,මාපලගම ඥාණසේන හාමුදුරුවො, එතකොට අපි උඩුගම පොලීසිය මගින් අත් අඩංගුවට ගත්තා. ජනතා විමුක්ති පෙරමුණට උදවු කරපු සහෝදරයන් විශාල ප්‍රමාණයක් අත් අඩංගුවට අරගෙන මරල දැම්මා. මේකට විරුද්ධව රජීව් ගාන්ධි ලංකාවට ආපු වෙලාවෙ, අපේ බූස්සෙ නාවික හමුදා රණ විරුවෙක් ප්‍රහාරයක් එල්ල කළා. එමගින් බරපතල ජාත්‍යන්තර ප්‍රශ්නයක් ඇඳුනා. එතකොට පළාත් සභා ක්‍රමයට මුලුමනින්ම අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියටත්, වෙනම පුද්ගලයන් හැටියට, පුද්ගලිකවත් ඒ තිබුන වාතාවරණය තුල විරුද්ධ වුන අය. එවකට එක්සත් ජාතික පක්ෂය ප්‍රභල තනි පක්ෂයක් හැටියට මේ රටේ ආණ්ඩු කරද්දි, ඒ කිසි විරෝධතාවක් කණකට නොගෙන, උතුරු නැගෙනහිර ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන්, කියන කාරණාව ගෙනැල්ලා, මේ රටේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කළා. මම

සභබන්දු මැතිතුමාට ගෞරව කරනවා. එදා කෙසේ වෙතත් එතුමාල අද විරුද්ධ වීම යම් යම් කරුණු අවබෝධ වීම් තේරුම් ගැනීම් මත සිදු වෙන්න පුලුවන්. ඒකෙ ඇති වැරැද්දක් නැහැ. නැත්නම් මට ප්‍රහාරයක් එල්ල කරන්න පුලුවන්. එදා ඔබතුමන්ලගෙ ආණ්ඩුකාලෙ තමයි ගෙනාවෙ. අපි විරුද්ධ වන විට ඔබතුමාලා ස්ථාපිත කළා. අපි හිර කරුවො බවට පත්කළා. ඝාතනය කළා. ඒ සියල්ල තියෙද්දි අද මේක සියලු දෙනාටම එපා වෙලා. නමුත් ඒකෙ ගැටලුක් නැහැ. ඒක නෙවෙයි ප්‍රශ්නය තියෙන්නෙ. මම කියන්නෙ අපි එදත් පළාත් සභා ක්‍රමයට විරුද්ධව කටයුතු කරපු, ක්‍රියා කරපු අය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතය තිබුනෙ පළාත් සභා මැතිවරණයටවත් ඉදිරිපත් වෙන්නෙ නැහැ කියලා. ඒ අනුව 1988 තිබුන ප්‍රථම පළාත් සභා මැතිවරණයට අපි ඉදිරිපත් වුනේ නැහැ. පක්ෂයක් හැටියට එක්සත් සමාජවාදී පෙරමුණ තමයි එක්සත් ජාතික පක්ෂයත් එක්ක තරගෙට දකුණු පළාතෙ ඉදිරිපත් වුනේ. අධි නීතීඥ අශෝක වීරසිංහද සිල්වා, මැතිතුමාගෙ නායකත්වයෙන් මේ සභාවෙ හිටපු ගරු මන්ත්‍රී වසන්ත ධර්මප්‍රිය මොහොට්ටිගෙ තාත්තා දයාවංශ මොහොට්ටි මහත්තයලා, රත්නපාල මැතිතුමාලා, වගේ පිරිසක් පළාත් සභාවට ඉදිරිපත් වුනා. ඒ වගේම ජෝර්ජ් රත්නායක වැනි වමේ වීරෝදාර නායකයො, එවකට කිව්වෙ ජනතා විමුක්ති පෙරමුණ විසින් වෙඩිතියල මරල දැම්මයි කියලා. මම දන්නෙ නැහැ කාගෙ අතින් ඝාතනය වුනාද නැද්ද කියලා. ජෝර්ජ් රත්නායකලා වගේ මිනිස්සු විශාල ප්‍රමාණයක් ඝාතනය වුනා. අන්තිමේදි එදා පළාත් සභාවෙ එක්සත් ජාතික පක්ෂයේ අමරසිරි මහත්තයා පළවෙනි මහ ඇමතිවරය හැටියට පත් වුනා. විපක්ෂ නායක හැටියට අශෝක වීරසිංහද සිල්වා මැතිතුමා පත්වුනා. අපේ දයාවංශ මොහොට්ටි මහත්තයලා, රත්නපාල මහත්තයලා පළාත් සභාවට ගියා. ඒ කෙසේ නමුත් ඒ විරුද්ධ වුන සියලු කණ්ඩායම් දෙවනි පළාත් සභා මැතිවරණය වෙන කොට, ජනතා විමුක්ති පෙරමුණත්, ශ්‍රීලංකා නිදහස් පක්ෂය ඇතුලු ඒ විරුද්ධ බලවේග සියල්ල මේ ක්‍රමය වැලඳ ගත්තා. මේ පළාත් සභා ක්‍රමය වැළඳගෙන, පළාත් සභාවෙ මහ ඇමතිවරයා වෙන්න තුන්වෙනි වතාවෙ අමරසිරි දොඩංගොඩ මැතිතුමාට පුලුවන්කම ලැබුනා. මාස එකහමාරක් දෙවෙනි වතාවෙ හිටියා. ඒ විරුද්ද වෙච්ච ශ්‍රී ලංකා නිදහස් පක්ෂෙන් තමයි තෙවෙනි වතාවෙ මහ ඇමතිවරයා පත්වුනේ. එවිට ජනතා විමුක්ති පෙරමුණ පළාත් සභාවට ඉදිරිපත් වුනා. මන්ත්‍රීවරුන් බිහිවු.නා එය විසුරුවා හරින තෙක්ම, ජනතා විමුක්ති පෙරමුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, හරි හෝ වැරදි පසු කාලීනව පළාත් සභා ක්‍රමය වැලඳ ගත්තා.

ගරු සභාපතිතුමනි, ඒ ක්‍රමයේ ඉතිහාසය මම ඉතාම කෙටියෙන් පැහැදිලි කළේ. තව ගොඩාක් කරුණු ප්‍රකාශ කළ යුතුව තිබුණත්, ඒවා ප්‍රකාශ කරන්න අවශ්‍ය නැහැ. නමුත් අද තියෙන්නෙ මම විරුද්දද නැද්ද කියන කාරණේ නෙවෙයි. අද එක පැත්තකින් විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තියෙනවා. අද රටේ පොදු මතයක් තියෙනවා විශාල මුදල් ප්‍රමාණයක් මේ පළාත් සභා ක්‍රමය හින්ද කාබාසිනියා වෙනවා කියලා. විශාල නිලධාරීන් පිරිසක් හා විශාල දේශපාලන අධිකාරියේ පිරිසක් නඩත්තු කරන්න සිදු වෙලා තියෙනවා. ඒ අය වෙනුවෙන් කාර්යය මණ්ඩලය නඩත්තු කරන්න, කාර්යාල පහසුකම් දෙන්න සිදු වෙලා තියෙනවා. ඒ නිසා ඒ එක් එක් පළාත් සභාවලට දැරිය නොහැකි විශාල වියදමක් පළාත් සභා ක්‍රමය නිසා දරන්න වෙලා තියෙනවයි කියන එක රටේ පොදු මතයක් හැටියට මුල් බැසගෙන තියෙනවා. පරිපාලන සේවයේ විශාල අවුල් කරපු ක්‍රමයක් හැටියට තමයි අපි එදත් දැක්කෙ. අදනම් ඒක ඇගවල්වලට මිනිස්සුන්ගෙ එන්නත් වෙලා ඒකසාමාන්‍ය දෙයක් බවට පත් වෙලා තියෙනවා.

ගරු සභාපතිතුමාත් පිළිගන්නවා. දිසාපතිතුමා කියන නිලමට්ටම යටතෙ තමයි දිස්ත්‍රික්කෙ සිවිල් පරිපාලන කටයුතු සියල්ල සිදු වුනේ. ඊට පස්සෙ පළාත් සභා ක්‍රමය ස්ථාපිත වුනාට පස්සෙ, ඒකට සමගාමී බලයක් තියෙන තවත් තනතුරක් වන ප්‍රධාන ලේකම් කියන තනතුර ඇති කළා. එවිට දිසාපතිතුමාගෙ බලය බෙදිලා, ඒ තේජස නැතිවෙලා ගියා. කෙලින්ම දිසාපතිතුමා, උප දිසාපතිතුමා, ග්‍රාම නිලධාරී කියන ඒ පරිපාලන ආයතන සම්පූර්ණ අකර්මන්‍ය වෙලා, හැකිලිලා, රටේ ශක්තියක්

නැති ආයතන බවට පත් කළා. අද අනිත් පැත්තෙන් ඒ වෙනුවට ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, සහකාර ප්‍රධාන ලේකම්, සහකාර අධ්‍යක්ෂකවරු ඒ හරහා වෙනම තවත් තැනක පරිපාලන ඒකකයක් ගොඩනැගුනා. ඒ නිසා දිසාපතිවරුන්ගෙන්, උප දිසාපතිවරුන්ගෙන් කෙරුන කාර්යය භාරයම සිදු කරන්න තවත් විශාල නිලධාරී කණ්ඩායමක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වගේ විශාල ගොඩනැගිල්ලක් හදලා, දහනායක මාවතේ තියෙන ප්‍රධාන ලේකම් කාර්යාලය ස්ථාපිත කළා. එකම තැනකින් වෙන්න ඕන වැඩ දෙපොලකින් කරන්න පුලුවන් විදිහෙ මහා නිලධාරී ගොන්නක් ඇති කරලා, මේ හැම කාර්යාලයකටම රේඛීය අමාත්‍යාංශයේ නිලධාරිනුත්, පළාත් සභාවෙ නිලධාරිනුත්, ඇතුලත් කරලා තියෙනවා. පළාත් සභාවෙන් මොනව හරි ආවොත් ඒකට අදාල පළාත් සභාවෙ නිලධාරියෙකුත් එකම කාර්යාලෙ ඇතුලෙ ඉන්නවා. ඒ නිසා විශාල පරිපාලනමය වශයෙන් ඇගට දැනෙන බරපතල ප්‍රශ්න සහ ප්‍රශ්න විසඳන්න බැරි දෙපැත්තට දෝලනය වෙන කරුණු කාරනා ගණනාවක් මේ රටේ ඇති කරන්න මේ පළාත් සභා ක්‍රමය කටයුතු කළා. ඒකෙන් වැඩ පස්සට ගියා මිසක් පරිපාලන වශයෙන් වැඩ ඉස්සරහට ඒමක් සිදු වුනේ නැහැ. දිසාපතිගේ වැඩ ප්‍රධාන ලේකම් කාර්යාලයට ගියා. ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් සමහර වැඩ මෙහාට එන්න ගත්තා. වැඩ අතරමග හිරවෙන තත්වයක් අදත් දකින්න පුලුවන්කම තියෙනවා. ඔය ක්‍රමය යටතේ ඇති වෙච්ච එක දෙයක් හැටියට, අපි විශේෂයෙන්ම මේ වෙලාවෙ සිහිපත් කරනවා. එතනට පත්වෙන නිලධාරින්ට, යන වාහන ඉන්ධන, මුදල් කන්දනාව දිහා බැලුහම, මේ එක තැනකින් කෙරිච්ච වැඩ කොපමන නිලධාරීන් පිරිසක් අතට මේ වැඩ පත්වෙලා, රටේ වැඩ කරන්න තියෙන සල්ලි ටික පළාත් සභා හරහා මොන තරම් දුරට විනාශ වුනාද? හැබැයි ඔය එකක්වත් සම්බන්ධයෙන් නෙවෙයි එදා විරෝධතාවයන් ඇති වුනේ, ගරු සභාපතිතුමනි, 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බරපතල ප්‍රශ්න තියෙන නිසා තමයි විරෝධතාවය ඇති වුනේ. එහෙම නැතුව ඔය මම කියන සරල නිලධාරීන් දෙපැත්තකට වීම, නිලධාරීන් වැඩිවීම ඒ අයට වාහන දීම, කාර්යාල දීම වැනි ප්‍රශ්නයක් මුල්කරගෙන නෙවෙයි. රටේ ඇවිලී ගිය වාර්ගික අර්බුදයත් එක්ක රටට අත්වෙන්න පුලුවන් ඉරණම කල්පනා කරල තමයි එදා බරපතල විදිහට විරුද්ධ වුනේ. විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕන මේක ඉස්සරහට අරගෙන ආවෙ ජනතා විමුක්ති පෙරමුණ. ඒ අය තමයි වැඩියෙන්ම කරුණු පැහැදිලි කරලා, මේක පෙන්නල දුන්නෙ.13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ තියෙන බරපතල කාරණා මතුකරලා දුන්නෙ. අදත් ගරු සභාපතිතුමනි, ඔබතුමා පිළිගන්නවා. දැනටත් පළාත් සභාවකට සෘජුවම කළ හැකි බලතල කියල වෙනම කොටසක් තියෙනවා. ඒක කෙලින්ම පළාත් සභාවෙන් කරන්න පුලුවන්. පළාත් සභාවට මොනම විදිහකින්වත් කරන්න බැරි රේඛීය අමාත්‍යාංශයට පමණක් කළ හැකි බලතල කියලා වෙනම කොටසක් තියෙනවා. මම කියන්නෙ පරිපාලන වශයෙන් බරපතල අර්බුද රාශියක් නිර්මාණය වුනු ආකාරය. ඊලගට තවත් බලතල විශේෂයක් තියෙනවා සමගාමී බලතල කියලා. පළාත් සභාවත් කරනවා. මධ්‍යම ආණ්ඩුවත් කරනවා. ඒ බලතල සමගාමී බලතල වෙනවා පළාත් සභාව තනියම කරන වැඩටික පළාත් සභා බලතල වෙනවා. රේඛීය අමාත්‍යාංශය තනියම කරන වැඩ රේඛීය අමාත්‍යාංශ බලතල බවට පත් වෙනවා. ඒ නිසා බරපතල අර්බුදයක් හැදුනා. ඉඩම් විෂය සම්බන්ධයෙන් ගත්තම එහෙමයි. ඉඩම් විෂයට පළාත් සභාවත් වග කියනවා. මධ්‍යම ආණ්ඩුවත් වග කියනවා. ඒ නිසා ප්‍රශ්න එකතැන පල්වෙනවා. දෙකෙන්ම සිදු වෙන්නෙ නැහැ. ඒ ප්‍රශ්නවලට විසඳුමක් නැහැ. ඒක විමධ්‍යගත කරපු විෂයක් බවට අද ඉඩම් විෂය පත්වෙලා තියෙනවා.

ඊලගට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 13 වෙනි සංශෝධනය අනුව උතුරු නැගෙනහිරට ඉඩම් දීමේ, ඉඩම් පරිහරණය කිරීමේ බලය හා පොලිස් බලතල ඒ කණ්ඩායම්වලට ගිහිල්ල තියෙනවා. ඒක තමයි විවාදයට තුඩුදුන් ප්‍රධාන කාරණය. අදත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 13 වෙනි සංශෝධනයෙන් හිමි, එහෙත් උතුරු හා නැගෙනහිරට නොදෙන බලතල ඉල්ලනකොට, විග්නේෂ්වරම්ලා, සිවාජිලිංගම්ල වගේ මිනිස්සු අදත් වෙන වෙන පක්ෂත් හදාගෙන ඡන්දය ඉල්ලමින් කෑ ගහන්නෙ 13 ශක්තිමත් කරන්න කියලා .13 නේ තියෙන ටිකත් මදි කියලා කියන්නෙ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුල ඇති වුන

සංශෝධනයන් තුලත් බරපතල අර්බුද තියෙනවා. ඒ නිසා නැති අර්බුද ගණනාවක් නිර්මාණය කරපු පරිපාලන ඒකකයක් හැටියට තමයි පළාත් සභාව එදත් අපි දැක්කෙ. මම ඒ පැත්තෙන් ඊට වඩා කරුණු පැහැදිලි කරන්නෙ නැහැ. හැබැයි ඒ සියල්ල පැත්තකින් තියලා අද අපි මුණිවත රැකගෙන නිශ්ශබ්ද වෙමින්, මේක හොඳයි කියන තැනට හෙමින් හෙමින් අඩිය තියාගෙන යනවා. ගරු සභාපතිතුමනි, පළාත් සභා මන්ත්‍රීතුමා අපේ ආසන්න හිතවතෙක්. අපි විසින් පත් කරන මිනිහෙක්. ප්‍රාදේශීය සභාවෙන් යන කෙනෙක්. අපි එයත් එක්ක ලෙන්ගතු වෙනවා. සභබන්දු මැතිතුමා ප්‍රකාශ කළා වගේ, අපි එයාගෙන් රුපියල් 10000 ක පුටු ගන්නවා. ටකරන් මඩුවක් ගන්නවා. රුපියල් 5000 ක 10000 ක ලක්‍ෂය දක්වා වූ ආධාරයක් දෙන්න පුලුවන්. නැවත නොගෙවන නිවාස ආධාරයක් දෙන්න පුලුවන්. අපි ඒක ගන්නවා. අයෙත් ගෙවන්න ඕන නැහැ. හිතවත්කම අනුව මන්ත්‍රීතුමාගෙන් එහෙම දෙයක් කරගන්න පුලුවන්. ඒක නැවත ගෙවීමක් නැහැ. ඒ ගැන සොයා බැලීමකුත් නැහැ. නිවස ඉදිවුනාද කියල බලන්නෙත් නැහැ. නිකන් සංතෝසමක් හැටියට අපේ හිතවත් මන්ත්‍රීතුමාට කියල අපට ලබා ගන්න පුලුවන්. රුපියල් 50000 ක විතර පාලමක් බෝක්කුවක් ලිදක් හදා ගන්න පුලුවන්. පළාත් සභා විෂය භාර ඇමතිතුමා නම් ඊට වඩා ලොකු කටයුත්තක් කරන්න පුලුවන්.

ඊලගට පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට වඩා පාර්ලිමේන්තු ඇමතිතුමාට වඩා අපට ආසන්නතම පුද්ගලයා ලෙස පළාත් සභා මන්ත්‍රීවරයා හඳුන්වන්න පුළුවන්. මොකද මළ ගෙදර කතාවක් කරන්න, මගුල් ගෙදර අත්සනක් ගහ ගන්න, නිතර හමුවෙන අපිත් එක්ක පොලීසියට කතා කරන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කතා කරන, ඒ සියලු කාරණා නිසා අපට පළාත් සභාව නැතුවම බැරි මෙවලමක් බවට දැන් පත්වෙලා තියෙනවා. පළාත් සභා එපාය කියපු සියලු කණ්ඩායම්වලට සිදු වෙලා තියෙන්නෙත් ඒක. ඒ අයට යන්න තියෙන, කතා කරන, වැඩ කරන්න, හමුවෙන්න කාර්යාලයක් තියෙන, දුරකතනයක් තියෙන, ඒ සියලු ප්‍රයෝජන ගන්න තියෙන්නෙ දැන් පළාත් සභාවෙ අපේ මන්ත්‍රීතුමා අපේ හිතවත් ඇමතිතුමා අපේ හිතවත් මහ ඇමතිතුමා හරහා. ඒ නිසා නරකයි කියන කොටස අමතක වෙලා ගිහිල්ලා, හොඳයි කියන කොටස පොඩ්ඩ පොඩ්ඩ ඉස්සරහට වෙලා තියෙනවා. අද මේ සභාවෙ ගරු සභාපතිතුමනි, මේකට විරුද්ධව කතා කළොත්, ඒ විරුද්ධව කතා කරන කෙනා බරපතල දෝෂදර්ශනයට ලක් වෙනවා. දැන් සභබන්දු මහත්තයා එහෙම විරුද්ධව කතා කළත්, එතුමාගෙ පක්ෂෙත් ඉන්නවා පළාත් සභා මන්ත්‍රීවරු. එතුමාගෙ පක්ෂෙත් කලින් පළාත් සභාවෙ හිටපු ඇමතිවරු ඉන්නවා. දැනටත් මන්ත්‍රීවරු ඉන්නවා. මේ වැඩේට ඒ අය පොඩ්ඩක් උරණයි. පළාත් සභා ඉල්ලන සියලුම දෙනා අද සංසද හදාගෙන, විශේෂයෙන්ම මේ යෝජනාව එන්න මූලික කාරණා අතරෙ එක කාරණයක් තමයි පළාත් සභා හිටපු මන්ත්‍රීවරු ඇමතිවරු එකතුවෙලා, පළාත් සභාව හොඳයි කියලා ගාල්ලෙදි තීරණයක් ගන්නවා. ඒක කොළඹදිත් වෙනවා. නුවරදිත් වෙනවා. අනිත් තැන්වලදිත් වෙනවා. මේක ඒකෙ එක අවස්ථාවක්. ඒකෙ වැරැද්දක් නැහැ. ඒ අය මේක අහෝසි කළොත් කොහේටද යන්නෙ කියලා ප්‍රශ්නයක් තියෙනවා. අද පළාත් සභාව අහෝසි වුනොත් නිලධාරීන්ට කරන්නෙ මොකක්ද කියන එක තියෙනවා. දැන් ගරු සභාපතිතුමනි, ඔබතුමාම හිතන්න පළාත් සභාව දැන් නතර කර දැමුවොත්, ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, අනිත් සහකාර ලේකම්වරු කොහේද අපි වාඩි කරන්නෙ අපි මොනව කතා කළත්, මේක නතර කරන්න බැරි අක්මුල් හිගිපු පිළිකාවක් බවට පත්වෙලා තියෙනවා. අද අපි කොච්චර කෑ ගැහුවත්, නතර කරනවනම් නතර කරන්නෙ කොහොමද කියලා අපි විසඳුම් මේ සමගම කතා කළ යුතුව තියෙනවා. ඒ නිසා එදා එපයි කිව්වත්, එදා ප්‍රතික්ෂේප කරපු පළාත් සභාව ඒ කටවල් වලින්ම අද හොඳයි කියන්න සිදු වෙලා තියෙනවා. අද මේකට විරුද්ධව කතා කරන අපේ ගරු විපක්ෂ නායකතුමා සභබන්දු මැතිතුමාට මගේ උගත් මිත්‍රයාට වුනත් අද විරුද්ධ වෙන්න වුනේ මේ ක්‍රමේ තියෙන අපි මේ හොඳ නැහැ කියන කරුණු කාරණා නිසා. නමුත් එතුමටත් සිදු වුනා දෙවතාවක්ම මේ පළාත් සභාවට තරග වදින්න. එතුමත් මේ මැතිවරණ ක්‍රමයේ ගොදුරක් බවට පත්වෙලා. නමුත් ඒ නිසාම එතුමාට මේකට විරුද්ධ වෙන්න

අයිතියක් නැහැ කියන කාරණය කාටවත් කියන්න බැහැ. නමුත් ඒ ඇතිවෙන දේශපාලන සන්දර්භයන් තුල කාලීනව ඒවට මුහුණ දෙන්න දේශපාලකයො හැටියට අපට සිදු වෙනවා. ඒ නිසා මිත්‍රවරුනි අපි කිව්වෙ ඒකයි. මගේ ස්ථාවරය මුලින් අපි මේකට දැඩිව විරුද්ධව සටන් කරපු , මේකෙ භයානක කම කියපු මිනිස්සු. භයානක කම පිළිගත්තනම්, මේ ක්‍රමයම ස්ථාපිත වෙන්නෙ නැහැ.
හැබැයි අනිත් පැත්තෙන් ගරු සභාපතිතුමනි, මුලු සභාවම මේකට විරුද්ධයි කියලා යෝජනාව සම්මත කළොත්, ආණ්ඩුව පත්වෙන අසීරුතාවය මොන වගේ එකක්ද කියලා නිකමට කල්පනා කරලා බලන්න. මොකද පළාත් සභාව හැදුවෙම උතුරේ හා නැගෙනහිර වාර්ගික අර්බුදයට විසඳුමක් හැටියට. අද ඒ දීපු ඒව වැඩියි කියලා දකුණේ මිනිස්සු කියන්නෙ. 13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉඩම් හා පොලිස් බලතල දෙන්නම එපා කියලා කියන්නෙ. තවම ක්‍රියාත්මක කරන්නෙත් නැහැ. එහෙමත් කියද්දි, ඒ අය කියනවා ඒ ටිකත් මදි කියලා. පළාත් සභා ක්‍රමයම අහෝසි කළොත් උතුරේ හා නැගෙනහිර වාර්ගික අර්බුදයට රජය දෙන විසඳුම මොකක්ද? පළාත් සභාව තිබුනම අපි විරුද්ධයි. පළාත් සභාවෙ තියෙන ප්‍රමාණය මදි කියලා ඒ අය සටන් කරනවා. එහෙමනම් 13 ටත් එහා ගිය එකක් උතුරේ සහ නැගෙනහිර මිනිස්සු ඉල්ලන්නෙ. එහෙනම් ආණ්ඩුව පළාත් සභා විසිරෙව්වොත්, අසල්වැසි ඉන්දියාව අපට අත නොදායිද? මේ ක්‍රමය අද විසුරවන්න බැරි තැනකට ආණ්ඩුව හිර වෙලා තියෙනවා. ආණ්ඩුවෙ කොටසක් ඉන්නවා කැමතියි. නමුත් මේකට එහෙම අත තියන්න බැහැ. ගරු සභාපතිතුමනි, උතුර හා නැගෙනහිරට ආණ්ඩුව විකල්ප දෙන්න ඕන. ඉන්දියාව බලන් ඉන්නවා. අනිත් එක දෙමළ ඩයස්පෝරාව බලන් ඉන්නවා. ඒ නිසා හිතන තරම් ලේසි කාරණයක් නෙවෙයි. මේක එපයි කියල දැන් යෝජනා කරල සම්මත කර ගත්තත්, මම මේ ගරු සභාවට මතක් කරනවා. මේ පළාත් සභාව තියන එක තියනවාමයි. ආණ්ඩුවට ඊට වඩා එහා විකල්පයක් නැහැ. ප්‍රශ්නෙ තියෙන්නෙ පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයා මේ සංකල්පයට මුල ඉඳලම විරුද්ධ කෙනෙක්. මට අදහගන්න බැරි ප්‍රශ්නෙ තියෙන්නෙ ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා විසින් 13 ට මුලුමනින්ම විරුද්ධව අදහස් දක්වපු, අදහස් ප්‍රකාශ කරන ඒ මතයේ පිහිටා ඉදපු, ඒ මතය පෝෂනය කරපු, ඒ මතය කරගහගෙන ගිය සරත් වීරසේකර මැතිතුමාට පළාත් සභා පළාත් පාලන අමාත්‍ය ධූරය ලබා දීම පිළිබදව. සරත් වීරසේකර මැතිතුමාගේ ජයග්‍රහණයේ, කොළඹ ඡන්ද සංඛ්‍යාව ඔපමන වැඩිවුනේ කොහොමද? ඒ ජාතිවාදී පදනම මත සිංහල බෞද්ධ කුලප්පු වීම් තුල ලැබුන ඡන්ද. එහෙම ඡන්ද තුන් ලක්ෂ ගණනක් ලබපු සරත් වීරසේකර මහත්තයා මේකට අමු අමුවෙම විරුද්ධ අදහස් දක්වන, මේක එපයිම කියල කියන කෙනෙක්ම ඇමතිවරයා හැටියට පත්කර ගත්තෙ මොකද කියලා මම දන්නෙ නැහැ. එහෙම නැත්නම් සරත් වීරසේකර මහත්තයගෙ දෛවයේ සරදමක් වෙන්න ඇති. අපිත් බලන් ඉන්නවා සරත් වීරසේකර මැතිතුමා මේකට මොකක්ද කරන්නෙ, ගන්න තීරණය මොකක්ද කියලා. සරත් වීරසේකර මැතිතුමා විසින් පළාත් සභා ක්‍රමය අහෝසි කරනවයි කියලා කිව් සැනින්, අද මුලු ලංකාවෙම හිටපු පළාත් සභාවල මහ ඇමතිවරු හිටපු ඇමතිවරු හිටපු මන්ත්‍රීවරු සියලු දෙනාම එකතුවෙලා එයාට තද විරෝදතාවක් ප්‍රකාශ කරල තියෙනවා.
ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි සභාව මට්ටමින් කතා කරන්නෙ අපිට ජාතික දේශපාලනයේ ඒ තැන ගැන කතා කරන්න අවශ්‍ය නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, මම පැහැදිලිව කිව්වා. අපි මුලින් විරුද්ධ වුනා. විරුද්ධව අදහස් දැක්වුවා. කූඩුවල ගියා. ඒ සියලු දේ සිදු වුනා. නමුත් ක්‍රමය එහෙමම ගියා. ක්‍රමය දැන් අවුරුදු තිස් ගණනක් මෙහාට ආවා. මුලින් විරුද්ධ වෙලා කටයුතු කළාට, ඒ ක්‍රමයට මිනිස්සු යවන්න අපි ඉල්ලුවෙ නැතත්, අපි අනූ තුනේ ඉඳලා තිබුන සෑම මැතිවරණයකම ඒ පළාත් සභා අපේක්ෂකයන් මන්ත්‍රීවරුන් මහ ඇමතිවරුන් කරන්න මමත් දර දිය ඇදපු මිනිහෙක්. මම ඒකයි කිව්වෙ JVP එකත් විරුද්ධ වුනා. JVP එකත් ඡන්දෙ ඉල්ලුවා. UNP එකෙත් විරුද්ධ පිරිස් හිටියා. ඒ අයත් අන්තිමට මේ ක්‍රමයට ඇවිල්ලා උදවු කළා. ඒ නිසා අපිත් මුලින් විරුද්ද වුනා. 93 නේ ඉදල මිනිස්සු ඉස්සරහට ගෙනියන්න කටයුතු කළා. පහුගිය පළාත් සභාව මැතිවරණය වෙනකනුත් අපි ඒ සටන දියත් කළා. ඒ නිසා මම මේ කිව්වෙ අපට ජේන ගුණ හා අගුණ. සභාපතිතුමනි, නිලධාරින්ගෙ ප්‍රශ්නෙ

විතරයි මම කිව්වෙ. ඊළඟට මේ දේශපාලන අධිකාරියට වෙන්නෙ, ලබන සැරේ මේක අහෝසිනම්, ලබන කොට්ඨාස මැතිවරණෙදි අපේ අලුත්වත්ත කොට්ඨාසෙට ඉල්ලන්නෙත් චන්ද්‍රසිරි මහත්තයයි මමයි නෙවෙයි. මොකද පළාත් සභා මන්ත්‍රීකම කරපු මිනිස්සුන්ට මොකක්ද ඉල්ලන්න තියෙන ඡන්දෙ. ඒ පාර ඒ අය නිකන් ඉන්නද? ඒ අයට ප්‍රාදේශීය සභාව දෙන්න වෙනවා. ඔබතුමාගෙ පුටුවෙ ඔබතුමාට ඉන්න හම්බ වෙන්නෙ නැහැ. ඇයි මේ කොට්ඨාසෙ මහ ඇමතිවරු වෙන්න ඉන්න, පළාත් සභාවෙ ඇමතිකම් කරන්න ඉන්න, නියෝජ්‍ය සභාපතිකම් කරපු, සභා නායකකම් කරපු මිනිස්සු ඉන්නවා ඔබතුමාගෙ ආසනේ. ඒ මිනිස්සු මෙතන වාඩි කරන්න ඕන. මොකද ඒ මිනිස්සු ගෙදර එලවන්නද? දැන් මේ පළාත් සභා මන්ත්‍රීවරු ටිකට මොකක්ද කරන්නෙ. 25 දෙනෙක් අපේක්ෂකයො හැටියට ඉන්නවා බලාපොරොත්තු තියෙන අය තව ගොන්නයි. ඒ නිසා ඒ අයට දෙන්න තැනක් නැහැ. පළාත් සභා ඇමති මට්ටමේ අයට දෙන්න දෙයක් නැහැ. කැබිනට් ඇමති කෙනෙකුට සමාන බලතල තියෙන මහ ඇමතිතුමාට දෙන්න දෙයක් නැහැ. එතකොට මොකක්ද මේ අය පාර්ලිමේන්තු ගෙනියන්නද? පළාත් සභා ක්‍රමය නැත්නම් ඒ අය කැමතිවේද ප්‍රාදේශීය සභාවට. ඒ කණ්ඩායම විසින් ආණ්ඩු බිහි කරන්න, ආණ්ඩු පත් කරන්න කොට්ඨාසය තුල දිස්ත්‍රික්කය තුල කරපු කාර්යය භාරයට දෙන්නෙ මොකක්ද? UNP යෙත් එහෙමයි. ශ්‍රී ලංකා එකෙත් එහෙමයි. එක්සත් ජාතික පක්ෂය පහුගිය මහ මැතිවරණෙදි පරාද වුනු ගොඩක් අපේක්ෂක මහත්වරු පළාත් සභාවට දැනටම සූදානම් වෙනවා. ඒ අය ආයෙත් කොහේටද යන්නෙ? ඒ නිසා නිලධාරින්ටත්, ප්‍රාදේශීය සභාවට උඩින් ඉන්න දේශපාලන අධිකාරියටත්, බරපතල ප්‍රශ්න සමූහයක් නිර්මාණය වෙලා තියෙනවා. ඒ නිසා මීට වඩා සුදුසු හොඳ එකගතාවයක්, රටට හොඳ දේශපාලන වැඩපිළිවෙලක්, හොඳ ක්‍රමයක් ඇතිවෙන තුරු මේ ක්‍රමය පවත්වාගෙන යාම මිස වෙනත් විකල්පයක් නැහැ කියන කාරණය තමයි මගේ අදහස. ඒ අනුව මගේ විශාල කැමැත්තකුත් නැහැ. විශාල අකමැත්තකුත් නැහැ. ගරු සභාපතිතුමනි, ගරු සභාවෙන් මොකක්ද ඔයාගෙ මතය කියලා අහවි. මතය එක්කො විරුද්ද වෙන්න ඕන. නැත්නම් කැමති වෙන්න ඕන. මම කිව්වා විරුද්ධ වෙන්න තියෙන කාරණයි. කැමති වෙන්න තියෙන කාරණයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම කියන්නෙ අඩුම ගණනෙ තව සැරයක්වත් ගිහිල්ලා තමයි මොකක් හරි ක්‍රමයක් හදා ගන්න වෙන්නෙ. හැබැයි ඔහොම ගියා දිගටම. මේ වෙනකන්ම ඕක නවත්වන්න ක්‍රම හදන්න හදා ගන්න බැරි වුනා. ඒ නිසා වගකිව යුතු අයට එහෙම ක්‍රමයක් හදන්න මේ දේශපාලන අධිකාරියටත්, මේ නිලධාරින්ටත් වැඩක් තියෙන රටටත්, වැඩක් තියෙන ක්‍රමයක් හැදෙන තුරු පළාත් සභා ක්‍රමය එපා කියන්න පුලුවන් කමක් නැති තැනක අපි නතර වෙලා තියෙනවයි කියන කාරණය මේ ගරු සභාවට මතක් කරමින්, සවන් දුන් තමුන්නාන්සෙලට ස්තූති වන්ත වෙමින්, මම මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපට ඇත්තටම මේ අජිත් මන්ත්‍රීතුමා ගොඩක් පැහැදිලිකම් කළා. අපි එදා ඉදලම ජනතා විමුක්ති පෙරමුණ හැටියට, මේ පළාත් සභා ක්‍රමයට ඇත්තටම විරුද්ධයි. අපට මේ යන්න තියෙන ක්‍රමයත් එක්ක තමයි අපිට අජිත් මන්ත්‍රීතුමා කිව්ව වගේ වුනේ. මේ ක්‍රමය වෙනස් කරන්න ඕන. නමුත් මේ ක්‍රමේදි අර අපේ අහිංසක ජනතාවට සලකන්න තියෙන මොහොතක් අඩු වෙනවා. ඒ වුනත් මේ ලක්රුවන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට අපි ජනතා විමුක්ති පෙරමුණ හැටියට විරුද්ධ බව මම මේ මොහොතේ ප්‍රකාශ කර සිටිනවා.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමනි, අපේ ගරු විපක්ෂ නායකතුමා, පළාත් සභාවට දෙසැරයක් ඡන්දය ඉල්ලපු එතුමා, මේ පළාත් සභාව සුදු අලියෙක් කියල කිව්වා. ඒක අපි කිව්වෙ මීට කලින්. අපි 1987 තෙක් මේකට විරුද්ධ වුනා. පළාත් සභාව ගැන, අපේ හිටපු සභාපති අජිත් එඩේර ආරච්චි මැතිතුමා ඉතා වැදගත් විදිහට කතා කළා. පළාත් සභාව වෙලාවෙ මතකයි උඩින් ගෙනහැල්ල පරිප්පු දැම්මා. ඒවට විසඳුම්

වශයෙන් තමයි අපට පළාත් සභාව ඇති වුනේ. ඒ වෙලාවෙ ජනතා විමුක්ති පෙරමුණ විසින් පළාත් සභා ඉල්ලපු අපේක්ෂකයො, පළාත් සභා මන්ත්‍රීවරු ඝාතනය කළා. අපි අදටත් පළාත් සභාවට විරුද්ධයි. ඒත් පළාත් සභා මැතිවරණය තියනවනම් තියන්න. කල්දාන එකට අපි සම්පූර්ණ විරුද්ධයි. පළාත් සභාව තියනවනම් පහෙන් හතරක බලයක් ඇතුව අපට ජයග්‍රහනය කරන්න පුලුවන්. ඒ නිසා පළාත් සභාව ඇදගෙන යන්නෙ නැතුව, පළාත් සභා තියනවනම් තියන්න. නැත්නම් ඒක අහෝසි කරලා දාන්න. ඒ වචනෙ තමයි අපි කියන්නෙ. පළාත් සභා තියනවනම්, අපි ඒකට අත උස්සලා, අපි අපේ වත්මන් ආණ්ඩුව කරගෙන යන ව්‍යාපාරයට අපි සහයෝගය දෙනවා. අපි හදවතට එකගව හරි, එකගව නොවී හරි ඒ දේ කරන්න ඕන. එක්සත් ජාතික පක්ෂයේ, විපක්ෂ නායකතුමා කිව්ව වගේ, එතුමාලත් කළා. ජනතා විමුක්ති පෙරමුණත් කළා. හැමෝම දායක වුනා. හැමෝම එපයි එපයි කියලා කළා. ඒ නිසා අපි කියනවා පළාත් සභාව තියනවනම්, තියන්න. තවත් ඇදගෙන යන්න එපා. හැකි ඉක්මනින් පළාත් සභා තියලා පිහිටුවන්න. නැත්නම් මේක අහෝසි කරල දාන්න. අපි ඉල්ලා සිටින්නෙ ඒකයි. ඒ වගේ පළාත් සභාවට අපි විරුද්ධයි. එදත් විරුද්දයි අදත් විරුද්දයි ඒ විරුද්ද වෙවී අදහස් කරන්නෙ අපි මේ සැරේ පළාත් සභාව තියන්න කියන එක තමයි කියන්නෙ ඇදගෙන යන්න ඕන නැහැ මේ පළාත් සභාව තවත් ප්‍රමාද වෙලා කල් දාන්න ඕන නැහැ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ගරු මන්ත්‍රීවරුනි, දැන් මේ යෝජනාවට මත කීපයක් තියෙනවා. පළාත් සභා මැතිවරණය තියනවනම් හැකි ඉක්මනින් තියන්න කියන යෝජනාව තමයි තියෙන්නෙ. මේ පළාත් සභා වාරය තියන්න. ඊටපස්සෙ ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභාව අහෝසි කරලා අජිත් මහත්තය කිව්ව වගේ, එක එක ඒ ගැටලු සහගත තත්ව ඉවත් කරලා, රටේ අලුත් පාලන තන්ත්‍රයකට යොමු වෙන්න කියල තමයි කියන්නෙ. ඒ නිසා ලක්රුවන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට විරුද්ධයි කියන අය අත ඔසවා ඡන්දය ප්‍රකාශ කරන්න

ඒ අනුව ලක්රුවන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට විරුද්ධව ඡන්ද 07 ක් ප්‍රකාශ විය

<u>ලක්රුවන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කල සභිකයින්</u>

1. ගරු මන්ත්‍රී සී.වී. සහබන්දු මහතා
2. ගරු මන්ත්‍රී එච්.ජී. තරංග සුදර්ශන මහතා
3. ගරු මන්ත්‍රී කුමාරගේ වසන්ත මහතා
4. ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය
5. ගරු මන්ත්‍රිනී කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය
6. ගරු මන්ත්‍රිනී එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය
7. ගරු මන්ත්‍රී පී.ජී. රංජිත් ජයවීර මහතා

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

හොදයි ලක්රුවන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට විරුද්ධව ඡන්ද **07** ප්‍රකාශ වෙලා තියෙනවා. දැන් ඒ යෝජනාවට පක්ෂ අය අත ඔසවා තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන්න.

ඒ අනුව ලක්රුවන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට පක්ෂව ඡන්ද **17** ක් ප්‍රකාශ විය.

**<u>ලක්රුවන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කල සභිකයින්</u>**

1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා
2. ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එච්.වී. අජිත් කුමාර මහතා
4. ගරු මන්ත්‍රී බන්දුල සමන්ත හිරිමුතුගොඩ
5. ගරු මන්ත්‍රී එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා
6. ගරු මන්ත්‍රී එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා
7. ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා
8. ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
9. ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය
10. ගරු මන්ත්‍රී එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා
11. ගරු මන්ත්‍රී නාපෙ විතානගේ සමන් මහතා
12. ගරු මන්ත්‍රී සී. වනිගරත්න මහතා
13. ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
14. ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා
15. ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා
16. ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා
17. ගරු මන්ත්‍රිනී ඩබ්. කේ. නෙලී මහත්මිය

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

බොහොම ස්තුතියි. ගරු උපසභාතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි ගරු ලක්රුවන් මන්ත්‍රීතුමා ගෙනා පළාත් සභා මැතිවරණය ඉක්මනින් පැවැත්විය යුතුයි කියන යෝජනාවට පක්ෂව ඡන්ද **17** කුත් එයට විපක්ෂව ඡන්ද **07** කුත් ලැබී තියෙනවා. ඒ අනුව වැඩි ඡන්ද **11** කින් එම යෝජනාව සභා සම්මත වූ බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

- ඡන්ද විමසන අවස්ථාවෙ ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා අසනීප වීම හේතුවෙන් සභාවාරයට නොපැමිණි අතර, ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා සභාවෙන් බැහැරව සිටින ලදී .

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

ටී.ජී.ප්‍රේමලාල් මයාගේ නිවස අසළ සිට ඉදිරියට ගල්කැටියාගොඩ මිනුවන්විල මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම - රු. 30000.00

උඩුගම පුරනැගුම ගොඩනැගිල්ලේ වේදිකාවේ බිත්තිවල තීන්ත ආලේප කිරීම - රු. 125000.00

ප්‍රධාන කාර්යාලය ළිඳ වටේ බැම්මක් බැදීම - රු. 20000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2020 අගෝස්තු මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව සැප්තැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 ජුලි මාසයට අදාළ මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සැප්තැම්බර් මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. උප සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා, ලේකම්තුමිය, මාධ්‍යවේදී මහත්වරු ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. සභාපතිතුමා කිව්ව වගේ ඇත්තටම මම හිතන්නෙ අපේ ප්‍රාදේශීය සභාවෙ ඉතිහාසයේ පළවෙනි වතාවකට අද දිනයේ ඡන්දයකට යන්න සිදු වුනා. ක්ෂණිකව ගෙනාපු යෝජනාවක් වුනත් අපේ අජිත් හිටපු සභාපතිතුමා කියපු විදිහටත් දීර්ඝ කරණු කාරනා අදහස් දැක්වීමෙන් පස්සෙ ප්‍රාදේශීය සභාව දැන් අද දවසේ ආරම්භ කළාට පස්සෙ පුද්ගලිකව මම තීරණය කළේ. වෙනද සිගිති පොලක් වගේ තිබුන ප්‍රාදේශීය සභාව එකපාරටම පාර්ලිමේන්තුව මට්ටමටම ගියා වගේ මට දැනුනා. මොකද නැත්නම් උදේ ඉදල අපි ඇවිල්ල මෙතන කතා කළේ ක්‍රියා කළේ අත්‍යවශ්‍ය දේවල් වුනාට ඒක මම හිතන්නෙ සභාවක් විදිහට මේ වගේ ප්‍රදේශයේ තියෙන විද්වත් සභාවක තියෙන ක්‍රියාකලාපයට එහා ගියපු ආකාරයක්. ඒ වචන වලින් බැලුවත් අපි කාටත් වැදගත් දෙයක් අහන්න දකින්න ලැබුනා. ඒ වෙලාවෙ අදහස් දක්වන්න නොහැකි වුනත් මගේ පුද්ගලික අදහසත් මම හොයලා බැලුවා. ලංකාවෙ ප්‍රාදේශීය සභා 360 කට අධික ප්‍රමාණයක් තියෙනවා. ඒ වගේම ප්‍රාදේශීය සභා සභිකයන් නගර සභා ඇතුලු මන්ත්‍රීවරුන් 8000 කට වඩා ප්‍රමාණයක් ලංකාවෙ පරිපාලන කටයුතු කරද්දි ඒ සඳහා සහාය වෙද්දි, විශාල රටක ප්‍රාන්තයක්වත් නැතිතරම් පුංචිම රටක් වුන ලංකාව පළාත් නවයකට බෙදලා, පළාත් සභා ක්‍රමයක් ඇති කරලා, මම හිතන්නෙ ඇත්තටම විශාල විදිහට මුදල් නාස්තියක් කරපු ආයතනයක් විදිහට තමයි අපි පහුගිය පළාත් සභා දැක්කෙ. මොකද ගරු සභාපතිතුමනි, අපි දැන් දන්නවා අපි ගම්වල පදිංචි මිනිසුන් විදිහට අපේ ගමට පළාත් සභාවෙ වාහන කීයක් රෑවෙන කොට ගමට එනවද කියලා? ඒ වාහනවල රෑට මගුල් ගෙවල්වල, මළ ගෙවල්වල අරක්කු බෝතලේ ගහගෙන ගිහිල්ලා, එලිවෙනකම් රස්තියාදු ගහලා, උදේ වැඩට යන පිරිසක් බිහි කරල තියෙන්නෙ ඔය ක්‍රමය හරහා. මම කියන්නෙ මොන ආණ්ඩුවෙන් කළත්, කවුරු කළත් අද වෙන කොට නාස්තිය හා දූෂනය තමයි අපේ ඇස් පනාපිට දකින්න ලැබෙන්නෙ. ඒ වගේම බැලුවම ඒකෙ තව කාරණයක් තමයි. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා ඒ කාරණා ඉදිරිපත් කරන්නෙ, මම හිතන්නෙ මේ ප්‍රාදේශීය සභාවෙ මන්ත්‍රීවරු එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා, හැමදාම හිටපු ආණ්ඩුවට එහෙම නැත්නම් වෙනත් කාරණයක් ගැන කතා කරලා, ඒකෙ අඩුපාඩු එක්ක තමයි හැම යෝජනාවක්ම හැම අදහසක්ම දක්වන්නෙ. නමුත් ඒක වැරදි නිසා තමයි මිනිස්සු ආණ්ඩුව වෙනස් කළේ. දැන් ඔබතුමාලට ජනාධිපතිවරයෙක් පත්වෙලා ඉන්නවා. ඔබතුමාලගෙ තුනෙන් දෙකක ආණ්ඩුවක් පත්වෙලා තියෙනවා. ඉතිං ඔබතුමාලට මේ ප්‍රාදේශීය

සභාවෙ දැන දැන යෝජනා සම්මත කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. ඔබතුමාලා බොහොම ගෞරවයෙන් පත් කරපු ජනාධිපතිතුමාට ඔය පුද්ගලිකව හමුවෙන තැනකදි කියන්න අලුත් දෙයක් නෙවෙයි කරගෙන ආපු කටයුත්ත මේ ආකාරයෙන් කරන්න කියලා. අනික මේ පළාත් සභා ඉතිහාසෙ වැඩිම බලය තිබුනෙ ඔබතුමාලගෙ රජය විදිහට තමයි. විශේෂයෙන්ම දකුණු පළාත් සභාව ගත්තොත් එකම අවස්ථාවයි එක්සත් ජාතික පක්ෂය පාලනය කළේ. ඉතිං එහෙමත් අවස්ථාවක ඕක අමුතු දෙයක් නෙවෙයි. ඔබතුමන්ලා ඒ සියල්ල දැන දැන මම කණගාටු වෙනවා. මේ ප්‍රාදේශීය සභා මට්ටමින් මේ සංසද හදාගෙන මේ කාගෙවත් තුන් හිතකවත් නැති දේවල් තමයි මේ සභාවෙදි යෝජනා කරන්නෙ. ලක්රුවන් මන්ත්‍රීතුමා අදහස ඉදිරිපත් කළාට එතුමගෙ අදහසක් නෙවෙයි. එතුමට මම හිතන්නෙ දූරකතන ඇමතුමකින් හරි කවුරු හරි කියපු එකක් හරි. මොකද අපේ පැත්තෙනුත් මට අපේ හිතවත් මන්ත්‍රීවරයෙක් කතා කළා. එයා අද උදේ දන්නවා මේ ප්‍රාදේශීය සභාවෙ මේ වගේ යෝජනාවක් එනවා කියලා. අපි මේ කරන්නෙ බොරුවක් කියලා හැම කෙනාගෙම යටි හිත දන්නවා. සමහර වෙලාවට ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුනනම්, අපි මේකට කැමැති වෙයි. ඔබතුමාලා විරුද්ධ වෙයි. දැන් ඔබතුමාලගෙ ආණ්ඩුව නිසා විජිත් සහබන්දු මන්ත්‍රීතුමා කිව්වෙ ඒ අය දැන් කැමතියි. එහෙම තත්වෙකුත් තියෙනවා. මොකද ඒ  පවතින පාලක රජය කැමතියි. පළාත්සභා, ප්‍රාදේශීය සභා, ආණ්ඩුකාරයා  ඇතුලු  සියලු බලතල තමන්ට අරගෙන ඒ කටයුතු පහසු කර ගන්න. ඉතිං ඇත්තටම බැලුවොත් අපි ගම්වල බැලුවම, විශේෂයෙන්ම පාසල් ජේඛීය අමාත්‍යාංශයේ පාසල් තියෙනවා. ජාතික පාසල් විදිහට පළාත් සභා පාසල් විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒ වගේම අපේ දිස්ත්‍රික්කයේ  ප්‍රධාන සෞඛ්‍ය රෝහල් දෙකක් තියෙනවා. ජාතික මට්ටමේ රෝහල් ඊට පස්සෙ අනිත් සියලු කටයුතු කෙරෙන්නෙ පළාත් සභාව හරහා. ඉතිං මේකෙ එක්කෙනෙකුට ස්ථාන මාරුවක් ගන්න ගියාම විශාල ගැටලුවක්. විදුහල්පති කෙනෙකුට බැහැ ජාතික පාසලක විදුහල්පති කෙනෙක් වෙන්න. ගුරුවරයෙකුට බැහැ ස්ථාන මාරුවක් අරගෙන ජාතික පාසලකට යන්න. ඊලගට රෝහලක නර්ස් කෙනෙක් මාරු වෙනවනම් වෙනම ක්‍රමවේදයක්. ඇත්තටම එකම වෘත්තිය සමහර වෙලාවට අධ්‍යාපන සුදුසුකම් බැලුවම, පළාත් සභාවෙ රැකියාව අටපාස් ගන්නවා ජාතික ආණ්ඩුවෙ රැකියාවට ගන්නෙ සමහර වෙලාවට සාමාන්‍ය පෙළ සමත් වෙන්න ඕන. ඉතිං ඒ වගේ ගැටලු තියෙන ආයතන දෙකක්. නමුත් එකම රැකියාව එකම වරප්‍රසාද ලැබෙනවා. ඒ වගේම තමයි නිලධාරි සහ නිලධාරින්ට ලැබෙන වරප්‍රසාද. ඒ නිසා අපි විශේෂයෙන්ම ඒකයි අපේ විපක්ෂ නායකතුමා කරපු යෝජනාවට අපි පක්ෂව ඡන්දය ප්‍රකාශ කළේ කියලා මේ අවස්ථාවෙ ප්‍රකාශ කරනවා මොකද අපි දන්නවා 27 ක් ඉන්න සභාවක අපි මේ හය හත් දෙනෙකුට ඡන්දයක් තියලා දිනන්න නෙවෙයි. නමුත් ඒක හරි දේ හරි විදිහටත් වැරදි දේ වැරදි විදිහටත් දකින්න ඕන. ඒ ගැන මම එතනින් එහාට කතා කරන්න යන්නෙ නැහැ.

ගරු සභාපතිතුමනි, මම ගිය සභාවෙදි යම් යෝජනාවක් අදහසක් ඉදිරිපත් කළා. සභාපතිතුමාට මම ඊයෙ දූරකතනෙනුත් පොඩි දැනුම් දීමක් කළා. පහුගිය කාලෙ කොවිඩ් වසංගතය නිසා අපේ බල ප්‍රදේශය පුරා කොණ්ඩ කපන බාබර් සැලුන්වල රුපියල් 150 ට 120 ට තිබුන ගාස්තුව රුපියල් 300 දක්වා වැඩි කරල තියෙනවා. ඉතිං ඇත්තටම ඒක ලොකු ප්‍රශ්නයක් මේක මම හිතන්නෙ ඔබතුමාලා, අපි කොහොම හරි ගෙවලා කැපුවත්,  දුප්පත් පාසල් දරුවගෙ ඉදලා සියලුම දෙනා සති දෙක තුනකට සැරයක්වත් මාසෙකට සැරයක්වත් කොණ්ඩෙ රැවුල කපන්න ඕන. ඒ අය මේ නිසා දැඩි පීඩනයකට ලක්වෙනවා.  සමහර වෙලාවට සැලුන් එක හිමිකරු කැමතියි මේක අඩු කරන්න. එයා දන්නවා  ඒ වරප්‍රසාදය ඒ කොවිඩ් වසංගතය නිසා දාපු  නීති රීති කියලා.  ඒ පහසුකම් දැන් ගම පුරා ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. නමුත් මේ මිල අඩු කරනවට ඒ සැලුන්වල සංගම්වලින්  විරුද්ධයි. වෙනද දවසට කොණ්ඩ 10 ක් කපනවනම්, දැන් තුන හතරක් කපා ගත්තම ඒ මුදල ලැබෙනවා. පැයෙන් දෙකෙන් සැලුන් එක වහල ගෙදර යන්නත් පුලුවන්. ඒක නිසා ඒ අය ගාස්තුව අඩු කරන්නෙ නැහැ. මම සභාපතිතුමනි ඉල්ලා සිටියෙ, මේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හරහා පළමුවෙන්ම සොයා බැලීමක්

කරන්න ඔවුන්ට දැනුම් දීමක් කරලා, ඒ පහසුකම් ඒ මිල වැඩිකිරීමේදී ගත්තු ඒ යම් යම් එකගතාවයට ආපු පරිදි ඒ කටයුතු සිදු වෙනවද කියලා ඒ ආරක්ෂිත වැඩපිළිවෙල ඒ සැලුන්වල ක්‍රියාත්මක වෙනවද කියලා සොයා බලන්න. ප්‍රාදේශීය සභාව විදිහට එහෙම නැත්නම් වහාම ඒ මුදල හිටපු සාධාරණ මුදලකට එහෙම නැත්නම් මීට කලින් තිබුන ගානට අඩු කරන්න කටයුතු කරන්න අවශ්‍ය උපදෙස් ලබා දෙන්න. මොකද අපි සභාව විදිහට මෙතන කතා කරනවා අපි යන්නෙ නැහැ සම්බන්ධීකරණ කමිටුවලට. එතන නම් ඔය සියලුම නිලධාරීන් ඉන්නවා නමුත් අපි මේ මෙතන කරන වැදගත් කියල හිතෙන යෝජනා ඒව ඒ අවස්ථාවට යන්නෙ නැති පාටක් තමයි පේන්නෙ ඒක නිසා ඒ ගැන සොයා බලා අපේ බල ප්‍රදේශයේ සැලුන්වල ඒ පහසුකම් දෙන්නෙ නැති සැලුන් වහාම ඒ මිල අඩු කරන්න කටයුතු කරන්න වගබලා ගන්න ඒ සඳහා උපදෙස් දෙන්න කියල මුලින්ම ඉල්ලා සිටිනවා. පළවෙනි යෝජනාව විදිහට මෙවරත් ඉදිරිපත් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ සභාවට ආවට පස්සෙ මම අර ඉස්සෙල්ල කිව්ව වගේ පොඩි කණගාටුවක් ඇතිවෙනවා. මේ සභාවට ඒ මාසෙ පුරාම එන සේරම ලිපි ලේඛන මේ සභාව දවසට ඒව සභාවට දානවා. ඒ ලැබෙන ලිපි අදාල අංශවලට යොමු කරලා, ඒ සඳහා කරන්න පුලුවන් විසඳුම කියලා හොයා බැලීම් කරලා, යම් යථ්ටමකට ඒක කරලා, තීන්දුවක් ගන්න ඕන එකක් තමයි සභාවට දාන්නෙ. මේ සභාවට එන සියලුම ලිපි මේකට දාන එකේ තේරුමක් නැහැ. මම හිතන්නෙ සභාපතිතුමනි, අපි දිගින් දිගටම අපි මේ සභාවෙ කතා කළා. ඒ කටයුත්ත සිදු වෙන්නෙ නැහැ. මොකද මේ සභාවට මොනව හරි ලියුමක් ආවනම්, ඒකෙ තීන්දුවක් ගන්න ඕන එකක් විතරයි මේකට දාන්න ඕන. මොකද නැත්නම් මේ 27 දෙනෙක් මන්ත්‍රීවරුත් ඉන්නවා. මේ සියලුම නිලධාරින්ගෙ සහ සියලුම දෙනාගෙ කාල වේලාව අපරාදෙ. ඒක නිසා සභාවට දාන්නෙ මොකක්ද කියලා පොඩි අධ්‍යනයක් කරන්න ඕන. ගරු සභාපතිතුමනි, මම පොඩි උදාහරණයක් කියන්නම්, පහුගිය කාලෙ අපි නිරන්තරයෙන්ම ගියා LRC ආයතනයට. LRC අපේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිශන් සභාවට ගියාම එතන ලංකාව පුරාම මිනිස්සු එනවා ඒ සභාපතිවරයා හම්බ වෙන්න. පුද්ගලිකව ගොඩක්වෙලා එතන කතා කරපු හින්දා මම දැක්කා, එයා ක්‍රමවේදයක් පාවිච්චි කළා එයාගෙ දොරෙන් ඇතුලු වෙන කෙනාගෙ ප්‍රශ්නය අහනවා. මොකක්ද ඔයා කොහෙද දිස්ත්‍රික්කෙ මොකක්ද? ඔයාගෙ ඉඩමෙ ප්‍රශ්නෙ මොකක්ද? ඒ විස්තර අහලා පොඩි චිට් එකක් තියෙනව පුරවන්න. එයා ඇතුල් වෙන්න කලින් එයාගෙ අංකෙ යන්න කලින් එයාගෙ ඒ චිට් එක යනවා ඇතුලට. ඇතුලට ගියාට පස්සෙ ඒ අදාල නිලධාරිය ඒ ෆයිල් එක හොයාගෙන එයාගෙ ඉඩම මොකක්ද ඒ ගැන තොරතුරු හොයාගෙන ඊට පස්සෙ ඒ අංකෙ දරන, අපි කියමු අංක 25 කියල එයාට හම්බ වුනේ ඒ අංක 25 සභාපතිවරයට හම්බ වෙනකොට එයාට අදාල දිස්ත්‍රික්කෙ මොකක්ද, ඒ දිස්ත්‍රික්කෙට ඉන්න නිලධාරිය කවුද, ඒ දිස්ත්‍රික්කෙ භාර නිලධාරිය ඒ ෆයිල් එකත් අතේ තියාගෙන එතන ඉන්නවා. ඉතිං අන්න ඒ වගේ කටයුත්තක් වෙනවනම්, එයා එතකොට දැනුවත් වෙලා ඉන්නවා. එයා දන්නෙ නැත්නම් එයා ඒ ප්‍රදේශයේ ඉන්න ඒ අංශවලින් හොයා බලල තමයි එතන ඉන්නෙ. එතකොට ලංකාවෙ කොහේ හරි ඉඳල එන මනුස්සයට පැය ගානක් ඇතුලත සාධාරණයක් ඉටු වෙනවා. නමුත් අපේ සභාවෙ මොකක්ද වෙන්නෙ. නිලධාරින්ට එන සියලුම ලේඛන මේ සභාවට දානවා. සභාවට දැම්මට පස්සෙ ඒ දාපු නිලධාරියෙකුත් නැහැ. ඒ නිලධාරින්ට ඇති වගකීමකුත් නැහැ. ඒ නිලධාරියා සමහර විට අද ඉන්නවද නැද්ද දන්නෙත් නැහැ. මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, ඒ සභාවෙ තමන්ට ඒ අංශය භාර නිලධාරියෙක් ඉන්නවනෙ. නිලධාරීතුමෙක් හෝ තුමියක් අන්න එතුමා ඒ අදාල ෆයිල් එකට අදාල විස්තර දන්න කෙනා එදා ඒ ගැන දැනුවත් වෙලා හරි ඒ ගැන අවධානයෙන් ඉන්න ඕන. මේ සභාවෙ දැන් මගේ මට අදාල කටයුත්තක් තව මොහොතකින් කතා කරනවා එතකොට මාව ඕන වෙයි. එහෙම නැත්නම් ඒ අදාල ෆයිල් එක මේ ආසන්නයේ තියෙන්න ඕන. අපි අද පැය ගානක් ගත කරන්නෙ ඒ ෆයිල් එක ගේනවා, බලනවා. ඒ කිසි දෙයක් දන්නෙ නැහැ. සමහර වෙලාවට එයා දන්නවනම්, මේ ප්‍රශ්නෙ කොතනද මේ ෆයිල් එක පෙල්ලුවත් සභාපතිතුමා ෆයිල් එක මුල ඉඳල අගට

බලන්න ඕන. මේ කොතනද මේක තියෙන්නෙ කියලා. එහෙනම් එයා කියනව මෙන්න මේ කාරනේ හින්ද මෙන්නමේ හේතුව හින්ද කියල පෙන්නන්න පුලුවන්කම තියෙන්න ඕන. එයා මෙතන සභාවට එන්න නීත්‍යානුකූලව එයාට බලයක් නැහැ අපේ හිටපු සභාපති අජිත් සභාපතිතුමා කිව්ව ඒ ප්‍රශ්න ගෙනියන කොට එයාගෙන් ඒ කාරනේ හයිලයිට් කරල ඒකට උත්තරේ අරන් එන්න කියලා. අන්න ඒ වගේ වැඩ පිළිවෙලක් ගරු ලේකම් තුමියත් ඉන්න වෙලාවෙදි මම මේ ස්ථානයෙදි නැවතත් ඉල්ලා සිටිනවා. මේ සභාවට කලින් දවසකදි අනිවාර්යයෙන් ඒ ගැන අධ්‍යනය කරලා, ඒ අදාල දේවල් විතරක් දාන්න එහෙම නැත්නම් ඔය බිලක හරි මොනව හරි ප්‍රශ්න තියෙනවනම්, ගැටලු අපට වගේම ඔබතුමාලත් මේක දන්නවා. ඔබතුමාල යටි හිතින් හරි බලධාරි හරි දන්නව මේක මේක ප්‍රශ්නයක් තියෙන එකක්. මේක ඇදෙන්න පුලුවන් ඒක හින්ද අන්න ඒකට සූදාණම්ව දාන්න කියලා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මොකද මේ මහජනතාවගේ හා මේ සියලුම දෙනාගේ වෙලාව අපරාදෙ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, පහුගිය දවස්වල මේ සභාවෙ කතා කළා ඩයලොග් සමාගමෙන් විදුලි සංදේශ කුලුනු වගයක් අපේ ප්‍රදේශය පුරා ඉදි කළා. දැන් මම හිතන්නෙ ඒ කටයුත්ත කරලා සියල්ල අවසානයි. නමුත් සභාපතිතුමනි, දැන් මම හිතන්නෙ රථ වාහන අනතුරක් වුනත් දැන් වෙනද වගේ නෙවෙයි. දැන් පාරෙ යන වාහන මගීන්ට වගේම ඒ වාහන රියදුරන්ට ලොකු ප්‍රශ්නයක් හදිසි අනතුරක් වෙන්න පුලුවන් නින්ද ගිහිල්ල හරි අනතුරක් වුනොත් ගිහිල්ල මේ වැටක හරි වැදුනොත් වෙනද RDA එකට හරි ටෙලිකොම් එකට හරි ඉලෙක්සිටි බෝඩ් එකට හරි විතරයි ගෙවන්න ඕන. මොකද වාහනයක්වත් නිදහස් කරන්නෙ නැහැ දැන් අලුත් දෙයක් එකතු වුනා දැන් ඩයලොග් එකටත් ගෙවල තමයි වාහනේ නිදහස් කර ගන්න වෙන්නෙ. මොකද අපි මේ පාර පුරා ඒ අනවශ්‍ය ආකාරයෙන් ඒ කනු ඉදිකරන්න අවසර දුන්නා. ඒකට යම් වරප්‍රසාදයක් සභාවට මුදලක් ලැබුනත්, ඒක දීර්ග කාලීනව මම හිතන්නෙ විශාල හානියක්. මම හිතන්නෙ අපේ ප්‍රාදේශීය සභාවෙ අතුරු මාර්ගවල කාබිල් පාරෙ ගියත් උඩුගම දකුන පැත්තට ගියත් මම හිතන්නෙ අනිත් ප්‍රදේශවලත්, මේ නාගොඩ හරහාත් ඒ වගේ අලුතෙන් කනු ඉදිකරලා විශාල අවහිරතාවයක් ඇති වෙලා තියෙනවා ඒක නිසා මම හිතන්නෙ වෙන හානිය වැඩියි. ඒක නිසා ඉදිරියෙදි ඒවට අවසර දෙනවනම් පළවෙනි පියවර විදිහට ඒ තියෙන කුලුනුවලම කරන්න ක්‍රමයක් තියෙනවා. මොකද මම අහල තියෙනවා සිතුල්පව්වට දුර නිසා වියදම වැඩි නිසා කැලේ මැදින් විශාල දුරක් අදින්න ඕන නිසා ඒ අය ඒ ආයතන දෙකක් එකතුවෙල තමයි ඒක කරල තියෙන්නෙ. මොකද ඒ තියෙන්නෙ ටෙලිකොම් ආයතනයනම්, ඒ කුලුනුවලම ඩයලොග් ආයතනයේ වයර් සම්බන්ද කරලා තියෙනවා. නමුත් මේවයි එහෙම කටයුත්තක් කරනවනම් විශාල පහසුවක් වෙනවා මම හිතන්නෙ ඉස්සරහට අපි මේක විශාල හානියක් කරන්නෙ. මේ පාර දෙපැත්තෙ මාර්ග පුලුල් වීමෙදි, කණු, වයර්.. ඔක්කොම ඉවත් කරන්න ඕන. නන්දන මන්ත්‍රීතුමා කලින් සභාවක කතා කළා ගහක් කොලක් කපා ගන්න ගියාම හානි වෙන්න පුලුවන්. ඒ වගේ හානි දායක තත්වය වැඩියි. ඒ නිසා ඒව ගැන යම් අවදානයක් යොමු කරලා, ඉදිරියෙදි අවසර දෙනවනම්, ඔය සඳහා අපි යෝජනාවක් කරලා, සුදුසු පියවරක් අරගෙන තමයි කරන්න ඕන කියන එක මම මේ අවස්ථාවෙදි ඔබතුමන්ලට මතක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ සභාවෙ සභාපතිතුමාටත්, උප සභාපතිතුමාටත්, පහසුකම් සහිතව කාමර වෙන් කරලා තියෙනවා. ඒ වගේම දැන් රියදුරු මහත්වරුන්ට විවේකී කාමර ලෑස්ති කරගෙන යනවා. ඒක හොඳයි. ඒක කෙරෙන්න ඕන කටයුත්තක්. ඉතිං අපේ මේ සභාවෙ මන්ත්‍රීවරු 27 දෙනෙක් ඉන්නවා. ඒ 27 දෙනාට සභාපතිතුමාගෙ සීට් එකේවත් උප සභාපතිතුමාගෙ සීට් එකේවත් වාඩි වෙන්න අයිතියක් නැහැ. කිනම් හෝ අවස්ථාවක සභාවට එන විශේෂයෙන්ම ඔබතුමාගෙ කණ්ඩායමේ 15 දෙනා සහ විපක්‍ෂෙ 12 දෙනෙක් ඉන්නවා. ඒ අයට සභාවට ආවට පස්සෙ තමන්ගෙ වැඩ කටයුත්තක් කර ගන්න වෙනම ස්ථානයක මේසයක් පුටුවක් වෙන්කරල තියෙනවනම් හොඳයි. මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් එක ස්ථානයක් වෙන් කරන්න කියලා කලින් සභාවාරවල සිට යෝජනා කරනවා.

ඔබතුමාගෙ කාලෙ ඒ කටයුත්ත කරන්න පුලුවන්නම් ඔබතුමා මම හිතන්නෙ ඒ කාර්යය කරපු කෙනා බවට පත්වෙනවා. අපි සභාවට හදිසියෙ එන්නෙ. අපි හදිසියෙ ආවත් මන්ත්‍රීවරයෙක් මන්ත්‍රීවරු දෙන්නෙක්, තුන් දෙනෙක් ඉන්නවා. නමුත් ඒ අයට මේ කාගෙ හරි පුටුවක වාඩි වෙන්න බැහැ. ඒ සඳහා සුදුසු ස්ථානයක් මේ කාමරේ හරි කොටසක් වෙන් කරගෙන ඒ සභාව නැති දවස්වලට වෙන් කරල තියන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මම ඉල්ලා සිටිනවා. අපේ කටඹුරාවේ සිට උඩුගම ගල්ලන්දල දක්වා ප්‍රධාන පාර විශාල සංවර්ධන කටයුත්තක් සිදු වෙන මේ මොහොතේ මම හිතන්නෙ හැම තැනම බෝක්කු කඩලා, ප්‍රධාන පාර දිගටම සංවර්ධනය කරලා, අද උදේ තියෙන විදිහ නෙවෙයි හවස තියෙන්නෙ. යන කොට පස් දාලා එක පැත්තක බෝක්කුව වම කඩල උදේ යන කොට එහෙමයි හවස එනකොට දකුණ කඩලා. ඒ වගේ ඉතිං අනාරක්ෂිත තත්වයක් තියෙන්නෙ. අපේ පාරවල්වල දෙපැත්තෙ තියෙන විදුලි පහන් දැන් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. උඩුගම ස්ටෑන්ඩ් එකේ ඉඳල මම බලාගෙන ආවා හෝමදොල හන්දියට එන කොට ලයිට් කීපයක් තිබුනා. හෝමදොල හන්දියෙ සිට උසාවිය ලගට එක ලයිට් එකක්වත් නැහැ. උඩුගම  බාර් හන්දිය අවට ලයිට් දෙකක් විතරයි පත්තු වෙන්නෙ. ඉතිං ඒ නිසා මේ ගම් ඇතුලෙ සමහර වෙලාවට අද වෙන කොට හොඳ තත්වයක් තියෙනවා. අපේ සමන් මන්ත්‍රීතුමාගෙ හෝමදොල කොටසේ ගම් ඇතුල්වල ලයිට් හොඳට පත්තු වෙනවා. නමුත් ප්‍රධාන මාර්ග ආසන්යේ ඒ විදුලි පහන් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. ඒ ගැනත් සොයා බලලා, ඔබතුමා මම හිතන්නෙ අලුතෙන් නිලධාරියෙකුත් පත්කරගෙන කියල ආරංචියකුත් අද ලැබුනා. ප්‍රධාන මාර්ගවල විදුලි පහන් ඒ විදුලි පහන් ක්‍රියාත්මක වෙන්න කටයුතු සලස්වන්න. ඒ සම්බන්ධයෙන් ඔබතුමා උපදෙස් දෙන්න. මොකද මේ මාර්ග සංවර්ධනයත් එක්ක විශාල අනතුරු සිදු වෙන්න පුලුවන්. ඒ ගැනත් මේ අවස්ථාවෙ සිහිපත් කරමින්, පහුගිය දවසක අපේ ප්‍රාදේශීය සභාවෙ උප සභාපතිතුමාගෙ දයාබර මෑණියන්  අපෙන් සමු ගත්තා. එතුමියගෙ අවමංගල උත්සවයට  සභාවෙ සියලුම මන්ත්‍රීවරුන් සහභාගි වුනා. මම මේ අවස්ථාවේදී එතුමියට  නිවන් සම්පත් ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පසුගිය දිනක අපි කුඹුරුහේන ප්‍රදේශයේ මාර්ගයක් සංවර්ධනය කරීමට ගිය අවස්ථාවෙදි ප්‍රශ්න රාශියක් මතු වුනා.  අපේ බැකෝ යන්ත්‍රය පිළිබඳව. බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා එක්තරා කාල සීමාවක් අපි සාකච්ඡා කරල තිබුනා. මට දැන ගන්න ඕන. ඇත්තටම ඒ එක් පුද්ගලයෙක් ඒ බැකෝ යන්ත්‍රය මිලදී ගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කළා. එතකොට මේක අලුත් වැඩියා කරන්නෙ නැත්නම් ඒ උඩුගම තියෙන බැකෝ යන්ත්‍රය වෙන්දේසියක් කරන්න හෝ මිල ගණන් කැඳවීමක් කරන්න පුලුවන්නම්, මේ අවස්ථාවෙදි මම යෝජනා කරනවා අද මේ පිළිබඳ සාකච්ඡා කරලා මේ අපේ මන්ත්‍රීතුමන්ලා කැමැත්ත ප්‍රකාශ කරනවද කියලා.

සභාපතිතුමනි, ඒ වගේම අර තල්ගස්වල අනාරක්ෂිත දැව ගස් වගයක් කපන්න ගිහිල්ලා එවර්ග්‍රීන් කර්මාන්ත ශාලාවෙන් මටත් දුරකතන ඇමතුමක් දුන්නා. ඒ වගේම ඔය සිද්ධිය පිළිබඳ අපි මොකුත් දන්නෙ නැහැ. ඒ වගේම ඒවා අයින් කරපු පැරකුම් ජාලත් මහත්මගෙ බිල් ගෙවීම සම්බන්ධයෙනුත් අද මමත් එක්ක සාකච්ඡා කළා. ඒ පිළිබඳවත් පොඩි දැනුවත් කිරීමක් කරන්න. ඒ වගේම බැකෝ යන්ත්‍රය පිළිබඳ සාකච්ඡා කළානම් හොඳයි. එහෙම තියෙනවට වඩා බැකෝ යන්ත්‍රය වෙන්දේසි කිරීමක් හෝ විකුණා දැමීමක් කළොත් සභාවට මුදලක් ලබා ගන්න පුලුවන්.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රීතුමන්ල මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. විශේෂයෙන්ම අද දවසේ මේ සභාව නියෝජනය කිරීම සඳහා ධනංජය විලේගේ මන්ත්‍රීතුමා සභාවට රෝගාතුර වී ප්‍රතිකාර ලබන නිසා සහභාගි වී නැහැ. එතුමාගේ නිවාඩු අනුමත කර දෙන මෙන් ඔබතුමාගෙන් ඉතාමත්ම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමා ඉල්ලීමක් කළා. විදුලිය පිළිබඳව මම ගිය සභා වාරයෙදිත් ඔබතුමාට සිහිපත් කිරීමක් කළා. අපි ඇත්තටම දන්නවා විදුලිය පිළිබඳව ඉල්ලීම් කරන විට, අපිට විදුලි බල්බ් එකක්වත් ගැනීමේ හැකියාවක් තිබුනෙ නැත්තෙ මුදල් පිළිබඳවත් ප්‍රශ්න තියෙන නිසා තමයි කියලා අපට දැන ගන්න ලැබුනෙ. ඉතිං ගරු සභාපතිතුමනි, කුමන හෝ ක්‍රමවේදයක් අනුගමනය කරමින්, සියලුම කොට්ඨාසවල තියෙන ඒ විදුලි බල්බ් ලබා දීමේ කටයුත්තට දායකත්වය දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපේ කොට්ඨාසෙ විතරක් නෙවෙයි සියලුම කොට්ඨාසවල ඒ වගේ පුංචි අඩුපාඩු තියෙනවනම්, ඒ හැම දෙයක්ම කරලා දෙන්න ඔබතුමාගෙ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වගේම අපට පසුගිය අවුරුද්දෙත් ගංගා ආශ්‍රිත තොටුපොලවල් සැකසීමේ කටයුත්තට සම්පාදනය වෙන්න මුදල් අනුමත වෙලා ඇවිල්ල තිබුනා. නමුත් ඒ කාලය තුල වර්ෂාව ලැබීම නිසා නැවත වතාවක් අපෙන් ඒ මුදල් ගිලිහී ගියා. මේ වසර තුලදී නැවත වතාවක් ඒ මුදල් ලැබී තියෙනවා. ඉතිං සභාපතිතුමනි, ඔබතුමා ප්‍රකාශ කල පරිදි සභාවෙන් මේ කටයුත්ත සිදු කරනවනම්, ඒක හරියට දින වකවනු ඇතුව කටයුතු කිරීම ගැන සොයා බැලීම් කරලා, මෙවරවත් මේ කටයුත්ත අපට ඉටු කර දීමට වග බලා ගන්න කියන කාරණාව සිහිපත් කරනවා. ඒ වගේම පසුගිය දවසක අප අතරින් වියෝ වූ අපේ උප සභාපතිතුමාගේ මැණියන් ගේ අවමංගල්‍යය සිහිපත් කරමින්, එතුමියට අමාමහ නිවන් සුව අත් වෙන්න කියලා ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා. බොහොමත්ම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ගෙන්, මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. මට හිතෙන්නෙ මට අද පාසල් කාලය මතක් වුනා. මොකද අපි පාසල් කාලයේ පලා බබා අපට එපා කිය කිය පාර දිගේ ගියපු කාලය මතක් වුනා අද. ඒ වගේම තමයි මම හැමදාමත් පවසන අපේ ගමේ පාරවල්වල මඩවලවල් නිසා ගමන් කිරීමට හරිම අපහසුයි. ඒ වගේම තමයි තාර පාරෙ වුනත් වංගු සහිත ස්ථානවල පාරවල් කැඩිලා ඒවයින් අනතුරු මේ දිනවල සිදු වෙනවා.

අනිත් කාරණය තමයි පාසල් ළමුන් ගෙනයන මේ ප්‍රදේශයෙන් උදේ 5.30 ට විතර පිටත් වෙන CTB බස් රථය පිළිබඳව සමහර විට හිරිමුතුගොඩ මන්ත්‍රීතුමා දැනුවත් ඇති. උදේ 5.30 ට විතර මාපලගමින් ගාල්ල දක්වා පිටත්වෙන CTB බස් රථය පාසල් ළමුන් ගන්නෙ නැතුව යන දවස් තියෙනවා. නාගොඩ හන්දියෙදිත් ළමයි බස් එකට නගග ගන්නෙ නැහැ. සීසන් ළමයි කියලා නාගොඩ හන්දියෙනුත් ගන්නෙ නැහැ. සමහර දවස්වලට හෝල්ට් එකෙත් නවත්වන්නෙ නැහැ. වේගෙන්ම යනවා කොහොම හරි බයිසිකලේ පිටිපස්සෙන් ගිහින් හරි ඒ බස් එකට දාගන්න බැහැ. ඒ වගේම තමයි ඊයෙ දිනයේ තිබුනෙම නැහැ. සීසන් ළමයි බස් එකට නැග්ගම කාඩ් බෝඩ් කැලිය කියලා කියනවලු ඒ නිසා තමයි ඒ ළමයි හලලා යන්න හදන්නෙ. කාඩ් බෝඩ් කැල්ල වුනත් ඒ ළමයි වියදමක් දරල තමයි බස් එකේ යන්නෙ. ඒ පිළිබඳවත් ඔබතුමා සොයල බලන්න. එතනට ගොඩක් ළමයි එකතු වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මලාමුර ආදර්ශ ගම්මානයේ වෙද ගෙදර මාර්ගය JCB යන්ත්‍රයක් යොදල සකස් කරල දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. මම හිතන්නෙ පියල් මන්ත්‍රීතුමා ඒකට හොඳටම සාක්ෂි දරාවි. ඒ පාරෙ යන්නම බැහැ කියලා, පාසල් යන ළමයිත් මේ දවස්වල සපත්තු ගලවගෙන තමයි වික්ටර් සුදු අයියලගෙ ගෙදර ලඟින් එහා පැත්තට මාරු වෙන්නෙ. ගස් කොලන් පාර පැත්තටම හැරිලා පයින්වත් යන්න බැරි තත්වයට පත් වෙලා. ඒක නිසා ගයාන් මන්ත්‍රීතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. එතුමගෙත් අවදානය යොමු කරලා, ඒ පාර ඉක්මනින්ම සකස් කරල දෙන්න කියලා. ඒ මාර්ගයට විදුලි පහන් දෙක තුනක්වත් දාල දෙන්න කියලාත් ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාගෙන් අවසරයි. අද දිනයේ ඡන්ද විමසීමකුත් පැවැත්වුනා. මම හිතන්නෙ අවශ්‍ය දෙයක්ද? අනවශ්‍ය දෙයක්ද? දන්නෙ නැහැ. නමුත් ඇත්තටම පළාත් සභා ක්‍රමය ගැන යෝජනාව, එක්සත් ජාතික පක්ෂ රජයකින් ගෙනාව වුනත්, මේ වෙන කොට අපි ඒකෙ ඇති දෙයක් දකින්නෙ නැහැ.ඒක නිසා තමයි ඒකට විරුද්ධ වුනේ.

ඒ වගේම තමයි විධායක ජනාධිපති ක්‍රමය වුනත් එක්සත් ජාතික පක්ෂ රජයකින් ගෙනාවෙ. මේ රටේ අත්හදා බැලීමකුත් වුනේ. නමුත් එදා විරුද්ධ කණ්ඩායම් නැවතත් 20 වන සංශෝධනයක් දාගෙන ආයෙමත් විධායකය ශක්තිමත් කර ගන්න යන අවස්ථාවක, මම දන්නෙ නැහැ. මේ රටේ මිනිසුන් දැන් පළාත් සභා මැතිවරණය නැත්නම් 20 වන ව්‍යවස්ථා සංශෝධනය දිහා බලාගෙන ඉන්නවා. වෙන දෙයක්නම් පේන්න නැහැ. මම හිතන්නෙ බඩු මිල හා අනිත් සංවර්ධන කටයුතු සියල්ලම මිනිසුන්ට අමතක කරවන විදිහක් තමයි අපට පෙනෙන්නෙ. මොකද මිනිස්සු බලාපොරොත්තු වුනේ මේ දේවල් නෙවෙයි. මීට වඩා වෙනස් සංවර්ධනක්. ඒ වගේම මට මතකවිදිහට හරියටම මීට අවුරුද්දකට විතර කලින් අපේ ගනේවත්ත මන්ත්‍රීතුමා කිව්වෙ, ගම්මිරිස් ටික තව මාස තුනකින් විකුණ ගන්න කියලා ඇඳ යටට කරලා තියෙනවා. මම හිතන්නෙ නැහැ ඔබතුමා බලාපොරොත්තු වුන ඒ මිලට ඒ ගම්මිරිස් ටික විකුන ගත්ත කියලා. අවුරුද්දකුත් ගිහින් තියෙනවා. දැන් අපි දකින දේශීය ආර්ථිකය නගා සිටුවන්න ඕන කියලා කිව්වට, මම ඊයෙ ගිහින් බලන කොට මම මුහුන දුන්න අත්දැකීමක් තමයි කුරක්කන් කොට්ටෙක මිලත් දැන් දෙසිය පනහයි. ගිය මාසෙ 150 ට ගත්ත එක අද 250 ක් වෙලා තියෙනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමා මම ඉල්ලා සිටින්න කැමතියි. අපේ වෙරංග මන්ත්‍රීතුමත් ඉන්න වෙලාවෙ, අපේ මොරගල්මුල්ල මාර්ගය ගිය අවුරුදු හතර පහේ ලක්ෂ 70 ක පමණ මුදලක් යොදවලා සංවර්ධනය කළා. ඒකෙ අනිවාර්යයෙන් දෙපැත්තෙ පැති බැම් ඉදි කරීම අවශ්‍ය වෙලා තියෙනවා. මොකද එක පැත්තකින් ඇල. අනිත් පැත්තෙන් වෙල. දෙපැත්තට කඩාගෙන යනවා. ඒක නිසා ඔබතුමන්ලගෙ සංවර්ධන යෝජනා වලදි, ඒ යෝජනාවත් කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ උප සභාපතිතුමාගේ මවගේ අවමංගල්‍ය මේ වෙලාවෙ සිහිපත් කරනවා. ඒ සම්බන්ධව ඉතා කණගාටු වෙනවා. ඒ වගේම තමයි සභාපතිතුමා, මේ සභාවේ අපි මීට කලිනුත් කතා කළා. අවමංගල්‍ය පිලිබඳව අපිට සභාවෙන් දැනුම් දීමක් කළේ නැහැ. අපි පිටතැන් වලින් තමයි ඒක දැන ගත්තෙ. එවැනි අවස්ථාවකදී ඒ පණිවිඩය ලබා දීම සම්බන්ධයෙන්වත් නිවැරදි ක්‍රමවේදයක් සිදු කරන මෙන් මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මේ සභාවේ අපේ ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා දැන් අවස්ථා දෙකක් මගේ මවගේ අභාවය පිළිබඳ ශෝකය, කණගාටුව ප්‍රකාශ කළා. ඉතිං තවදුරටත් මන්ත්‍රීවරු කතා කරන්න කලින් මම ඒ ගැන කතා කරන්න ඕන. ඇත්තටම ඒ අවස්ථාවෙදි මට දැක්වූ සහයෝගය, සහභාගිත්වය සහ සම්බන්ධ වීම සහ ප්‍රාදේශීය සභාවෙ සම්පත් කලමනාකරණය කරලා, අපට ලබා දීම සම්බන්ධයෙන් විශාල ශක්තියක් ලබා දුන්නා. ඒ වගේම මම බලාපොරොත්තු නොවූ ආකාරයේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් පරිත්‍යාගයකුත් ලැබුනා. මම ඇත්තටම එහෙම බලාපොරොත්තු වුනේ නැහැ. නමුත් ඒක මට ප්‍රතික්ෂේප කරන්න බැරිවුනා. ඒක මම ඉතාම සතුටෙන් භාර ගත්තා. ඒ ලබාදුන් ශක්තිය මට ඒ කටයුතු සාර්ථක කරගන්න ඉවහල් වුනා කියලා මම මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරන්න කැමතියි. ඒ දින කීපයේදීම ගොඩාක් වෙලා මාත් එක්ක රැඳී සිටියා. ඒ වගේම මේකට නායකත්වය ගත්ත සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුලු සියලු දෙනාට මගේ පවුලේ සියලු දෙනාගේ අවංක ආදර ස්තූතිය මේ අවස්ථාවෙ මේ සභාව හමුවේ තබන්න කැමතියි. ඔබ කෙරෙහි ඒ තිබූ විශ්වාසය තව දුරටත් වැඩිවුන බව මේ අවස්ථාවෙදි මේ ගරු මන්ත්‍රීතුමන්ලට මම ප්‍රකාශ කරන්න කැමතියි. ඉතිං ඔබතුමාලගෙ දුකේදිත් සැපේදිත් විවිධ අවස්ථාවන්වලදි ඉදිරියෙදි, අනාගතයෙදි, අතීතයෙදි වගේම සහයෝගයෙන් සහභාගිත්වයෙන් සම්බන්ධ වීමෙන් ඒ වගේම ඒ දුක සැප බෙදා ගන්න කටයුතු කරන බවත්, මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරන්න කැමතියි .

ඊලගට මේ සභාවෙ පළාත් සභා ක්‍රමවේදය පිළිබඳව සාකච්ඡා වුනා. ඒ සාකච්ඡාවෙදි මම හිතන්නෙ අපි දෙපාර්ශවයක් වශයෙන් කරුණු කාරණා අවස්ථා කීහිපයකදිම ප්‍රකාශ කළා. මම තරංග මන්ත්‍රීතුමා කියපු අදහසක් පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න කැමතියි. අපි දැක්ක විශාල අඩුපාඩුවක් පළාත් සභාවෙ සම්පත් පරිහරනයෙදි වෙච්ච ගොඩක් දේවල්. මම ගොඩක්ම දන්නවා ඒක. පළාත් සභාවෙ හිටපු කාර්යය මණ්ඩලයේ සාමාජිකයෙක් වශයෙන් අපි දැක්කා අනවශ්‍ය විදිහට පළාත් සභාවෙ සම්පත්, යාන වාහන, ඇතුලු සියලු දේවල් ඒවා කිසිදු සීමාවකින් තොරව, ඒ අවශ්‍ය අයගේ බලතලත් අරගෙන හුගක් අය පාවිච්චි කළා, පාවිච්චි කරනවා. ඒ වගේම පළාත් සභාවට ලැබෙන විදේශ ආධාර විශාල වශයෙන් වැය වන්නෙ පළාත් සභාවේ නඩත්තුවට. යම් ව්‍යාපෘතියකට මුදලක් ලැබෙනවනම්, 50% ක්ම කාර්යාල කටයුතු, ගොඩනැගිලි හදන්න, යාන වාහන ගන්න, අතිකාල දීමනා, කාර්යාල දීමනා ඒ සියල්ලටම 50% ක් ගිවැය වෙලා, 30% ක් 40% ක් තමයි ජනතාවට ලැබෙන්නෙ. ඒක විශාල පාඩුවක්. ඒ වගේම පළාත් සභා මන්ත්‍රී තනතුරු පිළිබඳ මම වැරදියෙන් කතා කරනවා නෙවෙයි. හුගක් වරප්‍රසාධ ලැබෙනවා. ඒ වගේම හුගක් විදේශ සංචාර, අනවශ්‍ය පුහුණු වීම්වලට යනවා. නමුත් රටට ගෙනාපු දෙයක්, පළාතට ගෙනාපු දෙයක් නැහැ. බැලුවම මේ අවුරුදු ගානටම කිසිම සංකල්පයක් නැහැ. මෙහෙන් නිලධාරිත් එක්ක වැඩසටහන් හදාගෙන ගිහිල්ලා, පුහුණු වීම්වලට යනවා. විදේශ සංචාරවලට යනවා. ඒවයින් අත්දැකීම් ලබාගෙන, ඇවිල්ලා මෙහේ කරපු දෙයක් නැහැ. ඒවා සුදු අලි. බැලුවහම ඒවා ගොඩක් දේවල් කතා කරන්න පුලුවන්. නමුත් අපි සහබන්දු මහත්තයටත් එකග වෙන්න වෙනවා. අජිත් මහත්තය කිව්ව වගේ තව දේශපාලන අධිකාරියක් මේකෙන් බිහිවෙලා ඉන්නවා. ඒ බිහිවුන දේශපාලන අධිකාරිය අපි කොහොමද පැත්තකට කරන්නෙ. ඒ අයට යම් අවස්ථාවක් නොලැබුනොත් මම හිතන්නෙ ලොකු පීඩනයක් රටේම ඇති වෙනවා. හැම දේශපාලන පක්ෂයකටම ලොකු පීඩනයක් ඇති වෙනවා. මේවට අපට එක විට හුරු වෙන්න බැහැ. ක්‍රමානුකූලව මේවට යම් යම් කාර්යයන් ගෙනැල්ලා, සීමාවන් ගෙනැල්ලා, මේවා යහපත් තත්වයට ගේන්න. රටට ගැලපෙනවද නැද්ද යන්න පිළිබඳව සාකච්ඡා කරලා කරන්න. මේක ක්ෂණික අවස්ථාවක් නෙවෙයි. ඉතිං ඒ නිසා තව දුරටත් පළාත් සභාව පැත්තකට කරන්න බැහැ. ඔය පළාත් සභාව පවත්වාගෙන යමින් ඒවට නව දැක්මක් ඇතුව මේ කටයුතු කිරීම තමයි අපිට යෝග්‍ය වන්නේ කියලා මම හිතන්නෙ. ඒ සඳහා අපි ඉඩ ප්‍රස්ථාව ලබා දීමට මේ යෝජනාවක් කර ගමුයි කියලා ප්‍රකාශ කරනවා. මේ

අවස්ථාවෙදි පක්ෂ, විපක්ෂ ඡන්දය දුන්නා හෝ නොදුන්නා අයටත් අපි මේ වෙලාවෙදි මතක් කරන්න කැමතියි මේක යහපත් පැත්තකට ගේන්න. මේක දවසකින් දෙකකින් කරන්න පුලුවන් කාර්යයක් නෙවෙයි. ඒ නිසා අපි ඒවට කාලය දීලා, වැදගත් විදිහට රටට උචිත පරිදි දිස්ත්‍රික්කයට, පළාතට උචිත පරිදි කරගෙන යාම සඳහා පළාත් සභා ක්‍රමවේදය සකස්කළ යුතුයි කියන මතයේ අපි ඉන්නවා. දන්න කියන අත්දැකීම් තියෙන අය වශයෙන් මීට වඩා මම කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ.

නැවත වරක් අපේ ගයන්ති මන්ත්‍රීතුමිය කතා කල බඩු මිල පිළිබඳව, එතුමියට දැනෙනවා. දැන් අපි කතා කළා. එතුමිය අර ලබාදෙන කෑම පෙට්ටියත් මම හිතන්නෙ ඒක ඒ මිලට දෙන්න බැහැ. මම කියන්නෙ ඔබතුමිය ඒ මිලට දෙන්න එපා සාධාරණ මිලකට දෙන්න. මොකද ඔබතුමිය විතරක් එහෙම වෙලා හරියන්නෙ නැහැ. සාධාරණ මුදලක් අරගන්න ඒක ගැටලුවක් නැහැ. රජයේ සංවර්ධනය පිළිබඳ ඔබතුමියට දැක්මක් තියෙන්න ඕන. අර මොරගල්මුල්ල පාරට දැනටම කෝටි ගානක ඇස්තමේන්තුවක් තියෙනවා. මම හිතන්නෙ වෙරංග මන්ත්‍රීතුමා කතා කරයි. ඒ පාර සංවර්ධනය වෙයි. දැන් මම හිතන්නෙ රටේ සංවර්ධනය සීඝ්‍ර වශයෙන් පැතිරෙන ගමන්ම, විශේෂයෙන්ම පසුගිය කාලෙ තමුන්නාන්සෙල අපි බලාපොරොත්තු වුන අර අටපාස් සමත් අයගේ රැකියා ලක්ෂෙ වැඩපිළිවෙල පිළිබඳව ගොඩනැගිලි පහසුකම් ලබා දෙන්න කියලා අද සභාවට එවලා තියෙනවා. සමස්ථයක් වශයෙන් බැලුවම කිසිදු දේශපාලන බේදයකින් තොරව, කිසි කෙනෙකුට දේශපාලනයේ අපටවත්, අපේ නායකයන්ටවත්, කිසි කෙනෙකුට මේවට ඇඟිලි ගහන්න බැරිවුනා. සර්ව සාධාරණ විදිහට පරීක්ෂණ පවත්වලා, නිලධාරින් අතරින් තේරිල තියෙනවා. ඒවා කිසි කෙනෙකුට වලක්වන්න බැරි තත්වෙට පත්වෙලා තියෙනවා. අපි කියන්නෙ වෙන්න ඕන වැඩේ ඒක තමයි. නිවැරදි ක්‍රමය අපි හැමදාම වැරදි ක්‍රමය කළේ නුසුදුසු අය පත්කරගෙන, දේශපාලන මතය තියෙන අය විතරක් පත්කරගෙන 100% ක් දේශපාලනී කරණය වුන වැඩ පිළිවෙලක් තමයි කාලයක් තිස්සෙ තිබුනෙ. නමුත් ඒ හැරවුමක් වෙලා තියෙනවා. දැන් මම හිතන්නෙ අතිගරු ජනාධිපතිතුමා ඒ හැරවුම ආරම්භ කරලා තියෙනවා. සියලු අංශයන්ගෙන්, අධ්‍යාපනද, සෞඛ්‍යද, නැත්නම් වෙන සමාජයේද නැත්නම් පරිසරද සෑම අංශයකම වෙනසක් ඇතිවෙන තත්වයට පත්වෙලා තියෙනවා. රට යහපත් තැනකට පත්වෙයි කියල බලාපොරොත්තු වෙනවා. ඔබ සැමට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, නැවත වරක් මගේ මෑණියන්ගේ අභාවයට දැක්වුවා වූ සහයෝගයට ඔබ සියලු දෙනාට ණය ගැතිබවත් ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරන්න කැමතියි. ගරු සභාපතිතුමාට මම කීප විටක්ම දුරකතනෙන් කතා කරල කිව්වා. උඩුගම ගුණානන්ද මාවතේ, හෝමදොල වත්තෙන් පාරට අවහිර වෙන්න කම්බි කනු ගහලා තියෙනවා. මම හිතන්නෙ අපේ සභාවෙ පාරක් තියෙන්නෙ. ඒකෙ කම්බි කනු 20 ක් 30 ක් විතර ගහලා පාරට අවහිර වෙල තියෙන්නෙ. සභාව විදිහට ඒක අයින් කරල දෙන්න කියලා, ගමෙන් කීප දෙනෙක්ම ඉල්ලීම් කළා. අපි ගිහින් කිව්වා අපි කතා කරල අයින් කරමු කියලා. සභාව විදිහට ඒ කම්බි කනු ටික අයින් කරල දෙනවයි කියලා මම අද ඒ අයට පොරොන්දුවක් දීල ආවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, සභාවෙ පාරක අඩි දෙකක් තුනක් තියලා කම්බි කනු ගහල තියෙනවා. ඒ කම්බි කනු ටික වත්තට කතා කරලා ඉවත්කරල දෙන්න කියලා කාරුණික ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, උඩුගම කැටගොඩ ස්ටෑන්ඩ් එක ලග සිට අපේ සභාවෙ බෝඩ් එක ගාවට යනකම්ම ලයිට් කනුවල තිබුනු වීදි ලාම්පු ටිකත්, කොකු ටිකත් ස්ටෑන්ඩ් ටිකත් සේරම පාර හදපු මිනිස්සු ගලවගෙන ගිහිල්ලා. ඒක නිසා මම ඒකත් සභාවට කියල ඇති. නමුත් ඒකට ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරන්නෙ, ලේකම් තුමිය දැනුවත් කරන්න. ඒ අදාල ආයතනයට දැනුවත් කිරීම්

කරලා, ඒ ටික අපට ලබා ගන්න කටයුතු කරන්න කියලා. දැනට වීථි ලාම්පු ටිකත් නැහැ. කොකු ටික ස්ටෑන්ඩ් මොකුත්ම නැහැ. ගලවගෙන ගිහිල්ලා. ඒ සම්බන්ධව කාරුණික අවදානය යොමු කරන්න කියලා ඉල්ලීම කරනවා. ඒ දේ තමයි කියන්න තියෙන්නෙ. ගුණානන්ද මාවතේ කම්බි කනු ටික ඉතා ඉක්මනින් ඉවත් කරල දෙන්න. ඒ වගේම ස්ටෑන්ඩ් එක ගාව ඉඳලා අපේ සභාවෙ මායිමට තියෙන තැනට යනකම් වීථි ලාම්පු ටික ඒ කොකු ටික ස්ටෑන්ඩ් ටික මොකක්ද වුනේ කියල ඒක හොයල බලල ඒ කටයුතු කරන්න. ඒ වගේම ගරු සභාපතිතුමනි, උඩුගම ගත්තොත් අපේ ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කිව්ව වගේ, දැනට කොහෙවත්ම වැඩ කරන්නෙ නැති විදිහට වීදි ලාම්පු ටික පිච්චිල ගිහිල්ලා තියෙනවා. ඒක නිසා ඒ ගැනත් අවදානය යොමු කරන්න කියන ගෞරවණීය ඉල්ලීම කරමින්, ගුණානන්ද මාවතේ කම්බි කනු ටික ගැනත් ඒ වගේම ස්ටෑන්ඩ් එක ගාව ඉඳල අපේ සභාව මායිම ලගට යනකම් වීදි ලාම්පු කොකු ටික හා ස්ටෑන්ඩ් ටික මොකක් වුනාද කියන එක සොයා බලන්න කියන ගෞරවණීය ඉල්ලීම කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, අපි හැමදාම කතා කරන්නෙ මේ සභාවට අපි එච්චෙ මොකටද කියන කතාව. ඒ තමයි අපි උපතේ සිට මරණය දක්වා කටයුතු කිරීමයි. නමුත් එය තවම සිදුවෙලා නැහැ. සිදුවෙල නැතෙයි කියන්නෙ මෙන්න මෙහෙමයි. අපේ කුඹුරුහේන මාර්ගය ඇත්තටම ඒක ඉස්සර තිබිලා තියෙන්නෙ කරත්ත යන මාර්ගයක්. දැන් යාන වාහන යන තත්වෙට තමයි හැදිල තිබුනෙ. මීට අවුරුදු 34 කට කලින්. නමුත් නැවත කිසිම ප්‍රතිසංස්කරණයක් වෙලා නැහැ. මම නිතරම සභාවෙදි එහෙම නැත්නම් අපි සම්බන්ධීකරණ කමිටුවෙදි යෝජනා ගෙනාවා. නමුත් තවම කිසිම වැඩපිළිවෙලක් වුනේ නැහැ. ඒ විතරක් නෙවෙයි ගරු සභාපතිතුමනි, අපේ ඒ ප්‍රදේශයේ පවුල් 259 ක් ඉන්නවා. අපේ පියල් මන්ත්‍රීතුමත් දන්නවා. ජනතාව 950 ක්, ළමයි 250 ක් වශයෙන්. ඇත්තටම ඒ ළමයි ඉස්කෝල ගමන පවා අඩාලවෙලා තියෙන්නෙ. ඒ මාර්ගයේ බස් එක පවා නැවතිලා තියෙන්නෙ. ඒ කුඹුස්ස පාලමේ පැති බැම්ම කැඩිලා, පාලමත් ඇලවෙලා තියෙන්නෙ. ඇත්තටම එතනින් යන්න බැරුව තමයි බස් එකත් නැවැත්තුවෙ. සිරස ගම්මැද්දෙන් ඇවිල්ල දැන් කතා කරල අහනවා. මොකක්ද මේකට විසඳුම කියලා එදා සභාපතිතුමාගෙන් අහල තිබුනා. සභාපතිතුමා කියලා තිබුනා හදා දෙනවයි කියලා. දැනුත් මට කතා කරලා ඇහුවා. ඒ වගේම තව කතාවක් කිව්වා. මේ මන්ත්‍රීතුමනි, අපි මාපලගම ටවුන් එකට ආවා කිව්වා. පොදු වැසිකිලියක් තියෙන්නෙ කොයිද කියල අහනවා. ඇත්තටම ඒ පොදු වැසිකිලියක්වත් නැති එකම සභාවෙයි කියල තමයි දැන් කතා කරන්නෙ. ඇත්තටම අපට ලැජ්ජයි ඒ ගැන. පොදු වැසිකිලියක් නැහැයි කියන මතය තමයි තියෙන්නෙ. ගරු සභාපතිතුමනි, අන්න ඒ තත්වෙ තමයි වෙලා තියෙන්නෙ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා යෝජනා කල පුස්තකාල සම්බන්ධව රුපියල් 50 ක් හා 100 ක් මුදල වැඩි කරන්න කියලා. මම අහන්නෙ මේ අහිංසක දරුවන්ගෙ මනස දියුනු කර ගන්න කියවන පොතට රුපියල් 100 ක් වැඩි කරනවද? ඒවගේම එදා උඩුගම පොළේ බදු මුදල් සම්බන්ධ නඩුවක් තියෙනවා. ඒක කියවුනෙත් නැහැ. නඩුවට ගත්ත මුදල් ටික අය කර ගන්නවද? දැන් ඒ වගේම තමයි තල්ගස්වල පොල දීලා තියෙන ඔය ධම්මික නැමති මහත්තයගෙන් ඒ මුදලවත් අය කර ගන්නවද? මම අහන්නෙ ඒ මුදල් ටික අය කරගෙන, ඊට පස්සෙ අර රුපියල් 50 හෝ 100 වැඩි කරන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි. ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ මම පළමුවෙන්ම සභාවට ආපු දවසෙ කිව්වෙ ආදාහනාගාරය ගැන. ඒ ආදාහනාගාරය ගැන තව කිසිම කතාවක් නැහැ. ඒ ඉඩම ලැබුනයි කිව්වා. ඒ කිසිම කතාවක් නැහැ. මම අහන්නෙ ඒකට මොකද වුනේ? ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි,

නැවත වාරයක් කියන්නෙ මෙන්න මේ මත් ද්‍රව්‍ය ගැන. ඔබතුමාලගෙ රජයෙන් දැන් කුඩු ගංජා සියලුම දේ අල්ලගෙන යනවා. නමුත් අප බල ප්‍රදේශයේ අවුරුදු 13 ළමයාගේ සිට මේ කසිප්පු ජාවාරම කරගෙන යනවා. මේක නවත්වන්න බැරි ඇයි? අනිත් එක තමයි අපි ඊයෙ ඇස් දෙකටම දැක්කා. මේ මත් ද්‍රව්‍ය පානය කරලා, රියදුරන් පාරෙ ගමන් කරද්දි, මේ අහිංසක මිනිස්සු හැපිලා ගගට වීසි වෙල මැරෙනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, දැන් දවස් දෙහෙකට කලින් මේ නාගොඩ පොලීසිය කරපු වැඩක් මම කෙලින්ම කියනවා. හොදටම බීල මත් වෙච්ච දෙන්නෙක් බයිසිකලෙන් ආවා. ඒ දෙන්නට යන්න කිව්වා. අර හෙල්මට් එකක් නැතුව ආපු අහිංසක දරුවෙක් අල්ලලා රුපියල් දාහක දඩයක් ගැහුවා. මමමයි ලයිසන් එක දුන්නෙ. ඒ දරුවට ලයිසන් එකක් තිබුනෙ නැහැ. ඔන්න තත්වෙ ඇත්තටම මේ පොලීසියෙ නීති දෙකක්. ලොකු මනුස්සයට එකක්. පොඩි මිනිහට එකක්. මේ මත් ද්‍රව්‍ය ගැන ඇත්තටම ලිපියක් යවන්න කියලා ගිය සභාවාරෙත් කිව්වා. පොලීසියට ලිපියක් යැව්වද? ඒ ගැන අපට තොරතුරක් දුන්නද? නැහැ. අපි මෙතන ගම්වාසීන් වෙනුවෙන් උගුර ලේ වෙනකම් කෑ ගහනවා. අපි මෙතනට එව්වෙ ඔන්න ඕකට. කෝ මේවට පිළිතුරු. ඇත්තටම නිලධාරීන් දැනුවත් කරන්න. අපි ගිය සැරේ කිව්වා. අපි මොකක් හරි යෝජනාවක් දැම්මොත්, නැවත ඒ ආයතනයට යොමු කරල අපිට ඒ ලියුම ආපහු අපටත් දෙන්න. කොපියක් දෙන්න. එතකොට අපට කියන්න පුලුවන් අපි මේක දුන්නයි කියලා. එහෙම කිසිම දෙයක් නැහැ. දැන් මේ වැඩ පිළිවෙල අපි බලන් හිටියා. ෆයිල් ගේනවා. ෆයිල් ගේන්න අවන්ත මහත්තයා නිතරම යවන්න ඕන. එහෙම නෙවෙයි ඒ වැඩපිළිවෙලේ ක්‍රියාදාමයක් තියෙන්න ඕන. අන්න ඒ ක්‍රියාදාමෙට අපි එන්න ඕන. ඊලගට පළාත් සභා, පාර්ලිමේන්තු යනාදි හැමදේටම එහෙම වැඩපිළිවෙලක් තියෙනවා. ඒ වැඩපිළිවෙලේ ක්‍රමවේදයක් තියෙනවා. අන්න ඒ ක්‍රමවේදයට යන්න කියල ඉල්ලා සිටිමින්, ගරු සභාපතිතුමනි, මගෙන් වරදක් කියවුනානම් සමාවෙන්න කියල ඉල්ලමින්, මම කියන්නෙ මෙන්න මේ කටයුතු ටික හරියාකාරව ඉටු කරල දෙන්න කියලා. ඊලග සභාවාරෙදිවත් එහෙම වෙන්නෙ නැතුව හරි ක්‍රියාදාමයකට හරි ක්‍රියා පටිපාටියකට ගිහිල්ලා අපට මේකෙ වැඩ කරන්න හැකියාව ලබා දෙන්න. තරංග මන්ත්‍රීතුමත් කිව්වා. අපි දැන් මේ ප්‍රාදේශීය සභාවට ආවට පස්සෙ ඇත්තටම අපි ගොඩාක් වෙලාවට හිටගෙන ඉන්න අවස්ථා තියෙනවා. අපට ඉන්න එහෙම තැනක් නැහැ. එහෙම ස්ථානයක් සකස් කරලා දෙන්න. එවිට මන්ත්‍රී කෙනෙක් කියලා ගරුත්වයක් තියෙනවා. ඒ ඉඩ ප්‍රස්ථාව සලසා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, ඔබ සියලු දෙනාටම ඉදිරි අනාගතය ජයවේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා.

**සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මාධ්‍යවේදී මහත්වරු ඉන්න නිසා ඔය කතාව කියන්නෙ. ඔබතුමාම දන්නවා ඔය මාර්ගය කිලෝ මීටර් දෙකක් දැන් කාපට් කරන්න සේරම යෝජනා වෙල ඉවරයි. ඒක මැනලා කොන්ත්‍රාත්කරුත් අරගෙන ඉවරයි.

**ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සමස්ථ සියලු දෙනාගෙන් අවසරයි. සියලුම දෙනා නිහඩව අසා සිටිනවනම් මම කැමතියි. ගරු සභාපතිතුමනි, ඔබතුමා යෝජනාවක් ගෙනාවා. වැලිවලට බලපත්‍ර නිකුත් කරන්න. මම ඒ යෝජනාවට මුලින්ම කැමැත්ත ප්‍රකාශ කරනවා. මොකද ඒකට හේතුව ගිය සතියෙ දිනක අහිංසක මනුස්සයෙක් තම නිවස ඉදි කර ගැනීම සඳහා වැලි කියුබ් දෙකක් ගොඩදාගන්න පර්මිට් එකක් ගන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ල තියෙනවා. ඉතිං ඒ අවශ්‍ය කටයුතු කරලා, සඳුදා දිනයේ ගියාම කියලා අගහරුවාදා දිනයේ එන්න කියලා. අගහරුවාදා දිනයේ ගියාම කියලා බදාදා එන්න කියලා. ඔහොම ගිහිල්ල සිකුරාදා දවසෙ මම එතනට ගියා. එතනට ගියාට පස්සෙ ඒ අදාල එක අංශෙකින් වෙන තැනකට යැව්වයි කිව්වම, ඒ නිලධාරියා කිව්වා බලමු තව දවස් දෙකකින් සදුදා වෙන කොට බලන්නම් කිව්වා. මම කිව්වා ඇයි මෙච්චර පරක්කු කරන්නෙ කියලා. අපට පුලුවන් වෙලාවට

තමයි කරන්න වෙන්නෙ කිව්වා. මම කවුද කියලවත් ඒ අය දන්නෙ නැහැ. ඊට පස්සෙ මම ඒ ජී මැඩම් හමු වෙලා, මම කිව්වා මෙන්න මේකයි මැඩම් තත්වෙ. මේකට මොකක්ද කරන්නෙ කියලා. මම උඩ ඉඳලා පල්ලෙහාට බැහැලා, ඒ ජී මැඩම් ගාවට ඇවිල්ලා ඔය විස්තරේ කියන විට, ඒ ජී මැඩම් ඊට පස්සෙ ඒ නිලධාරියට කෝල් එකක් ගන්න වෙලාවෙදි ඒ නිලධාරියා දානෙ ගෙදරක ගිහිල්ලා. එතකොට ඒ අවශ්‍ය වැඩේ කරන්න බැහැ. නමුත් ඒ දානෙ ගෙදර යන්න පුලුවන් . ඊට පස්සෙ ගරු සභාපතිතුමනි, මම ඒ පිළිබඳව දිස්ත්‍රික් ලේකම්ට කතා කළා. දිස්ත්‍රික් ලේකම් ප්‍රාදේශීය ලේකම්ට කතා කරල තියෙනවා. ප්‍රාදේශීය ලේකම්ට කතා කළාට පස්සෙ, කොහොම හරි ජනාධිපති ලේකම් කාර්යාලයටත් මේ විස්තරය ගිහින් තියෙනවා. මම දන්න විදිහට ඒ දෙපලින් කොහෙන් හරි ලේකම්තුමියගෙන් ඒ ගැන විමසලා තියෙනවා. ඒකෙ ප්‍රතිඵලයක් හැටියට ඉඩම් අංශෙ ඉන්න බණ්ඩාර කියන නිලධාරියා තමයි මම හිතන්නෙ නිර්දේශ කරන්නෙ. එතුමා මේක පතල් හා භූ විද්‍යා ආයතනයට යවලා, මේක එයාලට නිර්දේශ කරන්න බැරිය කියලා. ඉතිං අර මනුස්සය ඒ සඳුදා ගිය දවසත් එක්ක දවස් පහක් ගිහින් තියෙනවා. දවස් හයක් කොහොම හරි ඔය ටික වෙනකම් ගිහින් තියෙනවා. එතකොට කුලීවැඩ කරන මනුස්සයෙක් දවසට රුපියල් 1200 ක් හොයන මනුස්සයෙක් ඒ වෙනුවෙන් වියදම් කරන ලද වැලි කියුබ් එකකට ආසන්න වෙන මුදලක් ඒ මනුස්සයට නාස්ති කරගෙන තමයි ගිහින් තියෙන්නෙ. තවමත් ඒ වැඩේ සිදුවෙලා නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඇත්තටම ඔබතුමා ගෙනාපු ඒ යෝජනාවට එකග වෙනවා.

ඒ වගේම තමයි අපේ ගයන්ති මන්ත්‍රීතුමිය කිව්වා තුනෙන් දෙකක බලය දුන්නෙ මේ දේවල් කරන්න නෙවෙයි. මේ දේවල් කරන්නෙයි කියලා. මම හිතන්නෙ ඒ අලුත් විදිහට ඒ අනපනත් හදලා ඒ දේ කරන්න තමයි අපේ රජයට දුන්නෙ කියලා. ඒ විස්තරය විතරක් මතක් කරමින්, ගරු සභාපතිතුමනි, ඒ වගේම අපේ දිල්රුක්ෂි මන්ත්‍රීතුමිය කිව්ව වගේ ඒ පාර වගේම තව පාරවල් කීපයකුත් තියෙනවා. ඒ පාරත් ප්‍රධානයි. ඉතිං ඒ ගැනත් අවදානය යොමු කරලා, කටයුතු කරන්න කියලා, ඉල්ලා සිටිනවා. අපට ඉතිං ඉල්ලීමක් විතරයි කරන්න පුලුවන්. මොකද අපි දන්නවා සභාවෙ ආර්ථික මට්ටම. නමුත් ඉදිරියෙදී අපට එහෙම කියලා මෙතනින් නිදහස් වෙන්න බැරි වෙලා තියෙනවා. මොකද සියලු බලතල තියෙන්නෙ අපේ රජය යටතේ. ඉතිං තව දුරටත් අපට මේ වගේ දේවල් ලයිට් නැහැ. පාරවල් මේ විදිහයි කියන්න ඉඩ තියන්නැතුව අපට පුලුවන් හැටියට ග්‍රාමීය සංවර්ධන කටයුත්තට දායකත්වය සහ අපටත් ශක්තියක් ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාට ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවෙදි ඇත්තටම දීර්ඝ වශයෙන් සාකච්ඡා වුනත්, අපේ සමන් මන්ත්‍රීතුමා හොඳ මාතෘකාවක් ගෙනාවා. ඒකට කරුණු එකතු කරන්න හදන්නෙ. සමන් මන්ත්‍රීතුමා කිව්වා. වීථි ලාම්පු ඔක්කොම සම්පූර්ණ ගලවගෙන ගිහිල්ලයි කියලා. මම ඒ ගැන කණගාටු වෙනවා. පහුගිය දවස්වල පාරවල් සංවර්ධනය කිරීමෙදි, රජය විසින් අහිංසක මිනිස්සුන්ගේ බදු සල්ලි වලින් බෝඩ් එකක් සවි කළාම, ඒ බෝඩ් එකේ අයිතිය තියෙන්නෙ කාටද කියන එක ගැන සභාවේ ලේකම්වරිය දැනුවත් නැහැ. ඊයෙ රාත්‍රී බෝඩ් එක ඉවත් කරල තියෙනකොට මට ඒ ප්‍රදේශයෙන් දුරකතන ඇමතුමක් දෙනවා. බෝඩ් ගලවලයි කියලා. එතකොට මේක හොරකමක්. මේක අයිති ප්‍රාදේශීය සභාවට. ඒ පිළිබඳව මම සභාව දැනුවත් කරනවා. මේ මොහොත වෙනකම් මම හිතන්නෙ ක්‍රියාත්මක වෙලා නැහැ. මම අදාල නිලධාරියා දැනුවත් කරනවා. ඒ නිලධාරියා ක්ෂණිකව එතනට යනවා. ඊට පස්සෙ මම කිව්වා ලේකම්තුමියගෙන් උපදෙස් ගන්න. මෙතන සිදු වෙලා තියෙන්නෙ රුපියල් 10000 ක විතර අලාභයක්. මේ බෝඩ් එක ගලවල තියෙන්නෙ. ඒක හොරකමක්. මේක සභාව සතු වත්කමක්. මේකට රාජකාරි කරන්න කියලා. මේ හොරකම අල්ලන්න පුලුවන්. මේ බෝඩ් එක අපට ප්‍රශ්නයක් නෙවෙයි. එවකට අපේ ආණ්ඩුව නෙවෙයි ඊටත් එහා ආණ්ඩුවල හයිකරපු බෝඩ් අපේ පළාත්වල

තියෙනවා. කවදාවත් අපි අත තියන්න කියල නැහැ. ඒ වගේ දෙකයි පනහෙ දේශපාලනේ අපි කරන්නෙත් නැහැ. නැවත මෙහේට දැනුම්දෙන විට මෙහේ සාකච්ඡා වෙමින් පවතිනවා. ඊට පසු දින මට සැකයක් තියෙනවා. සභාපතිතුමා මේ ගැන දන්නවද කියලා. මම ඇහුවා සභාපතිතුමා දැනුවත් කළාද කියලා. මම සභාපතිතුමාගෙන් අහනවා. සභාපතිතුමා කියනවා මම දන්නෙ නැහැ කියලා. ඇත්තටම මෙහේ නිලධාරියගෙ වගකීමක්. අදාල නිලධාරියා පැය 24 ක් යන්න කලින් මම විසින් දැනුවත් කරනවනම්, ඒක ලේකම් සහ සභාපතිවරයට ඊට පස්සෙ දැනුවත් කරන්න. ඊට පස්සෙ මම කියනව මේක පොලීසියෙ ගිහිල්ල පැමිණිල්ලක් දාන්න. ආයෙත් ගමේ අයෙකුගෙන් දුරකතන කෝල් එකක් එනවා මොකද අපට ලැජ්ජයි. ඇත්තටම මොකද මේ නිහැඩියාව. මේ බෝඩ් එකට අයිතිකාරයෙක් නැද්ද? මේක සභාව සතුයි. පාරක් සංවර්ධනය කරන්න සභාවෙන් අපි ප්‍රාදේශීය ලේකම්ට අවසර දෙනවා. සංවර්ධනය කරල ඉවර වුනාට පස්සෙ, රජය විසින් රජයේ මුදල් වලින් ඒකට බෝඩ් එකක් සවි කරනවා. ඒක අයිති වෙන්නෙ කාටද? ඒක අයිතිවෙන්නෙ සභාවට. මේ උත්තරය හොයා ගන්න මේ ආයතනයේ ඇත්තටම කිසිම නිලධාරියෙක් හිටියෙ නැහැ. ඊට පස්සෙ මම අමාත්‍යාංශ ලේකම්වරයට කතා කරනවා. එතුමා එතකොට එළියෙ හිටියෙ. මම කිව්වා මේ වගේ සිද්දියක් වෙලා තියෙනවා. තවමත් මේකට තීන්දුවක් ගත්තෙ නැහැ කියලා. ඕක තීන්දුවක් අහන්න දෙයක්ද? බෝඩ් එක රජයෙන් වියදම් කළ මුදලක් නම්, එක්කො සභාවට නැත්නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. ඊට පස්සෙ මට කියනවා. මම එළියෙ ඉන්නෙ. සහකාර කොමසාරිස්වරයට කියන්න කියලා. මම සහකාර කොමසාරිස්වරයට ගන්නවා. එතුමා අසුනෙ නැහැ. ඊට පස්සෙ මම ඒකෙ ප්‍රධාන ලිපිකරු සී සී දේශානි මහත්මියට කතා කරනවා. ඊට පස්සෙ අද සභාව නිසා ඊයෙ උදේ ඇහුවා. මොකක්ද මේකට තමුන්නාන්සෙලා ගනිපු තීන්දුව කියලා. එයාලත් සත පහකට ගණන් ගනිපු විත්තියක් නැහැ. එතුමිය කියනවා මෙහේට දැනුම් දීල ඇති කියලා. මේක එලව එලව ගිහිල්ලා මට කියන්න අවශ්‍යතායක් නැහැ කියලා මම කිව්වා. සිදු වුන හොරකම පිළිබඳවත්, එදා පාන්දර වදුරඹ පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් සටහන් කළානම්, මට පොලිස් ස්ථානාධිපතිවරයට කතා කරල කියන්න තිබුනා. මෙන්න මේක හොයා ගන්න ක්‍රමේ කියලා. එහෙමනම්, තවත් එක බෝඩ් එකක්වත් ගැලවෙන්නෙ නැහැ. ඒවගේම ආයතනයේ නිලධාරීන් දැනුවත් කරන්න ඕන. මේ පඩි ගන්නෙ කාගෙන්ද? මේ දීමනාව ගන්නෙ කාගෙන්ද? මේව හයිකරන්නෙ කවුද? මේ යන හැම ඩීසල් කලදක්ම යොදවන්නෙ කවුද? කාගෙද? කියන එක දැනුවත් වෙන්න ඕන. අන්න ඒ වගේ නිලධාරි මඩුල්ලක් ඉන්නෙ. අන්න ඒක නිසා ඉතාමත්ම කණගාටුදායකයි. මේ මොහොත වෙනකොටත් පොලීසියෙ පැමිණිල්ලක් නැහැ. මට ඇත්තටම මේකට කවුරු හරි බලපෑමක් කළාද කියලා සැකයක් ඇතිවෙනවා. එහෙම බලපෑමක් වෙලා නැහැ. ඒක නිසා මම කණගාටු වෙනවා. මේ වෙලාවෙ මේ ප්‍රාදේශීය සභාවක් කියන එකේ වගකීම රංජිත් මන්ත්‍රීතුමා කියනවා උප්පත්තියේ සිට මරණය දක්වා මේ වගකීම මොකක්ද කියන එක. මේ නිලධාරීන් විශේෂයෙන්ම මේකෙ පනතක් තියෙනව. කරුණාකරල අධ්‍යනය කරන්න කියන්න. මොකද මේ වගකීම් සම්භාරය මොකක්ද කියන එක ගැන දැනුවත් වෙලා තමයි මෙතනට එන්න ඕන.

ගරු සභාපතිතුමනි, පක්ෂය ගැන මට අවශ්‍යතාවයක් නැහැ. සත්‍ය වෙනුවෙන් පෙනී හිටින්නෙ. එම් එම් දිසානායක ගරු මන්ත්‍රීතුමා, එතුමගෙ කොන්ක්‍රීට් කරපු පාරක් උඩ පස් දැමීම පිළිබඳව කාරනාවෙදි මම දැනගන්න කැමතියි. මේ මොහොත වෙන කොට නිලධාරියෙක් ගිහිල්ලා මොකක්ද වෙලා තියෙන්නෙ. ඒ පස් ඉවත් කළාද? ලක්ෂ පහක එහෙම නැත්නම් ලක්ෂ දහයක ප්‍රතිපාදන වෙන් කරල තියෙන්නෙ. මාර්ග සංවර්ධනය කරන්න කියලා එහෙම සංවර්ධනය කරපු මාර්ගයක් උඩට ගමේ කවුරු හරි ගිහිල්ල පස් කන්දක් හලනව නම්, ඒක වැරදියි. මේ මොහොත වෙන කොටත් ක්‍රියාත්මක වෙලා නැහැ කියන එක මම දිසානායක මන්ත්‍රීතුමාගෙන් දැන ගත්තා. එහෙමනම් නිලධාරින්ට ගමන් ගාස්තු ඉදිරි ගෙවීම් වාර්තාවේ තියෙනව. දීමනා 5000 යි. 5500 යි 4000 යි. 4500 යි. හැම මාසෙම ගෙවීම් වාර්තාව මෙතනට එනවා. එහෙමනම් මෙයාල මේ මොකක්ද කරන්නෙ? සභාවට ඇවිල්ලා

මාසයක් වෙනවා. අපේ වගකීම තියෙන්නෙ සභාවෙ මේව යෝජනා කරලා, ඊලග සභාවාරෙට වාර්තාව එවන එක නෙවෙයි. වාර්තාවෙ සටහන් වෙච්ච දේ, එම් එම් දිසානායක ගරු මන්ත්‍රීතුමා නිසා හොඳයි. මගේ යෝජනාවට මොකද වුනේ කියලා ප්‍රශ්න කෙරුවෙ නැහැ. එහෙමනම් ගරු සභාපතිතුමනි, මේ නිලධාරි තුන්දෙනයි, පස්දෙනයි, එදා මේ මුලු සභාවෙම හිටියෙ ඔබතුමත් හිටියා. නියෝජ්‍ය සභාපතිතුමා හිටියා. අපේ හිටපු සභාපතිතුමා හිටියා. අපි එදා වැඩ කෙරුවෙ මෙතන මේ සීට් ගානට නිලධාරීන් හිටියෙ නැහැ. මෙච්චර විශාල වෙලා තිබුනෙ නැහැ. මන්ත්‍රීවරු 13 දෙනයි. කාර්යය මණ්ඩලය හොඳටම ඕන්නම් 10 ක් ඉන්න ඇති. ඇත්තටම මම ආඩම්බර වෙනවා. එදා ඒ නිලධාරිනුත්, ඒ මන්ත්‍රීවරුනුත් වගකීම මොකක්ද කියන එක දැනගෙන හිටියා. අද මේ මන්ත්‍රීවරුන් ඇවිල්ල කතා කරනවා. පරිගණක තියෙනවා. එවැනි දියුණු යුගයක අද මේ බෝඩ් එකක අයිතිකාරය හොයා ගන්න, මේ ප්‍රතිපාදන කවුද යොදවන්නෙ කියල හොයා ගන්න, මොනව හරි දෙයක් නැතිවුනාට පස්සෙ උත්තර දෙන්න විදිහක් නැහැ. මේ දැන් මේ සිදුවුන හැම සිද්ධියක්ම බලාගෙන හිටියා. එදා හිතන්න ඇති අර කොම්පෝසට් පොහොර නැතිවුනාම වාර්තාව හරිය කියලා. මට මේකෙ එල්ලිල යන්න ඕන නැහැ දැන්. සභාපතිතුමාට හැකියාව තියෙන්න ඕන. මම අභියෝග කරනවා. පුලුවන්නම්, ඒ කොම්පෝස්ට් පොහොර පිළිබඳව ඒ ලිපි ගොනුව තියෙන නිලධාරියා ගෙන්නලා දැන් අහන්න. ගිය සතියෙ සිකුරාද වෙන කොට කොපමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරල තිබුනද කියලා. ඒක තමයි ආයතනයක් කියන්නෙ. දිනපතා එහෙම නැත්නම් දවස් දෙකකට සැරයක් යාවත්කාලීන වෙන්න ඕන. මෙතන අලෙවිය පිළිබඳ වාර්තාව තියෙන්න ඕන. මම එදා ඕව ප්‍රශ්න කරන්න ගියෙ නැහැ. සියලු දෙනා හිර වෙනවයි කියලා මම දැනගත්තා. මේ විදිහට මේ ගමන යන්න බැහැ. අද තමුන්නාන්සෙලගෙ ආණ්ඩුවක් තියෙන්නෙ. මම මීට වැඩිය තමුන්නාන්සෙලගෙ කාලය ගන්න යන්නෙ නැහැ. නමුත් මේ කතා කරන දේවල්වලත්, අපි යෝජනා කරන දේවල්වලත්, මේ සියලුම දේවල්වල අපි බලාපොරොත්තු වෙනවා. මොනව හරි ප්‍රතිඵලයක්. තමුන්නාන්සෙලා මතකතියා ගන්න සමහර වෙලාවට මේ සභාපතිවරයා වෙන්න පුලුවන් තමුන්නාන්සෙලගෙ මේ සැරේ මන්ත්‍රී අසුනක් තියෙන කෙනෙක් සභාපති වෙන්න පුලුවන්. මේ ගමන් මග වහාම නිවැරදි කර ගත යුතුයි. අහිංසක මනුස්සයෙක් මෙතනට ආවොත්, අහිංසක මනුස්සයෙකුට උත්තරයක් දෙන්නෙ කොහොමද? අදාල නිලධාරියෙක් ගාවට ගියාම මේක අපි කරගන්නෙ කොහොමද කියල ඇහුවම ඒ උදවිය හිර වෙනවා. එහෙමනම් ඒ දැනුම තියෙන්න ඕන ඒ පිළිබඳවත් මතක් කරනවා. තමුන්නාන්සෙට මේ විදහට කටයුතු කරන්න බැහැ. නිලධාරි හිටියට වැඩක් නැහැ. පුටු තිබුනට වැඩක් නැහැ. දීමනා ගත්තට වැඩක් නැහැ. අහිංසක මිනිස්සුන්ගෙ සල්ලි. වැඩ පෙන්නන්න ඕන. මේ අවුරුදු දෙකේවත් අපේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබුනෙ පහුගිය කාලෙ. දැන් තමුන්නාන්සෙලගෙ ආණ්ඩුවක් තියෙන්නෙ. තමුන්නාන්සෙලට හොඳ වැඩ ටිකක් පෙන්නන්න පුලුවන්. හොඳ වැඩපිළිවෙලකට යන්න පුලුවන්. අපි කොච්චර සහයොගෙ දෙන අවස්ථා තියෙනවද? ඒක නිසා ඒකෙ ප්‍රතිඵල භුක්ති විඳින්න කියල තමුන්නාන්සෙගෙන් අවසාන වශයෙන් මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම පළාත් සභා මාතෘකාවෙදි මම මගේ පෞද්ගලික මතය ඉදිරිපත් කළා. මම දීර්ඝ වශයෙන් ඒ පිළිබඳව කතා කරන්නෙ නැහැ. පළාත් සභා පළාත් පාලන ආයතන අද ඇත්තටම නඩත්තු කරන්න යන සල්ලිවලින් අහිංසක පාසල් දරුවන් සිය දහස් ගණනකට කිරි වේලක් දෙන්න පුලුවන්. හොඳ කෑම වේලක් දෙන්න පුලුවන්. ගමේ මන්ත්‍රීවරයො ඉන්නවා. මෙයාලට යන කලදසාව මොකක්ද? ඒක තමයි දැන් ඒ කට්ටිය කල්පනා කරන්නෙ. අපේ කට්ටියත් කල්පනා කරනවා, අපට යන කලදසාව මොකක්ද? අපට ප්‍රශ්නයක් නැහැ. අපි බලන්න ඕන එක පුද්ගලයෙක් දිහාද? එහෙම නැත්නම් අනාගත පරම්පරාව දිහාද කියන එකයි අපි දැනගන්න ඕන. අපි ඡන්දෙ ඉල්ලුවා. අපි පළාත් සභා හරිය කිව්වා. ඒ වුනාට පස්සෙ තමයි තේරුනේ, මේ ක්‍රමය තේරුමක් නැහැ කියලා. ඒක නිසා මේ පළාත් සභාව තවදුරටත් මේ රටට අවශ්‍ය වෙන්නෙ නැහැ. දැන් හොඳ ශක්තියක් තියෙන තුනෙන් දෙකක ආණ්ඩුවක් තමුන්නාන්සෙලට තියෙනවා. මේ පළාත් සභා, දිසාපතිතුමන්ලා, රාජ්‍ය නිලධාරීන් අපි කියන්නෙ

නැහැ 100% ක් හරි කියලා. නමුත් හරි දැක්මක් තුල රටේ නායකයා ගමන් කළොත් මම හිතනවා ප්‍රතිඵල ගන්න පුලුවන්. හැබැයි අවසාන වශයෙන් මම යෝජනාවක් කරනවා. තමුන්නාන්සෙලයි ගෙවල්වල ජේ ආර් ජයවර්ධන මහත්තයගෙ පොටෝ එක ගහගන්න කියලා. ජේ ආර් ජයවර්ධන මහතා මරමු කියලා, ජේ ආර් ජයවර්ධන එලවමු කියලා, මේ පනත ගෙනාපු වෙලාවෙ පළාත් සභා විතරක් නෙවෙයි, මේ ව්‍යවස්ථාව හදන වෙලාවෙ කවුරුත් පාරට බැස්සා. අද එකක් නැර ඒ වගන්ති ටික තමයි මේ එකතු වෙන්නෙ. හෙට අනිද්ද වෙන කොට අපි හොඳ දේට හොඳයි කියනවා වගේම හොඳ හොඳ සෙල්ලම් මේ විසිවෙනි සංශෝධනයත් එක්ක තමුන්නාන්සෙලට දකින්න ලැබේවි. එදාට අපි කතා කරන්නම්. විසිවෙනි සංශෝධනය කියන්නෙ ආයිත් එක පවුලක් වටා එකතුවෙන එක පවුලක් රකින්න සූදානම් වනවාය කියන එක තමයි කියන්න තියෙන්නෙ. ඒ පිළිබඳව අද කතා කළ යුතු වෙන්නෙ නැහැ. තව කල් තියෙනවා. හෙට අනිද්දා මොන තීන්දුව ගනීද දන්නෙ නැහැ. මොකද තමුන්නාන්සෙලගෙ ගරු ජනාධිපතිතුමා මේක තව මාසෙකටත් ඉස්සරහට දාල තියෙන්නෙ. මම හිතන්නෙ මොන මොන සංශෝධන එයිද දන්නෙ නැහැ. ඒක නිසා එකින් එක අපි එදාට විග්‍රහ කරන්නම්. අන්න ඒ නිසා හොඳ දේ හොඳයි කියන්න වගේම, මේ රටට කන කොකා අඬන දවසත් වැඩි ඈතක් නෑ කියන එක මේ විසිවෙනි සංශෝධනය තුලින් තමුන්නාන්සෙලට මතක් කරමින්, තමුන්නාන්සෙලා මේ යන ගමන සාරථක වෙන්න කියලා, බලාපොරොත්තු ඉටු වෙන්න කියලත්, අපි ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, අපි ප්‍රාදේශීය සභා මට්ටමින් ගත්තොත් නාගොඩ ප්‍රාදේශීය සභාව මීට වැඩිය ශක්තිමත් විය යුතුයි. මීට වැඩිය දැක්මක් තිබිය යුතුයි. මීට වඩා වැඩි ගමනක් යා යුතුයි. මේ වගේ පැමිණිලි එන්නෙ නැහැ. මොකටද මේව කරන්නෙ මීට වැඩිය කතා කරන්න මගේ බලාපොරොත්තුවක් නැහැ. තමුන්නාන්සෙලට ජය හා සතුට පිරිනමමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමනි, ලොකු ප්‍රශ්නයක් අපේ කොට්ඨාසෙ පාරක් පිළිබඳව පසුගිය දවස්වල කොස් ගහක් කඩාගෙන වැටිල පාර ගලවගෙන ගිහිපු එක පිළිබඳව, මම ඔබතුමන්ට දුරකතනයෙන් දැනුම් දුන්නා. මම ඔබතුමන්ට ස්තූතිවන්ත වෙනවා මොකද තාක්ෂණ නිලධාරියෙක් ඒ ස්ථානයට යවලා, ඒ පිළිබඳව සොයා බලලා, ඒ පිළිබඳව ගන්න ඕන තීන්දු තීරණ මේ වෙන කොට අරගෙන ඇති කියලා මම හිතනවා. නමුත් මම අද උදෑසන මම නිවසෙ හිටියෙ නැහැ. අද උදෑසන මම එන්න කලින් ඒ ස්ථානයට ගිහිල්ල පොටෝ දෙකක් ගහගෙන ආවා. හැබැයි මට තාක්ෂණ නිලධාරීතුමිය සමග කතා කිරීමේදී, මට දැනුනෙ මේ කානුව කැපීම තුලද මේ කොස් ගහ ගලවන් වැටුනද පාරට හානියක් වෙලාද කියන එක එතුමියට කියන්න බැහැ. නමුත් මම තාක්ෂණ නිලධාරියෙක් නෙවෙයි. නමුත් මට දැනෙන විදිහට නම් එතනදි ඒ මිනිස්සු අසරණ කරල තියෙන්නෙ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම නිලධාරීතුමිය, ඒ කානුව තිබුනට වැඩිය ගැඹුරට කපනවනම්, ඒක ඒ පාරට ටිකක් එහාට කරල කප්පවන්න ඕන. එහෙම කපන්නෙ නැතුව කෘෂිකර්ම නිලධාරි තුමිය කිව්වලු ඒ තිබුන එක මෙතනින්ම කපන්න ඕනෙයි කියලා. හැබැයි එතුමියට තිබුනා එතුමියත් තාක්ෂණ නිලධාරියෙක් නෙවෙයි. මොකද කෘෂිකර්ම නිලධාරිට ඒ දැනුම නැහැ. ඒ නිසා එතුමියට තිබුනා කාගෙ හරි සහය පතලා කටයුතු කරන්න. අද පාරට විශාල හානියක් සිදු වෙලා තියෙනවා. තව වර්ෂාවල් දෙකක් ආපු ගමන් වාඩියකන්දට යන්න බැරි වෙනවා. දැන් මේ වෙන කොටත් ඒ පාරෙන් කොටස් ගලවගෙන ගිහිල්ලා තියෙන්නෙ. ඒක නිසා ඔබතුමාට දැන් උදේ මම කතා කළාට පස්සෙ ඒ කුඹුරු හිමිය මට කිව්වා ඕන විදිහකට මම කාණුව කපන්න කැමතියි. මගේ අතින් නෙවෙයි මේ වරද සිදු වුනේ. රජයේ නිලධාරියෙක් ගෙන් සිදු වුනාය කියන එක එතුමා මට පැහැදිලි කරල තිබුනෙ. එතකොට ගොවිජන සේවා එකට ලිපියකින් ඔබතුමා අහන්න මේ මාර්ගය අසල කානුව කැපුවෙ කොහොමද? මොකද මෙච්චර ගැඹුරට කානුව කපද්දි මේ මාර්ගයට හානියක් වෙනවා. එහෙම නම් ඇයි ඔබ තාක්ෂණ

නිලධාරිගෙ සහය ගන්නෙ නැතුව ඔබ මේක ඉටු කිරීමට ඉඩ දුන්නෙ කියලා. මම එතනදි තව එකක් දැක්කා. නමුත් ඒක මෙතනට අදාල නැති වුනත් කුඹුරු ගොඩ කිරීමක් පිළිබඳව මට එතනදි පේනවා. මොකද ඒ නිලධාරියා කරවලා තියෙන්නෙ, ඒ වේල්ල පළල් කරන්න වෙලට ගොඩ පස් දාල තියෙනවා. මම ගොවිජන සේවා එකේදි ඒ ප්‍රශ්නෙ කතා කරන්නම්. නමුත් ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. ඒ පාරෙ ආරක්ෂාව තකා කඩිනම් පියවරක් ගන්න ඕන. නැත්නම් මොකද ගොඩ කරපු පොලවක් තියෙන්නෙ. ඒ පාරෙ කොන්ක්‍රීට් එක කඩල ගියාට පස්සෙ,ඊට වැඩිය හානියක් සිදුවෙන නිසා, ඒ පිළිබඳව සොයා බලා ඒ අදාල පාර්ශවයන් වෙත දැනුම් දී, ඉක්මන් තීරණයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඒ ප්‍රදේශයට ග්‍රාම නිලධාරිතුමිය මේ වෙන කොට ගිහිල්ලා කොස් ගහ ගැන තීරණයක් අරගෙන තියෙනවා. දැව සංස්ථාවට යොමු කිරීමට තීරණය කරල තියෙනවා. ඒ පිළිබඳව මම දන්නවා. ඒක සභාව සතු පාරක්. ගස සභාවට අයිතියක් නැහැ. මම හිතන්නෙ ඒක රාජ්‍ය දේපොලක් හැටියට දැව සංස්ථාවට තමයි අයිති වෙන්න ඕන. ඒක ගැටලුවක් නැහැ. කාට අයිති වුනත් අපේ පාර කැඩීගෙන යන එක වලක්වා ගැනීමට ඔබතුමා කටයුතු කරන්න කියලා, මම ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම, එම මාර්ගයේම නයි ගුලන කියන ස්ථානයේ දැන් බෝක්කුව කැඩිලා. දැන් ගොඩක් කාලයක් වෙනවා. ඒකට වසන්ත මන්ත්‍රීතුමත් විවිධ අදහස් දැක්වුවා. මමත් ඉල්ලීම් කරල තිබුනා. එතනට සිලින්ඩරේ තියෙනවා. සිලින්ඩරේ යටින් වතුර පාර ගිහිල්ලා තමයි, ඒ සිද්දිය වෙලා තියෙන්නෙ. ඊට එහා පැත්තෙත් එහෙම සිද්දියක් වෙලා. පාසල් බස් රථ යන නිසා මම ඉතාමත් ඉක්මනින් ඒක කඩලා, ඉවත් කරලා, ඔබතුමාගෙ අවසරය මත ඒ කටයුතු සිදු කළා. මෙතනටත් ඒ විදිහට සභාවේ තාක්‍ෂණ නිලධාරී යවලා ඒ පිළිබද හොයල බලලා කටයුතු කරන්න ඕන. මොකද බෝක්කුව අස්සෙ කවුරු හරි වැටුනොත් ඒකෙ වගකීමත් අපට දරන්න වෙනවා. මොකද මෙතෙක් කාලයක් අපට පැමිණිලි කරලා. අපි ඒක කළේ නැහැ කියන චෝදනාව එන නිසා. ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. නැවත තාක්‍ෂණ නිලධාරියෙක් එතනට යවලා ඉවර වෙලා, ඒකට අවශ්‍ය වෙන අදාල පියවර අරගෙන එම සිලින්ඩරේම එතනට යොදවන්නපුළුවන් කියලා. ඒ සඳහා පස් කියුබ් දෙක තුනක් වගේ තමයි යන්නෙ. ඒක නිසා ඒක සොයා බලලා, ඒ කටයුතු කරන්න කියලා, මම ඔබතුමාගෙන් ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ සභාවෙ මන්ත්‍රීවරු විහිලු කරනවා. දැන් ඒක නිසා ඒකටත් පොඩි උත්තරයක් දීල වාඩි වුනානම් හොඳයි. මොකද අපේ ගයන්ති මන්ත්‍රීතුමිය මම අර ගම්මිරිස් ඇදයට තියාගෙන ඉන්නවයි කිව්ව එක සිහිපත් කළා. ඇත්තටම මන්ත්‍රීතුමිය හරි සතුටුයි. මොකද කහ තිබුනෙ නැහැ. පහුගිය කාලෙ කහ 5000 යි. හැබැයි තුනෙන් දෙකේ බලයක් දුන්නනෙ. ඒ කාලෙ සීනි 80 ට තිබුනා. දැන් 145 යි. ඒත් තුනෙන් දෙකේ බලයක් දුන්නා. ගම්මිරිස් ටික තවම මගේ ඇදයට වුනත් කමක් නැහැ. ඒත් තුනෙන් දෙකේ බලයක් දුන්නා. ඇයි මේ මිනිස්සුන්ට මොනවද ඕන වෙලා තියෙන්නෙ, අපටත් හිතාගන්න බැහැ. මේ මිනිස්සුන්ටමොනව වෙලාද කියලා. බඩු මිළලු. ඔය අයට තමයි මාර ප්‍රශ්න. හැබැයි අපට ප්‍රශ්නෙ ඇයි මේ තුනෙන් දෙකේ බලයක් දුන්නෙ. මිනිස්සු වෙනසක් හොයනවා. ඒකට මන්ත්‍රීතුමාලා කලබල වෙන්න එපා. මෙතන කතා කරන්න වුවමනා දෙයක් නෙවෙයි. මෙතන මම නිතරම කතා කරන්නෙ මගේ ගමේ සංවර්ධනයට. නමුත් ඔබතුමාලා මේක අහන නිසා මම මේ කියන්නෙ. ඉවසලා ඉන්න අවුරුදු පහකට බලය දීල තියෙනවා. අපේ කාලෙ කරන්න බැරිවුනේ විවිධ පක්‍ෂත් එක්ක අපට කටයුතු කරන්න තිබුන නිසා. හැබැයි දැන් අපට ඉස්සරහ අවුරුදු දෙකේදි ඒ ශක්තිය අරගෙන මේ ගමට කරන්න ඕන වැඩේ අපි කරනවා. එහෙමනම් මම ඔබතුමියලගෙන් ඉල්ලා සිටින්නෙ, ගම්මිරිස් ටික තව ටිකක් තියන් ඉන්න. ලංකාවට ගේන ඒවා සේරම නවත්වලා තියෙන්නෙ. අපේ නිෂ්පාදනවලට තැනක් දෙන කාලය එනවා. ඉස්සරහට ඒ ගැන සතුටු වෙන්න කියලා කියනවා.

චන්ද්‍ර සහබන්දු හිටපු සභාපතිතුමා, ඔබතුමාට දැනෙනවා ඇති. යම් දෙයක් මේ රටේ හොඳට වෙනවා කියලා. අන්න ඒකට අකුල් හෙලන්න එපා. අකුල් හෙලුවත් වැඩක් නැහැ. 19 හොඳයි, 20 හොඳ නැත කියනවා. බලමු 19 යද 20 ද හොඳ වෙන්නෙ කියලා. අපිට ඒක ඉදිරියෙදි දැනගන්න පුළුවන්. මෙච්චර කාලයක් 13 ත් ඇවිල්ලා මේව කර ගන්න බලයක් තිබුනෙ නැතුව හිටියෙ. දැන් තමයි සිංහල බෞද්ධ ඡන්ද ටික ඇවිල්ලා, 13 ත් පැත්තකට දාන්න පුලුවන්. 19 ත් පැත්තකට දාන්න පුලුවන් බලයක් අපට ලැබිල තියෙන්නෙ. එහෙමනම් මිනිස්සු හෙච්චෙ අන්න ඕක. කහ හෙච්චෙත් නැහැ. සීනි හෙච්චෙත් නැහැ. ගම්මිරිස් ටික ඇදයට කුනු වුනත් කමක් නැහැ. එහෙමනම් අපට හොඳ අනාගතයක් බිහිවෙනවා. අපට හොඳ රජෙක් බිහිවෙලා තියෙනවා. ඒ රජතුමාගෙ පවුල කියලා කට්ටිය කියනවා. ඒ පවුල හැදුනත් කමක් නැහැ. ඒ තුනෙන් දෙක දුන්නා. අපි පවුලහරි හදාගෙන රට හදන්න, ඔබේ සහයෝගය දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී වසන්ත තුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා, සභාවෙ ලේකම්තුමිය ප්‍රධාන සියලු දෙනාගෙන් අවසරයි. මම පළමුවෙන්ම පහුගිය දවස්වල අභාවයට පත්වුන අපේ උප සභාපතිතුමාගෙ දයාබර මෑණියන් වෙනුවෙන් අපේ සංවේගය පළකරනවා. මොකද හදිසි අවශ්‍යතාවයක් නිසා ගමෙන් බැහැරව සිටිය නිසා මට ඒ මළගම වෙන දිනයේ අවසාන අවස්ථාවෙ සම්බන්ධ වෙන්න වුනේ නැහැ. මොකද හොඳ පුතෙක් හදලා, උඩලමත්තෙ විතරක් නෙවෙයි, මුලු නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටම අපේ ජනතාවට සේවය කරන්න, ඒ ජනතාවගේ පැසසුම් ලබන්න පුලුවන් තත්වයට දරුවෙක් හදලා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූරය දක්වා ප්‍රාදේශීය සභාවෙ උප සභාපති ධූරය දක්වා රැගෙන යන්න, එතුමිය ඒ බිහිකරලා, ලේ කිරි කරලා පොවපු, ඒ කිරිවල ගෞරවය තියන්න පුලුවන් හොඳ දරුවෙක් මේ සමාජ ගත කිරීම නිසා, ඒ දයාබර මෑණියන්ට අපේ සංවේගයත්, එතුමියට නිවන් සැප ලැබේවායි කියලා, මේ වෙලාවෙ ඉතාමත්ම ගෞරවයෙන් ප්‍රාර්ථනය කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වගේම දීර්ඝ කාලයක් දේශපාලන අත් දැකීම් තියෙන කෙනෙක් හැටියට, ඔබතුමන්ට බොහොම ගෞරවයක් විදිහට, සභාවේ පහුගිය කාලවකවානුව තුල, ඔබතුමන්ට, ඔබතුමන්ගෙ වැඩකටයුතු, මේ සභාවේ පරිපාලන කටයුතු, පිළිබඳව බොහොම වුවමනාවෙන් බලාගෙන හිටියා. නමුත් සභාපතිතුමනි, ඔබතුමාට මීට වැඩිය මේ පිළිබඳ අවදානය යොමු කරන්න පුලුවන්. අපි දැක්කා පහුගිය කාලෙ ඉදලම යම් යම් සභාවාරවලදි ඔබතුමාගෙ මේ පරිපාලන කටයුතු පිළිබඳව යම් යම් චෝදනා එල්ල වෙනවා. හැබැයි අපි කණගාටු වෙනවා පළාතෙ කට්ටිය හැටියට අපි බලාපොරොත්තු වුනේ ඕක නෙවෙයි. ඔබතුමාගෙන් ඔබතුමා හොඳ දක්ෂ සභාපතිවරයෙක් හැටියට ඒ වගේම ඉතාමත්ම බොහොම සූක්ෂම විදිහට මේකෙ පරිපාලනය ගෙනියයි කියලා තමයි අපි බලාපොරොත්තු වුනේ. නමුත් සභාපතිතුමනි, අපේ චන්ද්‍ර සහබන්දු හිටපු සභාපතිතුමන් කිව්ව වගේ, ගොඩාක් මන්ත්‍රීවරු කතා කළා. ඊලග සභාවාරෙ සිට මේ සභාවෙ කටයුතු පිළිබඳ ඔබතුමන් මීට වැඩිය යම් කිසි මට්ටමකට ඒ පිළිබඳ අවදානයක් යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම මේ වෙලාවෙ වැඩිය කරුණු කාරණා නොකියා කෙටියෙන් කතා කරනවා. සභාපතිතුමනි, මොකද අපට මේ වගේ දිගින් දිගටම අපේ සභාවෙ මන්ත්‍රීවරුන්ට කතා කරන්න සිදු වෙන කොට අපට කණගාටුවක් ඇති වෙනවා. අපි හිතුවා ඔබතුමාගෙ ඒ දක්ෂතාවයත් මත ඉදිරියෙදි පෞද්ගලික ලේකම් වරයෙක් හෝ ලගින් තියාගෙන, මෙන්න මේ සභාවෙ කරගෙන යන වැඩ කටයුතු වලට ඉතාමත් විධිමත් ආකාරයෙන් මුහුණ දෙන්න පුලුවන්. ඔබතුමා කාර්යය බහුල වෙන්න පුලුවන්. නමුත් මීට වැඩිය ඒ පිළිබඳ දැඩි අවදානයක් යොමු කරලා, ඊලග සභා වාරෙ සිට මේ මන්ත්‍රීවරුන්ට සභාවෙ කටයුතු පිළිබඳ ඔබතුමාගෙන් ප්‍රශ්න කරන්න ඉඩ තියන්නෙ නැතුව, වැඩකටයුතු කරන්න කියලා, මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, මම පහුගිය කාලෙ දිගින් දිගටම කතා කරපු ප්‍රශ්න ගානක් තියෙනවා එකක් තමයි මේ අයාලේ යන ගවයින් පිළිබඳව. ඔබතුමන්ලගෙ සෞභාග්‍යයේ දැක්ම ආරක්ෂා කරගන්න බැරුව අද අපේ පළාතෙ මිනිස්සු ඉතාමත්ම දුක්ඛිත තත්වයට වැටිල ඉන්නවා. අයාලේ යන ගවයින් මේ පැහිච්ච කුඹුරුවලට පැනලා, කුඹුරු තනිකර විනාශ කරන තත්වෙකට මුහුණ දීල ඉන්නවා. හැබැයි මේකෙ වගකිව යුත්තා කවුරුවත් නෙවෙයි නාගොඩ ප්‍රාදේශීය සභාව. අපි නැත්නම් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, පොලිස්ථානය මේ තුන්ගොල්ලට පුලුවන් මේක පාලනය කරන්න. දිගින් දිගටම අපි මේ පිළිබඳ ඔබතුමාගේ අවදානය යොමු කරන්න කතා කළත්, නමුත් මේ පිළිබඳ කිසිදු පියවරක් ගන්න ඔබතුමාට හැකියාවක් ලැබුනෙ නැහැ. මම කණගාටු වෙනවා. ඒ අතින් ඔබතුමා මේ පළාතෙ ඉන්න ප්‍රධාන පුරවැසියා ඔබතුමාට බලය තියෙනවා. මේ පිළිබඳව ඕනම තීන්දුවක්, තීරණයක් ගන්න. මොකද අද මාපලගම හන්දියට ගියාට පස්සෙ අර අයාලේ යන හරක් 150 ක් 200 ක් හන්දිය පුරා ඉන්නවා. ඊයෙ පෙරේදා අපේ පැත්තෙ ගෙදරකට පැනලා, අහිංසක කිරි දරුවෙක් බිම දාගෙන හරක ඇනලා, කරාපිටිය ඉස්පිරිතාලෙ. අපේ ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමත් දන්නවා. මාපලගම ජනිත් ස්ටොර්ස් අසල. මිදුලෙ තණකොල කකා ඉන්න හරක් ගාවට ගියාට පස්සෙ, එක හරකෙක් ඒ දරුව බිම දාගෙන ඇනලා. නමුත් වාසනාවට ගෙදර හිටපු කෙනෙක් යන්තම් කැගහල බේරගෙන තියෙන්නෙ. නැත්නම් ඒ දරුවා මරණවා. මේක දිගින් දිගටම තියෙන ප්‍රශ්නයක්. මම කතා කළා අපේ සභාපතිතුමාට. සභාපතිතුමා මට දීපු උත්තරේ තමයි ඒ හරක් අයිතිකාරයෙන්ගෙ පුලුවන්නම් නමයි ගමයි විස්තර ටික දෙන්නෙයි කියලා. අනේ සභාපතිතුමනි කොට්ඨාස 15 ට මන්ත්‍රීවරු 15 ක් ඉන්නවා. හැබැයි අපෙන් තොරතුරු ගන්නවට වැඩිය තමුන්නාන්සෙලගේ නියෝජිතයොන් ගෙන් ඒ විස්තර අරගන්නව නම් ඒක තමයි සුදුසු. මොකද මේවා කියලා මේවයින් මේ කටයුත්ත නිදහස් වෙන්න බැහැ. සභාපතිතුමනි, මොකද තමුන්නාන්සෙට පුලුවන් මේ හරක් ඕනනම් අල්ලලා, වෙන්දේසි කරලා, විකුණන්නත් පුලුවන්. වෙනත් ක්‍රියා මාර්ග ගන්නත් පුලුවන්. මොකද මේවා ජනතාවට දැඩි ලෙස පීඩාවට පත්වෙන ප්‍රශ්න. මොකද අපි පහුගිය කාලෙ තමුන්නාන්සෙලගෙ සෞභාග්‍යයේ දැක්මට දීපු අර බීජ ඇට පැකට් එක ගෙවල්වල වත්තෙ ඉන්දුවා. ඒක වැවෙන කොට, ඒකෙ අවශ්‍ය ඵලදාව ලබා ගන්න විදිහක් නැහැ. මොකද අර අයාලේ යන හරක් ඇවිල්ලා ඒවා සියල්ල විනාශ කරනවා. අපට රෑ දවල් දෙකේ බන්ඩක්කා ගහක් වම්බටු ගහක් ඉන්දලා නැත්නම් දඹල වැලක් ඉන්දලා මේක මුර කරන්න බැහැ. ඉතිං මේකෙ තියෙන ප්‍රධාන ප්‍රශ්නෙට තමුන්නාන්සෙලගෙ අවදානය යොමු කරන්න අපි නොයෙක් විට කිව්වා. නමුත් කෙරෙන්නෙ නැහැ. මම දන්නවා මට සමහර හරක් අයිතිකාරයො මට පෞද්ගලිකවත් කතා කළා. නමුත් ඒක නෙවෙයි වැඩේ තියෙන්නෙ තමන්ට කෙරෙන්න ඕන තමන්ගෙන් විය යුතු යුතුකම ප්‍රාදේශීය සභාව හැටියට කරන්න ඕන. ඒවගේම හරක් අයිතිකාරයොත් මොළයක් තියෙන මිනිස්සුනම් කල්පනා කරන්න ඕන. මේ දුක් විඳලා වගා කර ගනිපුවා, තමන්ගෙ හරක් රංචුවෙන් විනාශ වීමට ඉඩ නොදී තමන්ගෙ හරක් රැන බලාගන්න ඕන කියලා. නමුත් ඒ අය මග අරිනවා. දැන් ගොයම් පැහිලා තියෙන්නෙ. අර මම දැක්කා මාපලගම යායෙ හරක් ගිහිල්ලා, ගොයම් පොඩි කරලා තියෙනවා. මැෂින් එකෙන් කපන කොට අර පොඩි වෙච්ච ගොයම් කපන්න බැහැ. ඒ වගේ තත්වයක් තියෙන්නෙ. මේ පිළිබඳ තමුන්නාන්සෙගෙ අවදානය යොමු කරගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම තවත් එක ප්‍රශ්නයක් තියෙනවා. අයලේ යන සුනඛයින් නිසා අද මහපාරක යන්න විදිහක් නැහැ. ධර්මසිරි මන්ත්‍රීතුමා, ඒකත් අපේ ගමේ මුලටම තමයි කරදරයක් වෙලා තියෙන්නෙ. අද සිරිසුනන්ද ඉස්කෝලෙට ගිහිල්ලා පොඩි ළමයින්ට ගෙදර යන්න විදිහක් නැහැ. බල්ලො රෑනක් ඇවිල්ලා, පොඩි ළමයි වට කරගෙන කනවා. දැන් එක 10 ක් 15 ක් විතර පාරෙ යන මිනිස්සු කාලා. අපි පොලීසියට කතා කළා. සභාපතිතුමාට කතා කළා. පොලීසියෙන් කිව්වා එම් ඕ එච් එක දැනුවත් කරලා මොකක් හරි කරන්නම් කියලා. නමුත් තවමත් කිසිදු පියවරක් අරගෙන නැහැ. සභාවෙදි ඕවා කතා කරලා වැඩක් නැහැ. ගෙවල්වල සුරතලයට ඇති කරලා, අවසාන කාලෙ වෙන කොට මහ පාරට

තමයි ඒ ගෙවල්වලින් ඒ බල්ලො යොමු කරන්නෙ. ඉතිං මේ වගේ සුනඛයින් රංචු ගැසිලා පාරෙ යන මිනිස්සුන්ට කරන හිරිහැරය, කරදරය ඉතාමත්ම ඉහලයි. ඒක නිසා මේ පිළිබඳ සෞඛ්‍ය නිලධාරීන් හරහා සෞඛ්‍ය මධ්‍යස්ථාවල බෙහෙත්විදීම් වැනි කටයුතු කෙරෙනවා. ඒ වගේ වැඩසටහනක් හරි කරලා, අයාලේ යන බල්ලන් වඳ කරන්න හැකි ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙසත්, අදාල අංශ දැනුවත් කරන ලෙසත්, මම මේ වෙලාවෙ ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, අනවසරයෙන් මාලු වෙළඳම් කරන වෙළඳ කුටි පිළිබඳව ඔබතුමන් කතා කළා. මේ ප්‍රධාන මාර්ගයේ නැත්නම් අතුරු මංමාවත්වල විශාල ලෙස වෙළඳුන් බිහි වෙලයි කියලා, පහුගිය කාලෙත් මේ සභාවෙ සාකච්ඡා කෙරුනා. නමුත් මේ මගින් මේ සභාවට යම් ආදායමක් ගන්න පුලුවන් ක්‍රමවේදයක් අපි එදා කතා කළා. නමුත් ඒව ක්‍රියාත්මක වුනේ නැහැ. අද මේ සභාවෙ මාසික, වාර්ෂික බදු ගෙවන ව්‍යාපාරිකයො සිටිද්දි අනවසරයෙන් වෙළදාම් කරන ව්‍යාපාරිකයො  අති විශාල පිරිසක් බිහි වෙලා තියෙනවා. නමුත් මේ මිනිස්සු සාමාන්‍ය දිලිදු මිනිස්සු. මේ අය වෙළදාමෙන් අයින් කරන්න කියලා අපි කියන්නෙ නැහැ. නමුත් මේ අයගෙනුත් යම් බදු මුදලක් ගන්න ක්‍රමවේදයක් සකස් කරන්න. ලිඛිතව නැතුව මේ මාලු වෙළෙන්දන්ගෙන් නම් දෛනිකව වගේ අපට මුදලක් එකතු කරන්න පුලුවන්. ඒ වගේම අනවසර පොඩි වෙළඳ ව්‍යාපාර කරන කට්ටියගෙන් වාර්ෂිකව ඒ ගොල්ලන්ට ලිඛිතව නැතුව බදු මුදලක් ලබා ගන්න ක්‍රමවේදයක් සකස් කරන්න. මොකද නැත්නම් අනෙක් අයට යම් අසාධාරණයක් වෙන නිසා, මේ පිළිබඳ ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා ඉල්ලනවා .

ඒ වගේම ඔබතුමන් යෝජනාවක් ගෙනාවා. මේ ප්‍රදේශයේ වැලි අවශ්‍යතාවයන් පිළිබඳව. නමුත් සභාපතිතුමනි, අපි දන්නවා මේ මොකාටද එන්නෙ කියලා. මොකද මේ වැලි පිළිබඳ ප්‍රශ්නය මහින්ද රාජපක්ෂ අපේ වත්මන් අගමැතිතුමන්ගේ පහුගිය කාලෙ, එතුමන් රටේ නායකත්වයේ සිටින විට ගිං ගගට වෙච්ච හානිය පිළිබඳව අපිට මේ වෙලාවෙ සිහිපත් වෙනවා. ඉතාමත්ම සුන්දරව තිබ්බ්ව මේ ගිං ගග මිටියාවත, ඒ වගේම ඒ පරිසරයට කරපු පරිසර හානිය ඉතාමත් ඉහලයි. ඉතිං මම හිතනවා. ඔබතුමන් මේ වෙලාවෙ මේ වැලි අවශ්‍යතාවය පිළිබඳ සභාවට යෝජනාවක් ගෙනාවා මම හිතනවා මේ වෙලාවෙ පහුගිය කාලෙ ඉදලා දැන් වසර කීපයක ඉදලා මිනිස්සු තමන්ගෙ අවශ්‍යතාවයට වැලි යම් මට්ටමකින් ප්‍රදේශයේ වැලි කපලා, හෝදන වැලි පොලවල් වලින් තමයි ගත්තෙ.  ඉතිං ඒ වගේ යම් මට්ටමකට රජයේ නිර්දේශ මත ස්වාභාවික සම්පත් සුරකින ආකාරයෙන් ඒ වගේ යම් මට්ටමකට සරිලන ආකාරයට වැඩපිළිවෙලක් පහුගිය කාලෙ පහුගිය රජයෙන් විධිමත් බලපත්‍ර ක්‍රමයක් යටතේ සකස් කරල තියෙනවා. මම හිතනවා වැලිවල අවශ්‍යතාවය මිනිසුන්ට වැලි ප්‍රමාණය ලබා ගන්න ක්‍රමවත් වැඩපිළිවෙලක් හදල තියෙනවා. හැබැයි මේ ගිං ගගේ වැලි ගොඩදාල නැත්නම්, අපේ පළාත්වල තියෙන ඇලවල්වල වැලි ගොඩදැමීම කළොත් නැවත වාරයක් අර පහුගිය කාලෙ පහුගිය රජයේ අර රාජපක්ෂ අගමැතිතුමන්ගේ පහුගිය කාලෙ තිබ්බ්ව ආණ්ඩුවෙ වැඩපිළිවෙල නැවත ක්‍රියාත්මක කරන්න දැයි කියලා මට සැකයක් ඇති වෙනවා. නැවත වාරයක් මේ දිස්ත්‍රික් කමිටුව හරහා යොජනාවක් සම්මත කරගෙන, අපේ ප්‍රදේශයේ මේ පරිසරය විනාශ කරන වැඩපිළිවෙලක් ආරම්භ කරන්නදැයි කියලත් මේ වෙලාවෙ අපට සැකයක් ඇති වෙනවා.

ඒ වගේම සභාපතිතුමනි, මම පළාත් සභා ගැන කතා කරන්න යන්නෙ නැහැ. මොකද පළාත් සභා ගෙනාවෙ එක්සත් ජාතික පක්ෂය තමයි. ඔබතුමන්ලා දිගින් දිගටම කතා කළා. නමුත් ඒ පළාත් සභා ගෙනාවෙ අපේ රටේ ජනවාර්ගික ප්‍රශ්නයේ යම් මට්ටමකට විසඳුමක් ගේන්නයි. දැන් මම හිතනවා ජනවාර්ගික ප්‍රශ්නය යම් මට්ටමකට විසඳුමකට ලක් වෙච්ච මොහොතක, අපි දැන් මේ වෙලාවෙ අපි පළාත් සභා ක්‍රමයට විරුද්ධයි කියලා අත උස්සලා, ඔබතුමාට විරුද්ධත්වය ප්‍රකාශ කළේ, මොකද දැන් පළාත් සභා ක්‍රමය නෙවෙයි. දැන් ඊට එහා ගිය අලුත් දේශපාලන ගමනක් එක්ක ප්‍රාදේශීය සභාව ශක්තිමත් කරලා, පාර්ලිමේන්තුව ශක්තිමත් කරලා,  ඒ වගේ පැහැදිලි ගමනක් ගියොත් තමයි මේ

රටේ සංවර්ධනය ඉදිරියට ගෙනියන්න හැකියාව ලැබෙන්නෙ කියලා. මේ වෙලාවෙ මතක් කරනවා. මීට වැඩිය මම කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ මම මුලින් අවදානය යොමු කළා වගේ අද අපේ මන්ත්‍රීවරු කීප දෙනෙක් කතා කළා. ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමනුත් කතා කළා. මේ අද රටේ තියෙන තත්වය අද එදා වේල ජීවත් වෙන්න බැරි තත්වයට මේ සෞභාග්‍යා යේ දැක්ම ක්‍රියාත්මක කරන ආණ්ඩුව කටයුතු කරනවා. අද බඩු මිල එන්න එන්නම දිනෙන් දින ඉහල යනවා. මිනිස්සුන්ට අද තුන් වේල තියා එක වේලක් වත් ආහාරය රැක ගැනීමට හැකියාවක් නොමැති කාලවකවානුවක් බවට පත් වෙනවා. දැන් ඉතිං අපි අහන්න තියෙන්නෙ අර පහුගිය දවස්වල හොදද සැපද කියල ඇහුවා. දැන් ඉතිං තමුන්නාන්සෙලගෙ ආණ්ඩුවනෙ තියෙන්නෙ. මේ යන තත්වයත් එක්ක, ඉදිරියෙදි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ වැඩපිළිවෙල යටතේ, ජනතාවට ලක්වෙන ඉරනම මොකක්ද කියලා අපටනම් පේනවා. අපි ඉතිං මොකද අපේ ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමන් කිව්වා වගේ බහුතර බලයක් අද එතුමට ලැබිලා තියෙනවා. නමුත් ගරු මන්ත්‍රීතුමා, බහුතර බලය ලබා ගත්තෙ කොහොමද කියලා මම ගිය සභාවෙ කිව්වා. මොකද බැසිල් රාජපක්ෂ මහත්තය මේ අපේ ගම්වල තියෙන අහිංසක මිනිස්සුන් බිය වද්දලා, ඡන්ද ටික ඡන්ද පොලට නොයවලා, ඒ බලයත් එක්ක තමුන්නාන්සෙලගෙ ඡන්ද ටික ඡන්ද පොලට ගෙනිහිල්ලා, මහ ලොකුවට බහුතර බලයක් ගත්තට, අද රටේ විශාල පිරිසක් ඡන්දෙන් වැලකිලා නිහඩව බලාගෙන ඉන්නවා. නැවත වාරයක් අද ජනතාව ඉතාමත් දුක්ඛිත ජීවිතයකට පත්වෙලා ඉන්නවා. මේ රජය ගෙනයන ආර්ථික වැඩපිළිවෙලත් එක්ක මම හිතනවා අද හාල් කිලෝ එක රුපියල් 90 යි. සීනි කිලෝ එක 150 යි. අද කහ නැතුව වෑංජන කන්න වෙලා තියෙන්නෙ. ඉතිං ඒ වගේ තත්වයක් අද රටේ උදාවෙල තියෙන්නෙ. පරිප්පු සීනි සැමන් 100 ට දෙනවයි කිව්වා. කෝ අද, අද දෙසීය ගණන් එකසිය ගණන්. ඉතිං මේක තමයි ඇත්ත තත්වය. අද ජනතාව මුලාවට ලක් කරපු ආණ්ඩුවක් හැටියට, සමාජයේ අපකීර්තියට පත් වුන ආණ්ඩුවක් හැටියට, අද ඉදිරියට ගමන් කරන තැනදි, අද අපි බලන් ඉදිමු. රටේ ජනතාවට අද තේ ගහට පෝර ටිකක් නැහැ. ඉතිං මොකද පහුගිය දවස්වල පෝර නිකන් දෙනවයි කියලා තමයි කිව්වෙ. අද තේ ගහට දාගන්න දලු ටික කඩා ගන්න මාස පහකටවත් පෝර හොන්ඩරයක් දාගන්න බැරි තත්වෙට අද මේ රට පත්වෙලා තියෙනවා. මේ ආණ්ඩුව ඉතාමත්ම ආර්ථික වශයෙන් පීඩාවට පත්වුන පහල මට්ටමකට කල්ගත කරන ආණ්ඩුවක් හැටියට, ඉදිරියෙදි ජනතාව බලා ගන්න හැකියාවක් නැතෙයි කියලා, මේ වෙලාවෙ සිහිපත් කරමින්, ඔබ සියලු දෙනාට තෙරුවන් සරණ පතමින්, මම නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් මදූසංක මහතා**

ගරු සභාපතිතුමනි, මට කලින් කතාවෙදි විස්තර ටික හොයා ගන්න බැරිවුනා. අපේ කොට්ඨාසෙ අපේ මන්ත්‍රීතුමියත් දැනුවත් ඇති මම හිතන්නෙ සභාවට අයත් පී 262 කියන නඩුවක් තියෙනවා. ඒක මිදැල්ලගෙ වත්ත කියලා, මම පුංචි කාලෙ ඉදන් දන්නවා. මේක සභාවට තියෙන එකක් කියලා. ඒ ප්‍රමාණෙත් එක්කම වැට ගහල තියෙනවා. පාර පැත්තෙන් ඉතිං මම හිතන්නෙ මට මේක හොයා ගන්න බැරුව හිටියෙ. මම ශාන්ත මහත්තයත් එක්ක දවස් කීපයක්ම මේ

ගැන හෙව්වා. මේ දැන් ටිකකට කලින් තමයි හරියට හොයා ගත්තෙ. මම හිතන්නෙ කවුරු හරි ඒ ගැන සභාවෙන් යොදවලා, අවශ්‍ය කටයුතු හොයල බලන්න. මොකද අපිට පොඩි බිම් ප්‍රමාණය වුනත්, අපේ සභාව සතුව තියෙන සම්පතක්. ඉතිං ඒ නිසා ඒ ගැන අවදානය යොමු කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. 1992 වර්ෂයේ විතර මම මේ ගරු සභාවෙ හිටියා. ඒ කාලෙ තමයි මේ ලංකාවෙ වැවෙන වවන වතු සමාගම්වල කටු පොල් වගාව පිළිබඳ යෝජනා කළේ. මේ කටුපොල් වගාව ඉදිරියට තහනම් කිරීම පිළිබඳව, අපේ ගරු ජනාධිපතිතුමාට අපි ස්තූතිවන්ත වෙන්න ඕන.

මෙච්චර කාලයක් කටුපොල් වගාවෙන් අපේ රටට කිසිදු සෙතක් වුනේ නැහැ කියලා මම කියනවා. අපේ ජල උල්පත් සිදී ගියා. දැන් ඒ ඉඩම්වල කටුපොල් වෙනුවට, තුන්වෙනි වැවිල්ලක් හැටියට, ග්ලිඩිසීරියා වගාව වවන්න කියන්නෙ. ඒ වගේම කොම්පෝස්ට් හදන්න උපකාරී වෙනවා. ඒ වගේම බල ශක්තිය හදන්න ඒ ග්ලිඩිසීරියා වැවිලි වලින් අපට ප්‍රයෝජනය ගන්න ඉදිරියට පුලුවන් වේවි කියලා මම හිතනවා. එතකොට අපේ ජල උල්පත් ක්‍රමානුකූලව හැදෙයි කියලත් මම හිතනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම දෙවනියට යෝජනා කරනවා. උනන්විටිය නැගෙනහිර ප්‍රජා ශාලාවට විදුලිය ලබා දෙන්න කියලා. එයට විදුලිය ලබා ගැනීම පිළිබඳව හිග බිලක් තිබුනා. එය අපි ගම්වාසීන් විසින් රුපියල් 9000 ක මුදලක් ගෙවා තියෙනවා. දැන් තියෙන්නෙ විදුලිය ලබා ගන්න විතරයි. එයට උදවු උපකාර කරන හැටියට ගරු සභාපතිතුමාට මම යෝජනා කරනවා.

ඒ වගේම ඌරල පහල අක්කර 25 මාර්ගය ගැන ගරු සභබන්දු මන්ත්‍රීතුමා කතා කළා. දැන් එය නොකෙරුණ නිසා දැන් දෙතුන් තැනක ආපසු අර කානු ගොඩ කරලා, පාරෙන් වතුර ගලා යනවා. මේ දවස්වල තව පස් ටිකක් දාල තියෙනවා. වෙනින් තැන්වල කානු ගොඩ කරලා. දැන් පාර මැදින් තමයි වතුර පාර යන්නෙ. මඩ හේදිල යනවා කියලා දෙතුන් දෙනෙක්ම මට අද උදේ පැවසුවා. ගරු සභාපතිතුමනි, ඉක්මන් තීරණයක් අරගෙන මේ කානු පද්ධතිය සාදා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. පස්දාපු පාරෙ ඊට මෙහාත් තැන් දෙකක් ගොඩ කරල තියෙනවා. එතනින් දැන් වතුර බහින්නෙ නැහැ. පාරදිගේ තමයි වතුර බහින්නෙ.

ඒ වගේම මේ දවස්වල අධික වර්ෂාව පවතින හෙයින් ඌරල පහල අර ගල්කන්ද කියන ප්‍රදේශයේ ජලය විශාල වශයෙන් දොල පාර ගලාගෙන එනවා. එතනට ගල් බැම්මක් දැමීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එන්. ඩබ්. පතිනායක මහතා**

ගරු සභාපතිතුමනි අවසරයි. ඌරල පොදු නාන ලිද පිළිබඳ ප්‍රශ්නය මම හිතන්නෙ වතා හතරක් පහක් කතා කරල තියෙනවා. ඇත්තටම සභාපතිතුමනි, මට මෙවරත් කතා කරන්න සිදු වුනා. තාක්ෂණ නිලධාරීතුමියක් ඒ ස්ථානය පරීක්ෂාවට ගිය සතියේ ගියා. මම හිතන්නෙ එතුමිය ආසන්න නිවසෙන් අහල තියෙනවා. මේ ජේ සී බී එකක් ගිහිල්ල මෙහෙම ලිද කැඩුනද කියලා. ඒ නිවසෙ තමයි මෙවනතෙක් බඩු භාණ්ඩ දාගන්න නැවතී සිටියෙ. ඒ ඉඩම් හිමියන් විසින් භාවිතා කළේ. නිවසෙ ඉදිකිරීම් කටයුතු කරන අවස්ථාවෙ ඉතිං ඇත්තටම සභාපතිතුමත් ඒකට සාක්ෂි දරනවා. ජේ සී බී යන්ත්‍රයක් තිබුනා. ඔබතුමා එනකොට මම පොලීසියට කතා කරලා, ඒ ගෙපල අදින එක නැවැත්තුවා. එතකොට සභාපතිතුමාටත් මම දුරකතන ඇමතුමක් දීල එතුමත් ආවා. ජේ සී බී යන්ත්‍රයක් ආපු එකට සභාපතිතුමත් සාක්ෂි දරනවා ඇති. නමුත් තව වෙනකම් මොනවද වුනේ කියන එක මමවත් දන්නෙ නැහැ. ප්‍රදේශයේ මන්ත්‍රීවරය හැටියට මම මේ ඉල්ලීම කළා. දැන් සභාවට වාර පස්වෙනි වාරෙ විතර මේ කතා කරන්නෙ තව වෙනකම් ඒ පොදු නාන ලිද පිළිබඳව සභාවෙන් වුනේ මොකක්ද කියලා, මම දැන ගන්න කැමතියි. මම හිතන්නෙ යටලමත්ත ප්‍රදේශයේ එහෙම ලිංවල එහෙම පොඩි පොඩි හානි වුන ගමන්, ඉක්මණින් සභාවෙන් ක්‍රියා කරලා, ඒ ලිඳ ප්‍රතිසංස්කරණය කරලා දුන්නා. නමුත් තව වෙනතුරු ඌරල නාන ලිද පිළිබඳව, මොනම දෙයක්වත් වුනේ නැහැ. දැන් වසරක් විතර ගත වීගෙන එනවා. ඌරල පොදු නාන ලිද පිළිබඳව මොකක්ද ඔබතුමා ගන්න තීරණය, ඒ තීරණය මට මේ සභාවෙදි දැනගන්න කැමතියි. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, අපේ ගරු උප සභාපතිතුමාගේ ආදරණීය මෑණියන් පසුගිය දිනවල අභාවයට පත් වුනා. ඒ පිළිබඳව අපි සභාවේ මන්ත්‍රීවරු හැටියට සියලුම දෙනා සහභාගි වුනා. ඒ වගේම එතුමන්ගෙ මෑණියන්ට අපි පළමුවෙන්ම අපේ ශෝකය සහ නිවන්සුව මේ වෙලාවෙ ප්‍රාර්ථනා කරනවා.

දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු නොවුනත්, අපේ කිහිප දෙනෙකු ප්‍රකාශ කරපු අදහස්වලට ආණ්ඩු පක්ෂය හැටියට යමක් ප්‍රකාශ කිරීම මේ වෙලාවෙ මම හිතන්නෙ යුතුකමක් හැටියට සලකනවා. පළමුවෙන්ම අපි අපේ රජය බලයට පත්වෙලා තවම ඉතාම කෙටි කාලයක් වෙන්නෙ. ඒ වගේම සැම දෙනාම මේ 20 වෙනි සංශෝධනය පිළිබඳව යම් යම් අදහස් ප්‍රකාශ කළා. කොහොම වුනත් මේ රටේ 19 වෙනි සංශෝධනය ගෙනැල්ලා, රට යම් දුරකට අකාර්යක්ෂම භාවයට පත්වෙලා, ඒ යෝජනාව ගෙනැල්ලා ක්‍රියාත්මක කරන්න සූදානම් වුන අයට පාර්ලිමේන්තුවත් යන්න බැරි තත්වෙකට අද මේ රටේ මහ ජනතාව යම් විදිහකින් පසුගිය මැතිවරණයේ ප්‍රතිඵලයක් ලබා දුන්නා. ඒ වගේම පැහැදිලිවම අපි පසුගිය මැතිවරණයේදී රට පුරාම ගම් නියම්ගම් පාසාම අපි සඳහන් කර සිටියෙ, මේ අර්බුදකාරී 19 වෙනි සංශෝධනය වෙනස් කරලා 20 වෙනි සංශෝධනය ගෙනැල්ලා, මේ අවුල් වියවුල් තත්වය ලිහාගෙන කටයුතු කරන්න තමයි අපි බලාපොරොත්තු වුනේ. ඒ අනුව මම හිතන්නෙ පළවෙනි කැබිනට්වුවට අපේ රජය 20 වෙනි සංශෝධනය ක්‍රියාත්මක කරන්න යෝජනාවක් ගෙනාවා. එහිදී සමහර අයගේ යම් යම් මත තියෙනවා. එක පවුලක් නගා සිටවන්න, මේ කටයුත්ත සිදු කරනවයි කියලා. ඒ නිසා මම හිතන්නෙ පහුගිය මැතිවරණයේ අපට පැහැදිලි ජන වරමක් ලැබුනේ මේ 19 වෙනි සංශෝධනයේ වෙනසක් කිරීම සඳහා. මොකද 19 වෙනි සංශෝධනය තුලින් ගෙනාපු ස්වාධීන කොමිෂන් කියන ඒවා පහුගිය වකවානුව තුලදි ක්‍රියාත්මක වුනේ නැහැ. මොකද ඔය ස්වාධීන කියන කොමිශන් එදා පත්වෙලා තියෙද්දි, මැතිවරණයක් ගන්න පාරට බැහැල ඇවිදින්න වුනා. ඒ නිසා ප්‍රාදේශීය සභා මැතිවරණය ගන්න අවුරුදු දෙකක් තිස්සෙ පාරවල් ගානෙ පවා යන්න සිදු වුනා. මේ තත්වය තුල ඒ නිසා මේකෙ පැහැදිලිව සඳහන් කරනවා එදා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, මේ රටේ ජනතාව යම් ක්‍රියාවලියක් සිදු කරන්න එදා බලයක් ලබාදුන්නා. ඒ ක්‍රියාවලියෙදි ඔවුන් අවුරුදු පහක් තුල තමන්ට ඡන්දෙ දීපු ජනතාවට දීපු බලාපොරොත්තු ඉටු කරන්න බැරි වුනා. ඒ අනුව අපි ගෝඨාභය මහත්තයට හැට දෙලක්ෂයක් ඡන්දෙ ලබා දීලා, එතුමන් කෙරේ විශ්වාසයක් තියල තියෙනවා. ඒ නිසා මේ රටේ කවුරු මොනදේ කිව්වත් මේ රට පාලනය කරන්න එතුමන්ට මහජනතාව බලයක් ලබල දීලා තියෙනවා. ඒ නිසා එතුමන්ට මම හිතන්නෙ යුතුකමක් සහ වගකීමක් තියෙනවා. එතුමන් ඇතුලු පාර්ලිමේන්තු කණ්ඩායමකට බලය ලැබී තියෙනවා. ඒ නිසා ඔහු අවුරුදු පහක් තුල රටට සේවයක් කරන්න ඕන. එහෙම නොවුනොත් අනිත් අයට වෙච්ච ඉරනමම සිදු වෙනවා. ඒ නිසා මේ 20 වෙනි සංශෝධනය තුලින් එතුමන් නැවත නැවත බලයේ ඉන්න ඕනය කියල අවස්ථාවක් උදා කරගෙන නැහැ. ජනාධිපතිවරයා දෙවරකින් යායුතුය කියන එක සංශෝධනය වෙන්නෙ නැහැ. ඒ වගේම තොරතුරු දැන ගැනීමේ පනත සංශෝධනය වෙන්නෙ නැහැ. ඒ වගේම මේ පනත තුලින් ස්වාධීන කොමිෂන් එකක්වත් අවලංගු වෙන්නෙ නැහැ. කොමිෂන් හතක් ක්‍රියාත්මක වෙනවා. මේ 20 වෙනි සංශෝධනය යටතේ පත් කිරීමේ බලය විධායක ජනාධිපතිවරයා සතුවෙලා තියෙනවා. මේ රටේ යම් අවස්ථාවකදි, මමත් ඉස්කෝලෙ යන කාලෙ මට මතකයි. ජේ ආර් එල්ලා මරනු කියලා, අපි බෝඩ්වල ලිව්වා. රතිඤ්ඤා පත්තු කළා. පෙළපාලි ගියා. මේ දේවල් කළා. නමුත් මේ රටේ පහල වෙච්ච දේශපාලනඥයින් අතර ශ්‍රේෂ්ඨ දේශපාලනඥයෙක් තමයි ජේ ආර් ජයවර්ධන මැතිතුමා. එතුමන් හැබැයි නොගැලපෙන ආර්ථික රටාවක්, මේ රටට හඳුන්වා දුන්නා. විවෘත්ත ආර්ථිකය ඒකට අපට එකග වෙන්න බැහැ. නමුත් මේ විධායක ජනාධිපති ක්‍රමය මේ රටට ගැලපෙන ක්‍රමයක්. මොකද මේ රටේ සිංහලයාගේ පැවැත්ම සහ සිංහලයාගේ අනාගතය තීරණය කරන්න පුලුවන් හැකියාවක් තියෙන්නෙ මේ විධායක ජනාධිපති ක්‍රමය තුල. ඒ වගේම මේ විධායක ජනාධිපති ක්‍රමය නිසා තමයි, එදා යුද්ධය ඉවර කරන්න පුලුවන් වුනේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා. ගෝඨාභය රාජපක්ෂ

මැතිතුමා මේ රටට යම් සේවාවක් කරාවි කියලා. ඒ වගේම මිනිස්සු ඒ පිළිබඳ විශ්වාසයක් තියල තියෙනවා. ඒ නිසා 19 වෙනි සංශෝධනය මොකක්ද කියන එක අද පාර්ලිමේන්තුවට ගෙනාපු මිනිස්සුවත්, අද පාර්ලිමේන්තුවට නොඉදන තත්වෙටම අද මිනිස්සු ඡන්දය පාවිච්චි කරල තියෙනවා. ඒ නිසා නැවත වතාවක් මේ 19 ගැන අපට කතා කළ යුතු නැහැ. මේක සංශෝධනය කරලා ඉදිරියට යා යුතුයි. ඒ නිසා ඔය අපට ස්වාධීන කියන කොමිෂන් එදා පත්කළාට, ඒවා ස්වාධීන වුනේ නැහැ. එදා තමන්ට මෙහෙවර කරපු අය තමයි පාර්ලිමේන්තුවෙ ඔය කොමිෂන්වලට කියලා පත් කර ගත්ත ඉහල නිලධාරි පත් කළේ. ඒ නිසා මේකෙයි ඒකෙයි කියලා වෙනසක් ඇති වුනේ නැහැ. ඒ නිසා අපි තමුන්නාන්සෙලට සිහිපත් කරනවා. අපි 20 වෙනි සංශෝධනය තුලින්, මේ රටේ සංවර්ධනය කරන්න වැඩපිළිවෙලක් සූදානම් කරනවා.

ඒ වගේම අපේ වනමල් මන්ත්‍රීතුමා මෙතන ඇත්තෙ නැහැ. නමුත් එතුමා සඳහන් කළා. අද රටේ ආර්ථිකය කඩා වැටිලා, බඩු මිල ගණන් ගිහිල්ලා, කියලා. තේවලට පොහොර ටික නැහැ කිව්වා. නමුත් එදා රුපියල් 70 ට රුපියල් 60 ට දලු කිලෝ එකක් ගෙවපු එක අද 110 ක් විතර ප්‍රමාණයකින් තේ මිල ඉහල ගිහිල්ලා. ඒ වගේම තමයි කුරුඳු කිලෝ එකක් රුපියල් 2500 ක් විතර ඉහලට ගිහිල්ලා තියෙනවා. ඒ වගේ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කරලා, ග්‍රාමීය ජනතාවගේ සුබ විහරණය සඳහා කටයුතු කරමින් පවතින රජයක් හැටියට, මේ වෙලාවෙ සඳහන් කරනවා. මොකද කහ පිළිබඳව ගත්තොත් කහ මේ රටේ වගා කර ගත්තොත්, විශාල මුදල් ප්‍රමාණයක් එලියට යන එක නවත්ව ගන්න පුළුවන්. අපි කහ පිට රටින් නොගෙනැල්ලා, මේ රට තුල නිෂ්පාදනය කර ගැනීම සඳහායි ඒ කටයුතු කරන්නෙ. ඒ නිසා ඒ වගේ ලොකු වැඩපිළිවෙලක් අපි රජයක් හැටියට කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම හැමෝම සඳහන් කළා වගේ, සභාපතිතුමනි, අපි මේ ග්‍රාමීය පාරවල් කොච්චර කොන්ක්‍රීට් කළත්, කොච්චර සකස් කළත්, අද මේ වැහි දවස්වලට පාරවල්වල යන්න බැරි තත්වයක් උදා වෙලා තියෙනවා කියලා අපට පේනවා. මොකද සෑම අතුරු පාරකම වතුර පාර හරවල තියෙන්නෙ ප්‍රධාන පාරට. ඒ පාරෙ තියෙන පස්ටික ඇවිල්ල සම්පූර්ණම පාරෙ නවතිනවා. ඒ වගේම එකම පාරකවත්ම කානු පද්ධතියක් නැහැ. ඒ නිසා අපි මොන සංවර්ධනය කළත් වැඩක් නැහැ. ඉතාම ඉක්මනින් කළ යුතු වැඩක් තියෙනවා. සෑම මාර්ගයකම මේ කානු පද්ධතියක් අනිවාර්යයෙන් සකස් කරන්න ඕන. ඒ කානු හදනවා වගේම, මම හැම වෙලාවෙම සඳහන් කරනවා මිනිස්සුන්ගෙ අනවසර ඉදිකිරීම් වගේම තමයි, අනවසර වගාවන් තමන්ගෙ ගෙදර වත්තෙ කොච්චර ඉඩ තිබුනත්, කුරුඳු ටික හිටවන්නෙ පාර අයිනෙ. ඒ වගේම දැවැන්ත රුස්ස ගස් හිටවන්නෙ පාරෙ. ඒ නිසා මේ මාර්ග අපහසුතාවයට පත් වෙලා තියෙනවා. අද හදිසියෙ ගමක් ඇතුලක තියෙන පාරක මළ ගෙයක් ඇති වුනොත් ඒ මළ ගෙදරට යන්න විදිහක් නැහැ. අඩු තරමින් හර්ස් එක ගෙනියන්න විදිහකුත් නැහැ. අඩි 10 ක් අපි කොන්ක්‍රීට් කරල තියෙනවා. නමුත් කුරුදු වැට සම්පූර්ණයෙන් පාරට වැටිලා, මාන සම්පූර්ණයෙන් වැවිලා. අතුරු පාරවල්වලින් ආපු පස් ටික පාරෙ පිරිලා. ඒ වගේ දැවැන්ත ප්‍රශ්නයක් වෙලා තියෙනවා. මේ ග්‍රාමීය මාර්ගවල වගකීම අපට තියෙන්නෙ. ඒ නිසා මම ගරු සභාපතිතුමාට යෝජනා කරනවා. යම් වැඩපිළිවෙලක් හදලා, අඩු තරමින් මේ මාර්ගවල අවහිරතා ඉවත් කරලා, මිනිස්සුන්ට ගමනා ගමනය පහසු කරන්න ක්‍රමවේදයක් හදන්න. මුදල් අවශ්‍ය වෙන්නෙ නැහැ. මම යෝජනා කරනවා. මේ හැම ගමකම ස්වේච්ඡා සංවිධාන තියෙනවා. මේ ස්වේච්ඡා සංවිධාන මාසික ආදායම ලක්ෂ ගණන් හොයනවා. මොකද සල්ලි පොලියට දෙනවා. බයිසිකල්වල පොත් තියාගෙන, සල්ලි දීල පොලිය හදා ගන්නවා. එහෙම දේවල් ඇති කරන ගමේ සමිතිය, ගමේ පාරවල් ටික හදා ගන්න වැඩපිළිවෙලකට නිවැරදි නායකත්වය අපි ලබා දෙන්න ඕන කියන සිහිපත් කිරීම මම මේ වෙලාවෙ කරනවා. ඒ වගේම සමෘද්ධි සහනාධාරය ලබන විශාල පිරිසක් ඉන්නවා. ඒ සමෘද්ධි ලාභීන් මාසෙකට එකපාරක්වත් යොදවලා, මේ ගම්වල තියෙන පාරවල් ටික හදන්න නිවැරදි නායකත්වයක් අරගෙන, ඉදිරි සංවර්ධන

කමිටුවකට හරි යෝජනාවක් දාලා, ප්‍රාදේශීය ලේකම්තුමිය සමග සාකච්ඡා කරල සිදු කරන්න කියන ගෞරවණීය සිහිපත් කිරීම කරනවා.

ඒ වගේම තමයි, අද නාගොඩ කොට්ඨාසෙ ගත්තම තියෙන සියලුම රාජ්‍ය ආයතන අක්‍රියතාවයට පත් වෙලා තියෙනවා. කිසිම මිනිහෙකුට රාජ්‍ය ආයතනයකට ගිහිල්ල දවල් දවසේ වැඩක් කර ගැනීමේ හැකියාවක් නැහැ. උදේට වැඩට එනවා. සමහරු මග, සමහරු තවත් තැන්වල. ඒ වගේම අදාල අංශ ප්‍රධානීන් කියන දේවත් අහන්නෙ නැහැ. අද මේ නාගොඩ ප්‍රදේශයේ තියෙන සියලුම රාජ්‍ය ආයතනයක් තුලම මේ වගෙයි. අපේ ප්‍රාදේශීය සභාවත් එක්ක මම කියන්නෙ. ඒ නිසා මේ කටයුතු මීට වැඩිය විධිමත් කිරීමේ වැඩපිළිවෙලක් සකස් කරන්න. අනිවාරයයෙන් මේ අපි රට හදන්න නෙවෙයි. අපි මේ අපේ ගමේ මිනිස්සු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඇවිල්ලා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වැඩක් බලාපොරොත්තු වෙනවනම්, ඒ වැඩේ කරල දෙන්න බැරිනම් මොන ආණ්ඩුව රට පාලනය කළත් වැඩක් නැහැ.

ඒවගේම තමයි මේ සේවකයන්ට දොස් කියල වැඩක් නැහැ නිවැරදි නායකත්වයක් මේ ආයතන තුල තියෙන්න ඕන. ඒ නිසා විශේෂයෙන්ම අපේ ප්‍රාදේශීය සභාව ගත්තොත් අපේ ප්‍රාදේශීය සභාවෙ ගරු සභාපතිතුමා සහ ලේකම් තුමිය මේ සඳහා ඉහල මැදිහත් කිරීමක් කරන්න ඕන. ඒ නිසා ඉතාම දක්ෂතාවයෙන් හෙබි නිලධාරි මේවයෙ ඉන්නවා. එදා දවසෙ අපි දැක්කා දක්ෂයො වැඩ කරනවා. නමුත් අද ඔවුන් එක්කෙනෙක් ගෙන්වත් අපට වැඩක් ගන්න බැරිවෙලා තියෙනවා. ඔක්කොම එක ගොඩකට එකතු වෙලා. තමන්ගෙ වැඩේට වැඩිය තමන් බලන්නෙ නිරන්තරයෙන්ම වෙන වෙන වැඩ කරන්න. ඒ නිසා සභාවෙ විතරක් නෙවෙයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිසිම නිලධාරියෙක් ගෙන් වැඩක් ගන්න හැකියාවක් නැහැ. මම මේ ඊයෙ පෙරේදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා උප්පැන්න සහතිකේ කොපියක් ගන්න ලියල දුන්නාම, ඒක මෙහේ නැත කිව්වා. නමුත් ඒ වෙලාවෙම මම නියාගමට ගිහිල්ලා ඒකෙන් ගත්තා. ඒ ඉන්න නිලධාරියට බොහොම හදිසියෙ පරිපාලන නිලධාරි සමග කොහේ හරි කඩේකට යන්න වුවමනාවකට ඒ කටයුත්ත කළේ. අන්න ඒ වගේ එහෙම දෙයක් අපට කර ගන්න බැරි වුනානම් අහිංසක මිනිස්සුන්ට කවර කතාද? ඒ නිසා මම මේ වෙලාවෙ යෝජනා කරනවා. අපි මාසෙකට සැරයක් මේ සභාවට ඇවිල්ලා, මේ සභාවේ තේ එකක් බීලා, ඒ වගේම මේ තියෙන කඩදාසි ටික බලල යන එක නෙවෙයි. මේකෙ තේරුම වෙලා තියෙන්නෙ. ඒ නිසා අපි යෝජනා කරනවා. මේ සභාව තුල විතරක් නෙවෙයි. මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලීසිය ගත්තම, පොලීසිය ගැන කතා කරලා වැඩක් නැහැ. ඒ නිසා මේ රාජ්‍ය ආයතන ශක්තිමත් කරන්න කටයුතු කරන්න කියන සිහිපත් කිරීම, අපි මන්ත්‍රීවරු හැටියට මතක් කරනවා.

ඒ වගේම පක්ෂ, විපක්ෂ හැම මන්ත්‍රී කෙනෙක්ම මම යෝජනා කරනවා. හැම දෙනාම එකතුවෙලා මේ අපේ ගම්ටික හදා ගන්න කවුරුත් පොදු වැඩපිළිවෙලක් හදල කටයුතු කරමු කියන ගෞරවණීය සිහිපත් කිරීම මම මේ වෙලාවෙ කරනවා. ඒ නිසා අපි රාජ්‍ය ආයතනයකට ආවහම, ඒ රාජ්‍ය ආයතනය තුලින් යම් දෙයක් අහිංසක මිනිහෙකුට කර ගන්න බැරිනම් ඒ රාජ්‍ය ආයතනය තුලින් වැඩක් නැහැ. ඒ නිසා ඇගේ හැප්පෙන්න නිලධාරි හිටියත් වැඩක් නැහැ. යම් කාර්යයක් මනුස්සයෙකුට එක දවසින් කර ගන්න බැරිනම් වැඩක් නැහැ. ඒ නිසා එවැනි තත්වයක් මේ නාගොඩ ප්‍රාදේශීය බල ප්‍රදේශය තුල ඇති කරන්න ශක්තියක් අපට අවශ්‍යයි. කියන එක මම මේ වෙලාවෙ තමුන්නාන්සෙලට සිහිපත් කරනවා. ඒ නිසා මේ වෙලාවෙදි විශේෂයෙන්ම සිහිපත් කරන්නට ඕන. නාගොඩ සහ ගම්මැද්දෙගොඩ වැලිවිටිය යා කරලා ඉදි කරපු නාගොඩ පාලම පිලිබඳව ඉක්මනින් අදාල අංශ දැනුවත් කරලා, මේ සම්බන්ධයෙන් කටයුත්තක් නොකළොත්, පාලම ඉතාම ඉක්මනින් ගගට පහත්වේවි. ඒ නිසා මේ වෙලාවෙ මම ගරු සභාපතිතුමාගෙ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම එම පාලමේ පැති බැම්මක් සකස් කිරීම අත්‍යාවශ්‍යම වැඩක් වෙලා තියෙනවා. මොකද ඒ පාලම දැන්

ඉතාම අවධානම්. දිගටම කන්ඩි කඩාගෙන ගිහිල්ල තියෙනවා. ඒ වගේම කැප්පිටියාගොඩ අපේ උඩවැලිවිටිය යා කරන මාර්ගය සඳහා ඉදිකරපු කොන්ක්‍රීට් පාලම ඉතාම අබලන් තත්වයේ තියෙන්නෙ ඉතාම අනතුරු දායකයි. ඒ වගේම පාසල් ළමුන් 300 ක් 400 ක් හැමදාම එතනින් එගොඩට ගමන් කරනවා. ඒ වගේම එම පාලම ලබා දෙන්න කියන ඉල්ලීම මම සම්බන්ධීකරණ කමිටුවෙදි, ඒ වගේම අදාල ඇමතිවරුන් පවා දැනුවත් කරල තියෙනවා. ඒ නිසා එම පාලම ඉතාම කෙටි කාලයක් තුලදි සකස් කර ගැනීම සඳහා මේ රජයේ, ප්‍රාදේශීය සභාවේ අදාල අංශ අවදානය යොමු කරලා, එම පාලම සකස් කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියන ගෞරවණීය සිහිපත් කිරීම මේ වෙලාවෙ සිදු කරනවා.

ඒ වගේම අපි මොනදේවල් කතා කළත්, මොන දේ කළත්, ලබන සභා වාරය වෙන කොට මේ දේවල් පසු විපරම් කරලා, මේ කරපු දේවල් පිළිබඳව යම් මතයකට එන්න කියන සිහිපත් කිරීම මේ වෙලාවෙ කරනවා. ඒ වගේම තමයි. අපේ ප්‍රාදේශීය සභාව තුල මම හිතන්නෙ අපි හැමෝම සඳහන් කළ විදිහට, අපි කවදාවත් මේ ප්‍රාදේශීය සභාව තුල කිසිම සේවකයෙකුට කවදාවත් අපි විවේචන කරන්නෙ නැහැ. විරුද්ධතාවය ප්‍රකාශ කරන්නෙ නැහැ. ඔවුන් යමක් සාධාරන විදිහට කරල තියෙනවනම්, හැමදාම මුදල් අනුමත කරද්දි, ඒ අයගෙ ගමන් වියදම්, ඒ වගේම සියලු වියදම් අනිවාර්යයෙන් සභාවෙ අපි අනුමත කරල දෙනවා. ඒ වගේම අපි සියලුම දෙනාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ ප්‍රාදේශීය සභාව තුලින් යම් සේවයක් රටේ ජනතාව බලාපොරොත්තු වෙනවනම්, ඒ සඳහා නායකත්වය අරගෙන කැපවීමෙන් කටයුතු කරන්න. විශේෂයෙන්ම අර ඉඩම් ප්‍රශ්නෙදි, ප්‍රාදේශීය සභාවෙ නිලධාරිය අවධානයෙන් ඉන්නව නම්, ඒ ඉඩමක් කට්ටි කරලා විකුණනවයි කියලා, ආරංචිය තියෙනවනම්, ඒ බලය පැවරෙන නිලධාරි දන්නවා මෙන්න මෙහෙම දෙයක් සිදු වෙනවා. සභාපතිවරයා දැනුවත් කරලා, ඒ කටයුත්ත ඒ අංශවලින් ඒ ගන්න තියෙන මුදල් ඒ වගේම තියෙන යම් දේවල් කර ගන්න හැකියාව තියෙනවා. ඒ නිසා නිලධාරීන් තමයි මේකෙ අරටුව. ඒ නිසා අපට වැඩිය මේකෙ වගකීම මේ නිලධාරීන්ට සහ ගරු සභාපතිතුමා ඇතුලු ලේකම්තුමියට තියෙනවා. ඒ නිසා මේ කටයුත්තට අපේ දෙන්න පුලුවන් හයිය ශක්තිය අපි හැම වෙලාවෙම ලබා දෙන්න බලාපොරොත්තු වෙලා ඉන්නවා. ඒ නිසා ඒ පිළිබඳව තමුන්නාන්සෙලට ආරාධනා කරනවා. අපේ සභාපතිතුමනි, මේ සඳහා වැඩ පිළිවෙලක් හදන්න. නිරන්තරයෙන් අපි ඒ සඳහා සහයෝගය දෙනවයි කියන සිහිපත් කිරීමත් කරමින්, ඔබ සියලු දෙනාටම සුබ අනාගතයක් පතමින්, නිහඩ වෙනවා. බොහොම ස්තූතියි .

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, පසුගිය මාසෙ අපි සියලු දෙනාටම බොහොම කණගාටුදායක සිද්ධියකට මුහුණ පාන්න සිදු වුනා. අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ මැණියන් අප අතරින් වියෝ වුනා. ඇත්තටම අපට ඉතාම සංවේග ජනක අවස්ථාවක් වුනා. මොකද ඒ අවස්ථාවට සහභාගි වුනා. අපි දැක්කා ගරු නියෝජ්‍ය සභාපතිතුමා ඉතා සංවේදී වෙච්ච ඒ මොහොත මතක් වෙන කොට දෙමව්පියන් නැතිවුන අපටත් ඒ පිළිබඳ බොහොම සංවේගයට පත් වුනා. ඒ නිසා ඒ වගේ ගුණවත් ගරු උප සභාපතිතුමා ඇතුලු ඒ දරුවන් බිහි කරපු ඒ මැණියන්ට නිවන් සැප ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම මතක් කරන්න ඕන. යටලමත්ත කොට්ඨාසය විශාල කොට්ඨාසයක්. මේ කොට්ඨාසයේ අපි සංවර්ධන කටයුතු කොච්චර කළත්, අර බෙංගාලෙ බොක්කට පොල්ලෙල්ලක් දැම්ම වගේ දැනෙන්නෙ නැහැ. පාරවල් ඉතාම දුෂ්කරයි. වතු පාරවල් ඒ වගේම අපි පාරවල් හදන්නෙ සලාක වශයෙන්. ඒ කාලෙ අපේ නන්දන මන්ත්‍රීතුමත් හැදුවා මීටර් 100 ක් 50 ක්. ඒ වගේ සලාක වශයෙන් හදන එක පාරක් වත් ඉවරයක් නැහැ. වැහි කාලෙ වෙන කොට පාර හෝදලෙන ගිහිල්ලා මිනිස්සුන්ට ගමනාගමනය කරන්න ඉතාම අපහසු තත්වයට පත් වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බෝවිටියමුල්ල දූන් කන්ද පාර. ප්‍රදේශවාසීන් විසින් ඔබතුමාගෙන් ඉල්ලීමකුත් කරල තිබුනා. ඒ දූන් කන්ද පාර තාවකාලිකව හරි සකස් කරල දෙන්න. මොකද මිනිස්සුන්ට යන්න බැරිම තත්වෙකට පත්වෙලා තියෙනවා. ඒ පිළිබඳව ඔබතුමා වහාම හැකි ඉක්මනින් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙසට ඔබතුමාට මතක් කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ තවත් දැවෙන ප්‍රශ්නයක් තමයි වීථි ලාම්පු ප්‍රශ්නය. ඒ පිළිබඳ ඔබතුමාගෙන් ජනතාව ඇහුවම කියනවා. ගමේ කොට්ඨාසෙ මන්ත්‍රීතුමාට කියන්න කියලා. ඔන්න කොට්ඨාසෙ මන්ත්‍රීතුමා, ඔබතුමාට කිව්වා. පුලුවන් හැටියට ඔබතුමා ඒ පිළිබඳ කටයුතු කරන්න කියලා නැවතත් ඔබතුමාට මතක් කර සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අද අපේ ගරු සභාවෙ මන්ත්‍රීවරු ඉතා වැදගත් හරවත් කතා කීපයක් සිදු වුන වෙලාවක, මම හිතන්නෙ ඒ සියලු ඒවට අපේ මන්ත්‍රීවරුන්ගෙන් වැඩි හරියක් පිළිතුරු ලබා දුන්නා. ඒ නිසා මම හිතන්නෙ දීර්ඝ වශයෙන් කතා කරන්න අවශ්‍ය වෙන්නෙ නැහැ. ඒත් අපේ ජයවීර මන්ත්‍රීතුමා කිව්වා මත් ද්‍රව්‍ය ගැන. ඔබතුමා කවදත් කතා කරනවා. ඒ වගේම අපේ වසන්ත මන්ත්‍රීතුමා කිව්වා පසුගිය ආණ්ඩුවෙ සිද්දියක් ගැන. ඒ වගේම මත් ද්‍රව්‍ය ගැන මම හිතන්නෙ ඉතිහාසෙ නොවූ විරූ තරම් මේ රාජපක්ෂ ආණ්ඩුවෙන් ඒ පිළිබඳව පාතාල, වැටයි නියරයි ගොයම් කාපු කාලයක් පහුගිය කාලෙ දිගටම තිබුනෙ. ඒ නිසා රජයේ රස පරීක්ෂකවරු, බන්ධනාගාර නිලධාරීන්, පොලිස් නිලධාරීන් රජයේ වග කිවයුතු සෑම අංශයකම අය සම්බන්ධ වෙලා, මේ මත් ද්‍රව්‍ය ජාවාරම යසට කරගෙන ගිය බව දැන් අපට පැහැදිලි වෙනවා. ඒ නිසා රජයේ මේ මිනිස්සු පක්ෂ පාට කිසිම බේදයකින් තොරව, මේ මත් ද්‍රව්‍යවලට අත හිත දෙන සියලු දනා අත්අඩංගුවට ගැනීමට රජය පසුබට නොවෙන බව අපට දැගන්න තියෙනවා. අපට පේන්න තියෙනවා. දිනපතාම ඒ පිළිබඳ වැටලීම් කරනවා. ඒ නිසා අපි රජයට ස්තූතියත්, අපේ ප්‍රණාමයත් අපි පුද කරනවා.

ඒ වගේම අපේ වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමනි, පසුගිය රජය තිබුනෙ ඔබතුමාලගෙ ආණ්ඩුව කාලෙ තමයි මේ දේවල් සිදු වුනේ. ඔබතුමා කිව්වා නිසා, ඒ බවත් මතක් කලේ. ඒ වගේම වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා කිව්වා. බිය වද්දලා ඡන්දෙ ගත්තයි කියලා. ඔබතුමාල තමයි බිය වද්දලා ගත්තෙ. එක්සත් ජාතික පක්ෂෙම ඔබතුමාලගෙ නායකතුමාලා තමයි විවේචනය කරලා, කරන්න දෙයක් නැති කමට මිනිස්සු තරහට ඔබතුමාගෙ නායකයට ඡන්දය දුන්නෙ නැතුව, එක්සත් ජාතික පක්ෂය නරක නිසාම නෙවෙයි. එදා ඉදලම හිටපු එක්සත් ජාතික පාක්ෂිකයො හොදට නෙවෙයි සජිත් මහත්තයට ඡන්දය දීලා තියෙන්නෙ. ඊලග සැරේ ඕක කරකැවිල යනවා. අපට විශ්වාසයි. ඒ නිසා ඔබතුමාලගෙ ලොකු ජයග්‍රහනයක් කියලා හිතන්න එපා. මන්ත්‍රීවරු කීපදෙනෙක් ආවට තව මාස ගණනක් යනකොට ඔය බලවේගය අනිත් පැත්තට කරකැවෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, පළාත් සභාව ගැනත් අපි අදහස් ප්‍රකාශ කළා. ඇත්තටම අපි කවුරුත් කැමතියි, අකමැතියි ඕකට. ඒ නිසා පළාත් සභා මැතිවරණය ආවොත්, අපි කියන්නෙ පළාත් සභාව ඉක්මනින් තියන්න කියලා, නැත්නම් නොතියා ඉන්න ඕන. මොකද පළාත් සභාව ඉල්ලන්න බලාපොරොත්තුව සිටින අපේක්ෂකයො තොරතෝංචියක් නැතුව තමන්ගේ ජයග්‍රහනය ලබා ගන්න දුව ඇවිදිනවා. ඒ අය බොහොම මහන්සියෙන් කටයුතු කරනවා. පළාත් සභා නොතිය ඇරියොත් ඒ අය අපහසුතාවයට පත් වෙනවා. ඒ නිසා පළාත් සභා තියනවනම් තියන්න. නැත්නම් අපි රජය ගන්නා ඕනෑම ක්‍රියා මාර්ගයකට අපි සහය දෙනවා. මොකද අපි මේ රජයේ කොටස් කාරයො වෙලා ඉන්නවා. ඒ නිසා අපි ඒ පළාත් සභා මැතිවරණය තිබ්බොත්, අපි හයෙන් පහක ජයග්‍රහනයක් කරන්න සහයෝගය දෙන බවත් රජයට මතක් කරමින්, ඒ වගේම ගෝඨාභය රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජයට ජය වේවා. තවත් වසර ගණනාවකට රාජපක්ෂ පවුල් පාලනය හේතු වාසනා වේවායි කියලා ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ගරු වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාල කොපමන මඩ ගැහුවත්, ඒ රාජපක්ෂ පවුලට මඩ ගැහුවට එතුමාලා රටට යමක් කරපු පවුලක්

කියන එකත් මතක් කරමින්, ඔබතුමාලට සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මගේ කතාව අවසන් කරනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

උප සභාපතිතුමා ඇතුලු සියලු දෙනාගෙන් අවසරයි. ගරු උප සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, අද දින සභාවට පැමිණීමට නොහැකි බව දන්වා, ධනංජය මන්ත්‍රීතුමා දැනුම් දීලා තියෙනවා. එතුමාගේ නිවාඩුවත් අනුමත කරනවා. මම ඊයෙ දැනුවත් වුන විදිහට එක්සත් ජාතික නිදහස් පෙරමුණ පක්ෂයෙන් ප්‍රාදේශීය සභාවේ හිස් වූ මන්ත්‍රී ආසනය වෙනුවෙන්, කාන්තා නියෝජනයක් නිසා අරුණ ශාන්ති මන්ත්‍රීතුමියටම තමයි නැවත එන්න වෙන්නෙ, කියලා එතුමියගේ මහත්තයා කිව්වා. කොහොම නමුත් අද සියලුම දෙනා පැමිණිලා, අර්ථවත් විදිහට අද සියලු දෙනා සභාවෙ හිටියා. මම හිතන්නෙ අපේ මාධ්‍යවේදී මහත්වරු හිටිය නිසා බොහොම සුහදව කතා කළා. මම පළමුවෙන්ම අපේ නියෝජ්‍ය සභාපතිතුමාගෙ මෑණියන්ගෙ අභාවය පිළිබඳව, සභාවේ සහ පෞද්ගලික ශෝකයත් මේ අවස්ථාවෙ ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම එය දැනගත් මොහොතේ මම සභාවෙ හිටියේ. මට දුරකතන මාර්ගයෙන් සුසන්ත මහත්මය දැනුම් දුන්න ගමන් මම එතුමා සමග සම්බන්ද වෙලා, ඒ අවශ්‍ය කටයුතු, අපට කරන්න පුලුවන් හැකි ආකාරයෙන්, කරන්න සහය දැක්වුවා. ඒ වගේම සහභාගි වුනා. නමුත් අපෙන් එක අඩුපාඩුවක් වුනා. සියලු දෙනා මේ පිළිබඳ දැනුවත් කිරීමේ අත පසු වීමක් වුනා. මොකද ඒ අවස්ථාවේ එතුමත් සමග ගිහිල්ලා ඒ වැඩ කටයුතු කළ නිසා මගෙ මානසික මට්ටමත් හොඳ වුනේ නැහැ. මම දන්න දන්න අයට දුරකතනෙන් කතා කරලා දැනුම් දුන්නා. ඊට පස්සෙ මම හිතුවා සේරම දැනුවත් වෙලා ඇති කියලා. නමුත් ඒක ඒ ආකාරයෙන් සිදුවෙලා තිබුනෙ නැහැ. නමුත් මන්ත්‍රීවරු අවදානෙන් ඉන්නව නම්, තමන්ගෙ සභාවෙ කෙනෙක්ගෙ යම් කරදරයක් වෙනවනම් දැන ගන්න ඕන. සියලු දෙනාම වගේ පැමිණියා. පැමිණියෙ නැති අයට කියන්න තියෙන්නෙ ඒක. වෙන මට කියන්න දෙයක් නැහැ. මොකද දැනුවත් කිරීම තුල අපෙන් අඩුපාඩුවක් වුනා. කෙසේ නමුත් අපි එතුමියට අමාමහ නිර්වාණ සම්පත්තිය ප්‍රාර්ථනා කරනවා.

ගරු මන්ත්‍රීවරුනි, මම වැලි ප්‍රශ්නය පිළිබඳව පළමුවෙන්ම යෝජනාවක් ගෙන ආවෙ. පසුගිය දිනවල අපිත් එක්ක මිනිස්සු කතා කළා. වැලිවල අධික මිළ සහ ලබාගැනීමේ අපහසුව පිළිබඳව. වැලි ප්‍රශ්නෙ ලොකු ගැටළුවක්. අපි වැලි කියුබ් එකක් ගන්න විට රුපියල් 14000 ක් 15000 ක් වෙනවා. අපි කොහොමද මේ ගෙවල් හදා ගන්නෙ කියලා. පසුව මම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති සම්පත් අතුකෝරාල මැතිතුමා මේ සම්බන්ධව දැනුවත් කළා. එතුමා ප්‍රකාශ කළා. එහෙමනම් පරිසරයට හානි නොවන ආකාරයට වැලි ගොඩ දැමීමට හෝ වැලි සේදීමට සුදුසු තැනක් තියෙනවනම්, සභාවෙ යෝජනාවක් සම්මත කරලා, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යෝජනාවක් ලබා දෙන්න කියා. ඒ වගේම භූ විද්‍යා පතල් කැණීම් කාර්යාංශය වැනි ආයතන වලින් සහය අරගෙන ඒ කටයුත්ත කරන්න පුලුවන් කියලා. සාධාරණව මිනිස්සුන්ට වැලි ටිකක් ලබා දෙන්න හැකියාව ලැබෙන නිසායි මම යෝජනාව ඉදිරිපත් කළේ. මොකද ඒකෙන් කරුණු දෙකක් ඉටු වෙනවා. සභාවටත් ආදායමක් එනවා සහ ජනතාවගේ වැලි අවශ්‍යතාවයත් ඉටු වෙනවා. සභාවට පර්මිට් එක ගන්නෙ. නැතුව මිනිස්සුන්ට පර්මිට් දෙන්න නෙවෙයි. මේ පිළිබඳව වැරදි වැටහීමක් ඇති කර ගෙන තමයි මෙයට විරුද්ධව ප්‍රකාශ කිරීම් වුනේ. සෑම ප්‍රාදේශීය සභාවකටම මෙම යෝජනාව කලේ ඒකයි. මගේ යෝජනාව වුනේ **"නාගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ නිවාස ඉදිකිරීම සහ සංවර්ධන කටයුතු සඳහා වැලිවලට විශාල ඉල්ලුමක් පවතී ඒ සඳහා අවශ්‍ය වැලි සපයා ගනු ලබන්නේ දුර බැහැර ප්‍රදේශවලිනි. එසේ ප්‍රවාහනය කිරීමේදී වියදම් අධික වන බැවින්, ජනතාවට අවශ්‍ය වැලි පරිසරයට හානි නොවන පරිදි බල ප්‍රදේශයේ සුදුසු ස්ථානයකින් ගොඩදමා ගැනීමට**

**අවශ්‍ය අවසරය නාගොඩ ප්‍රදේශීය සභාව වෙත ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යෝජනා කිරීමට යෝජනා කරමි"** මම එහෙම කාටවත් පර්මිට් එක දෙන්නෙ නැහැ. සභාවට ආදායම් තත්වයක් සහ සාධාරණ මුදලකට වැලි ලබා දෙන්න තමයි ඉදිරිපත් කළේ. එහෙමනම් මම මේ යෝජනාව දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යොමු කිරීමට කටයුතු කරනවා. මේක යෝජනාවක්. අපේ බල ප්‍රදේශයේ සුදුසු තැන් තියෙනවනම් තමයි යථා කාලෙදි ඒ ස්ථාන සොයාගෙන කටයුතු කරන්නෙ. අත්තනෝමතික විදිහට නෙවෙයි. අවශ්‍යතාවය අනුව නිවාස හදන අයට වැලි ලබා දීම තමයි ප්‍රධාන අරමුණ. කොහොම නමුත් ඉදිරියෙදි අවශ්‍ය කටයුතු කිරීම සඳහා මම යෝජනාව දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට යොමු කරනවා.

ඊළඟට සභාව සතු මේ වන විට වෙන්දේසි කිරීමට යෝජනා වූ නමුත් පසුව අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගන්න තීරණය කළ බැකෝ යන්ත්‍රය පිළිබඳව ඇත්තටම කතිකාවතක් වෙලා තියෙනවා. ඒ බැකෝ යන්ත්‍රය ලක්ෂ පහකට වෙන්දේසි කරන්න තමයි පහුගිය සභා කාලය තුල යෝජනා කරලා තිබුනෙ. නමුත් මම මේ පිළිබඳව දන්නා කාර්මිකයන් කිහිප දෙනෙකුගෙන් ඒ ගැන විමසුවම, බැකෝ යන්ත්‍රය අලුත්වැඩියා කරල ගන්න පුලුවන් තත්වෙ තියෙන බව කිව්වා. එදා ලක්ෂ දහතුනක් වැනි ප්‍රමාණයකට අලුත්වැඩියා කරල දෙන්න පුලුවන් කියලත් කිව්වා. අපි පත්වුන දවස්වල අපේ සභාවෙ ලක්ෂ හැටක විතර මුදලක් තිබුනා. නමුත් අළුත්වැඩියාව සඳහා සභාවෙ එච්චර කැමැත්තක් තිබුනෙ නැහැ. ඒක ඇදි ඇදි ගිහිල්ලා අන්තිමට ඒක කරගන්න බැරි වුනා. කොහොම නමුත් දැන්නම් ඉතිං ඒ අදහස අත්හැරලා, ඒක වෙන්දේසි කරන්නම තමයි තියෙන්නෙ. නමුත් නැවත අපි කොමසාරිස්තුමාට දැනුම් දීලා, ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට බලාපොරොත්තු වෙනවා. මොකද ඒක ඉල්ලන්න කිහිප දෙනෙකුත් ආවා. ඊයෙ පෙරේදා පියල් මන්ත්‍රීතුමාත් දැනුවත්ව කෙනෙක් ආවා. ඒ නිසා තමයි මේ සම්බන්ධයෙන් සභාවෙ කතා කරන්න හේතු වුනේ.

වීථි පහන් පිළිබඳවත් අද කතා වුණා. මේ වන විට සභාවට මිළදී ගත් වීථි පහන් සහ අනෙකුත් අවශ්‍ය දෑ නොමැති නිසා අලුතින් මිළදී ගැනීම් කරන්න වෙනවා. CFL බල්බ් වෙනුවට LED බල්බ් දමන්න කියලා දැණුම් දී තියෙනවා. ඒ නිසා ප්‍රසම්පාදන කමිටුව කැඳවා මිළ ගණන් කැඳවීම කළ යුතුයි. පසුගියදා ප්‍රසම්පාදන කමිටුව කැඳවා තිබුනත්, ගංවතුර සහ අධික වැසිතත්වය හේතුවෙන් කමිටුව පැවැත්වීමට නොහැකි වුන බැවින්, යථා කාලෙදි ප්‍රසම්පාදන කමිටුව කැඳවලා, ඒ කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

පසුගියදා තල්ගස්වල පොල බදු කරු විසින් තල්ගස්වල පොලේ තිබුන ඇලස්ටෝනියා ගහ පිළිබඳව අපට ලිපියක් එවා තිබුනා. එම ගස අනතුරුදායකයි. කොයි වෙලාවෙ වැටේද දන්නෙ නැහැ. ඒක නිසා මේ අනතුර ඉවත් කරන්න කියලා. එම අනතුර ඉවත් කිරීමට මම සභාවෙ තාක්ෂණ නිලධාරී සහ කම්කරුවන් යොදවා එම ගස කැපීමට කටයුතු කළා. ගස කපන අවස්ථාවෙ සුළඟ ඇවිත් අපි හිතපු නැති පැත්තට වැටීම නිසා ඒ අසළ තියෙන සන්රි හෝටලේ වහලෙ ශීට් එකක් බිදිලා, එවර්ග්‍රීන් එකේ වහලෙ පීල්ලත්, සන්රි එකේ වහලත් හදලා දුන්නා. ඒ යන වියදම සභාවෙන් ගෙවා දැමීමට කටයුතු කරනවා.

ඒ වගේම ආදාහනාගාරයේ මූලික කටයුතු අවසන් අදියරේ තියෙන්නෙ. දැන් අපට ඉදිකිරීම් පටන් ගන්න පුලුවන්. මුදල් ප්‍රශ්නෙ තමයි තියෙන්නෙ. මම අදාල ආයතන සමග සම්බන්ධ වෙලා කතා කළා. ඒ කටයුත්ත ඉදිරියෙදි සිදුවෙයි. ඒ වගේම අපේ වනමල් මන්ත්‍රීතුමා ඉදිරිපත් කල ගව ප්‍රශ්න සහ සුනඛ ප්‍රශ්නවලදී මෙන්ම, තල්ගස්වල එක ගෙදරක බල්ලො පස්දෙනෙක් ඉන්නවා, හපා කන්න එනවයි කියලා, සුනඛ ප්‍රශ්නයක් අපටත් ආවා. ඒ සම්බන්ධයෙන් මම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට දැනුම් දුන්නා. ඉදිරියෙදි ඒ දැනුවත් කිරීම් කටයුත්ත කරනවා. ඒ වගේම මේ වන විටත් ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කොට, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ගව හිමියන් සහ අදාල පොලිස්

ස්ථානවලින් කැඳවලා සාකච්ඡාවක් හෙට දිනයේ පවත්වන්න කටයුතු යොදා අවසන්. ඌරල ප්‍රදේශයේ ගව අයිතිකරුවො පස් දෙනෙක්ගෙ, හය දෙනෙක්ගෙ නම් ලැබිලා තියෙනවා. ඒ අය කැඳවල දැනුවත් කිරීම කරනවා. ඌරල ප්‍ර දේශයෙනුත් ගව හානි පිළිබඳ පැමිණිලි ලැබී තියෙනවා. මම දිස්ත්‍රික් සංවර්ධන කමිටුවෙත් මේ පිළිබඳව කතා කළා. අපට ගවයන් අල්ලලා අවශ්‍ය කටයුතු කරන්න ප්‍රතිපාදන, ශක්තිය නැහැ.

චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා සහ එම්. එම්. මන්ත්‍රීතුමා ප්‍රකාශ කල පරිදි අක්කර 25 කොන්ක්‍රීට් පාරට පස් දාපු ස්ථානය පිළිබඳව, කාර්මික නිලධාරි යවා පරීක්ෂණයක් කරලා, ඒකෙ වාර්තාවක් අරගෙන එම ස්ථානය යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය නිර්දේශය ලිපියක් මගින් පාරට පසු දාපු අයට යවලා තියෙන්නෙ. සිලින්ඩරයක් දාන්නයි, පස් අඩි දෙකක් හෝ තුනක් අයින් කරලා, කටයුතු කරන්න. තවම හැබැයි මේක වෙලා නැහැ. ඊලගට එම්. එම් මන්ත්‍රීතුමා ප්‍රජා ශාලාවට විදුලිය ලබා ගැනීම පිළිබඳව කථා කළා. මේ වන විට ඒ ප්‍රජා ශාලාව ලිඛිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අපට භාර දීල තියෙනවා. අපට ඒකට විදුලිය ලබා ගැනීමට හැකියාව තියෙනවා. ඉදිරියේදී විදුලි සම්බන්ධතාවය ලබා ගමු. තව මම ඔබතුමාලගෙන් ඉල්ලා සිටිනවා. බල ප්‍රදේශයේ සංවර්ධනය කල යුතු පාරවල් තියෙනවනම්, මෝටර් ගේඩරයක් දාල සංවර්ධනය කරන්න පුලුවන්. අපිට මෝටර් ගේඩරය තල්ගස්වල යන්ත්‍රෝපකරණ එකෙන් ගන්න පුලුවන්. වැඩ කරන්න තියෙන පාරවල් ටික ලබා දෙනවනම් කරන්න පුළුවන්. මෝටර් ග්‍රේඩරයක් යොදා සංවර්ධනය කල යුතු පාරවල් දැන් හුගක් අඩුයි. ඒ වගේ පාරවල් සඳහා යෝජනා දෙන්න. අපට එහෙම වුනොත් ඒක ගෙන්නව ගෙන කටයුතු කරන්න පුළුවන්. එවිට යම් දුරකට මාර්ග ප්‍රතිසංස්කරණය කරගන්න පුළුවන්.

ගරු මන්ත්‍රීවරුනි, අපි හිතන්නෙ අපේ පාරවල් වල විතරයි මේ ආරවුල තියෙන්නෙ කියලා. මුදල් තියෙන බද්දෙගම ප්‍රාදේශීය සභාවට අයත් බෝවිටියමුල්ල තලාවෙන් ඇතුලෙ පාරක මම ගියා. පතිනායක මන්ත්‍රීතුමාත් දැක්කා. අපේ පාරවල් එච්චර ඩැමේජ් නැහැ. අපේ පාරවල්වල එච්චර අකුල් නැහැ. බැලුවම අපට විතරක් නෙවෙයි, හැම තැනම මේ ප්‍රශ්න. විදුලිය පිළිබඳව කියන්න තියෙන්නෙත් එච්චරයි.

කුරුපනාව - උඩුගම මාර්ගයේ විදුලි පහන් ගලවාගෙන යාම පිළිබඳව මෙහිදී කතා වුණා. ඒ පිළිබඳව මම විදුලිබල මණ්ඩලයෙන් විමසුවා. කනු දාපු ගමන් ඒවා නැවත සවිකරනවයි කියලා දැනුම් දීලා තියෙනවා. ගරු සහබන්දු මන්ත්‍රීතුමනි, කටඹුරාව අතුරු පාරක බෝඩ් එක ගලවපු එක පිළිබඳව ඔබතුමා දැනුම් දෙන විට, මම කොළඹ හිටියෙ. ලේකම්තුමියටත්, අදාල නිලධාරින්ටත් කිව්වා. ගිහිල්ලා බලන්න කියලා. අයිතිය පිළිබඳව ගැටලුවක් නැහැ. ඒක අපේ. ඒක නිසා පොලීසියෙ පැමිණිල්ලක් දාන්න කියලා ලේකම්තුමියට මම කිව්වා. ඒක මෙතුවක් ඉටු වෙලා නැහැ. උඩුගම පාරක වත්තෙන් වැටක් ගහල තියෙනවයි කියලා සමන් මන්ත්‍රීතමා කිව්වා. අපි දන්නෙ නැහැ, වැට ගහල තියෙන්නෙ කොයි ආකාරයෙන්ද කියලා. ඒ නිසා තාක්ෂණ නිලධාරී යවලා ඒ කටයුත්ත නිවැරදි කරන්නම්.

පතිනායක මන්ත්‍රීතුමනි, ඔබ ප්‍රශ්න කරන ඌරල පොදු ලිද පිළිබඳව තාක්ෂණ නිලධාරී වාර්තාව මේ ආකාරයෙන් තියෙන්නෙ. “සභාපතිතුමාගේ වාචික උපදෙස් පරිදි උක්ත කරුණට අදාල ඌරල පොදු ලිද මවිසින් අටවෙනි මාසෙ විසිහතරවෙනිදා පරීක්ෂා කළ අතර, එම අවස්ථාවෙදි පොදු ලිද ඇති ස්ථානය වල්බිහි වී ඇතිබව නිරීක්ෂණය විය. තවද මෙම ස්ථානයේ පෙර පැවති ඉදිකිරීම් සම්බන්ධයෙන් මා හට අවබෝධයක් නොමැති අතර, එසේ ඉදිකිරීමක් පැවතිනම්, එම ඉදිකිරීම විනාශ කරන ලද පුද්ගලයෙක් වෙතොත්, ඒ පිළිබඳ විධිමත් වාර්තාවක් පොලිස් ස්ථානය මගින් ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව වාර්තා කරමි” යනුවෙනි. මේ වාර්තාව තාක්ෂණ නිලධාරිගෙ. නමුත්, ගෙපල කලද්දි උද්ගෝෂණයක් ඇතිවෙලා, අපි එතනට ගියා. එම අය ලිදේ

අලුත් වැඩියාවන් කරල දෙන්න වාචිකව පොරොන්දු වුනා. ඒකයි සත්‍යය. ඊට පස්සෙ මොන මතවාදෙ ආවද කියලා මම දන්නෙ නැහැ. ගෙපල කපන කොට මිනිස්සු විරුද්ධ වුනා. පොලීසියත් ආවා. එතනදි වාචිකව තමයි අපට පොරොන්දුවක් වුනේ. අපි ලිඛිතව ගන්න ගියේ නැහැ. පස් කපද්දි තමයි ලිදට ගල් ඇවිල්ලා ඩැමේජ් වෙලා තියෙන්නෙ කියලා තමයි කිව්වෙ. දැන් මේ තාක්‍ෂණ නිලධාරි වාර්තාව සභාවට ඉදිරිපත් කළා. අපි යථා කලෙදි ඒ කටයුත්ත කරනවා.

ඒ එක්කම තරංග මන්ත්‍රීතුමා කිව්ව වගේ, සැලෝන්වල අධික මිලට කොණ්ඩා කැපීම පිළිබඳ අපි අදාල ආයතන දැනුවත් කරමු. මොකද මිල අඩු කරන්න අපට හැකියාවක් නැහැ. දැනට කෝවිඩ් වසංගතය තුරන් වෙලා නැහැ. ඒ නීතිය තවම තියෙන නිසා, අදාල ආයතනවලට කියන්න පුලුවන්. ඒ නිසි ක්‍රමවේදවලට කටයුතු කරන්න කියලා. මොකද ඒ නිසි ක්‍රමවේදවලට නොකළොත්, ඒ අයගෙ ආයතන නතර කරන්න, අපට හැකියාව ලැබෙනවා. නැත්නම් එයාල විසින්ම මුදල අඩු කරන්න ඕන. ඒ වගේම අපේ බන්දුල මන්ත්‍රීතුමා කිව්ව වගේ, බස් රථයෙන් සීසන් වලින් යන පාසල් දරුවන් නොගන්න එක පිළිබඳව ලේකම්තුමිය ඒ අදාල ආයතනවලට දැනුම් දීමට කටයුතු කරන්න.

ගරු උප සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, විශේෂිත කරුණ වන්නේ පළාත් සභා පිළිබඳව අද යෝජනාවක් ආවා. ඡන්ද විමසීමක් කළා. පළාත් සභාව කියන්නෙ සුදු අලියෙක් කියනවා. කට්ටියක් කියනවා හොඳයි කියලා. අපි දකිනවා ඕනම එකක හොඳ නරක දෙකම තියෙනවා. අපි කියන්නෙ පළාත් සභා තියනවනම්, ඉක්මනට ඒ පළාත් සභා මැතිවරණය පැරණි ක්‍රමයට හෝ තියලා, ඒක ඉවරයක් කරලා, යථා කාලෙදි නව ක්‍රමවේදෙකට යන්න කියලා. පහුගිය මැතිවරණයෙදිත් මැතිවරණ කොමසාරිස්තුමා පවා ප්‍රකාශ කළා. අතුරුදන් වුන ඒ පළාත් සභාව නැවත පැරණි ක්‍රමයට තියලා, ඒක යථා කාලෙදි වෙනසක් දකිනවනම්, විසුරුවා හැරලා වෙනත් ක්‍රමවේදයකට යන්න කියලා. මොකද වර්ථමානයේ සහබන්දු මන්ත්‍රීතුමා කිව්ව වගේ සමහර වෙලාවට සුදු අලියෙක් කියලා හිතෙනවා. සමහර වෙලාවට එහෙම නැහැ. මොකද දැන් අපට පළාත් සභාව අවශ්‍ය නැහැ කියල කියන්නෙ, පළාත් සභාව දැන් නැහැ. නමුත් වැඩ කෙරෙනවා. එහෙමනම් ප්‍රාදේශීය සභාවත් අවශ්‍ය නැහැ. මොකද ප්‍රාදේශීය සභාවත් නැති කාලෙ ප්‍රාදේශීය සභාවෙ වැඩ කෙරුනා. මේක නතර කරනකොට පරිපාලනයත් ගොඩාක් දුරට ව්‍යාකූලයි. ඒක නිසා අපි යෝජනා කලේ පළාත් සභාව නැවත ස්ථාපිත කිරීමට ඉක්මනින් කටයුතු කරන්න තියනවනම් තියන්න. ඒකයි අපේ යෝජනාව වුනේ. ඇත්ත කතාව පසුගිය මහ ඇමතිතුමා ප්‍රාදේශීය සභාවෙ මුදල් තමයි පළාත් සභාවෙ යෙදවුවෙ. දැන්නම් අපට ටික ටික සල්ලි එවනවා. කලින් අපේ සල්ලි එවීම් ප්‍රමාද වුනා. ඒ නිසා නියම ක්‍රමවේදෙට, පළාත් සභාවෙ අර්ථය, යතාර්ථයක් කරගෙන වැඩ කරනව නම් මම හිතන්නෙ හොඳයි. පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් අපි බලාපොරොත්තු වුනේ සමිතියකට පුටු ටිකක් වැනි කටයුතු නෙමෙයි. නමුත් ඊට වඩා වැදගත් කර්තව්‍යයක්. මේක ඇතුලෙ තියෙන්නෙ. නමුත් ජනතාව බලාපොරොත්තු වෙන්නෙ ඒ වගේ දේවල්. ඒකයි මෙතන තියෙන ආරවුල. නැත්නම් මේවා හඳුන්වාදෙන විද්වතුන් හදන්න ඇත්තෙ යම් තිරසාර බලාපොරොත්තුවක් ඇතුව. ඒ නිසා අලුත් ව්‍යවස්ථාවක් සම්පාදනය කරන කොට, මම හිතන්නෙ මේ සියලුම කරුණු කාරණා සැළකිල්ලට ගනියි කියලා. අපි පළාත් සභා ඡන්දය තියන්න කියලා වූ සභාවේ යෝජනාවට සභාවේ ඡන්දයක් තියන්න මම බලාපොරොත්තු වුනේ නැහැ. මොකද මම බෙදීම්වලට කැමති නැති නිසා. නමුත් බෙදීමක් ඇති කර ගන්න සිදු වුනා. ඒ ඡන්දය දුන්න, නොදුන්න සියලු දෙනාටම බොහොමත්ම ස්තූතියි. මම මීට වඩා යමක් කියන්න යන්නෙ නැහැ.

අද සියලුම මන්ත්‍රීවරු බොහොම සුහදශීලීව, සාමකාමීව කටයුතු කරමින්, පැය ගණනක් කාලය ගත කළා. ඒ එක්කම ඊයේ මේ ප්‍රදේශයේ සිදුවූ හදිසි අනතුර නිසා තරුණ ජීවිතයක් අහිමි වුනා. එහෙම වුනේ මට හිතෙනව පාරවල් හොඳට හදපු නිසා කියලා. වේගවත් වැඩියි. දැන් ඒවටත් පාරවල්වල වේග සීමා නිර්ණය කරලා කටයුතු කරන්න වෙනවා. බීමත් කමක් එක හේතුවක්. ඔය එක එක ආයතනවල අඩුපාඩු තියෙනවා. ඒවා මම හිතන්නෙ යථා කාලෙදි නිදොස් වේවි. ඒ වගේම ගරු මන්ත්‍රීවරුන්ට

කියන්න කැමතියි. මේ වර්තමාන රජයෙන් උපාධිධාරී 61000 කට රැකියා දුන්නා. දේශපාලන වාද බේද බැලුවෙ නැහැ. මේක දේශපාලන ප්‍රෝඩාවක්, රැවටිල්ලක් කියලා ඔබතුමාල කලින් කිව්වා. නමුත් සියලු දෙනා අද පුහුණුව ලබනවා. ඒ එක්කම කාර්යය සාධක බලකායෙත් යථා කාලෙදි රැකියා අවස්ථා ලබා දෙනවා. ඒකෙදිනම් මේ කතා කරන අපිත් අසරණ වෙනවා. කිසිම දේශපාලන පක්ෂයක් නැහැ. නමුත් අපේ මිනිස්සු බලාපොරොත්තු වෙන්නෙ වෙන දෙයක්. නමුත් ඒකෙ අපිට ආරංචි හැටියට පොදුවෙ තමයි සේරටම දීල තියෙන්නෙ. කිසිම කෙනෙක් ඇඟිලි ගසා නැහැ. කොහොම නමුත් ගරු මන්ත්‍රීතුමන්ලා අද සහභාගිවෙලා සුහදව කටයුතු කිරීම සම්බන්ධව, බොහොම ස්තූතියි. ඒ වගේම අද අපේ සභාවේ මාධ්‍ය ආවරන කටයුතු සදහා පැමිණි මාධ්‍යවේදී මහත්වරු දෙපොල ඇතුලු සියලු දෙනාට ස්තූති කරමින්, අද දින සභාව මෙතෙකින් අවසන් කරනවා. බොහොම ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-